හැඳින්වීම



ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක අභ්‍යාස ආයතනය 1981 අංක 68 දරන ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක අභ්‍යාස ආයතන පනත යටතේ පිහිටුවනු ලැබූ අතර ඉන්පසුව සංශෝධන කීපයක් මගින් එහි මෙහෙයුම් විෂය පථය පුළුල් කරනු ලැබ ඇත. පසුව 1988 අංක 27 දරන ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල (සංශෝධිත) පනත මගින් විශ්වවිද්‍යාල තත්වයට උසස් කරනු ලැබූ ආරක්ෂක අභ්‍යාස ආයතනය, 2007 අංක 50 දරන (සංශෝධිත) පනත මගින් ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය (කොආවි) ලෙස නැවත නම් කරනු ලැබීය.

මෙම වාර්ෂික වාර්තාව මගින් 2019 ජනවාරි 01 දින සිට 2019 දෙසැම්බර් 31 දින දක්වා වන කාල සීමාව තුල විශ්වවිද්‍යාලයේ කාර්යයන් සහ කාර්යසාධනය ආවරණය කෙරේ. 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (1) වන වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 හා 17 වන වගන්තිවලට අනුකූලව ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව හා වාර්ෂික ගිණුම් මේ සමග ඉදිරිපත් කරමි.

විශ්වවිද්‍යාල ලාංඡනය



ශ්‍රී ලංකාවේ ප්‍රථම ත්‍රිවිධ හමුදා අධ්‍යාපන ආයතනය වන කොඅාවියේ ලාංඡනය, පිළිවෙලින් ශ්‍රී ලංකා යුධ හමුදාව, ශ්‍රී ලංකා නාවික හමුදාව, ශ්‍රී ලංකා ගුවන් හමුදාව නියෝජනය කරමින් කතිරයක් ආකාරයෙන් පිහිටි කඩු දෙකක්, නැංගුරමක් හා පියාපත් දෙකක් ඇතුලත්වේ. එය ලාංඡනය මධ්‍යයේ ඇති පන්දම මගින් අධ්‍යාපනය සඳහා ලබාදී ඇති කේන්ද්‍රීය ස්ථානය නිරූපනය කෙරේ. ලාංඡනය පහලින් “සිය රටටමයි කවදත්” යන විශ්වවිද්‍යාලයේ ආදර්ශ පාඨය සඳහන්වේ. ලාංඡනය මුදුනේ ඇති ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ රාජ්‍ය ලාංඡනය මගින් කොඅාවියේ ජාතියට ඇති ස්ථීර රාජපාක්ෂිකභාවය පෙන්නුම් කෙරේ.

විශ්වවිද්‍යාල ධජය

කොඅාවි ධජය, ශ්‍රී ලංකා යුධ හමුදාව සඳහා තැඹිලි පැහැයද, ශ්‍රී ලංකා නාවික හමුදාව සඳහා තද නිල් පැහැය සහ ශ්‍රී ලංකා ගුවන් හමුදාව සඳහා ලා නිල් පැහැය ද ලෙස විවිධ පැහැයන්ගෙන් යුත් තීරුවලින් ත්‍රිවිධ හමුදාව නිරූපනය කරන සංකේතාත්මක සම්මිශ්‍රණයකින් යුක්තවේ. තවද ධජයට කොඅාවි ලාංඡනය ඇතුලත් කිරීම මගින් දේශයේ ත්‍රිවිධ හමුදාවන්හි වෘත්තීය හා අධ්‍යාපනික අවශ්‍යතා ඉටුකිරීම මගින් කොඅාවි මවුබිමට සේවය කිරීමේ කාර්යභාරය සංකේතවත් කෙරේ.



විශ්වවිද්‍යාල ගීතය

දෑ අනුරාගෙන් ප්‍රාණ ප්‍රබෝධිත
සියරටටම කවදත් කැප අප වෙත
ශිල්ප ශ්‍රාස්ත්‍ර සංග්‍රාම තාක්ෂණ
ඥාණ විභූෂණ ශික්ෂණ දානී
ශ්‍රීමත් කොතලාවල
ආරක්ෂක සරසවි ලංකා
ධරණී ජයතු

ත්‍රිවිධ හමුදා ජීවය විදහා
දෙස රැක ගැනුමට ජය ධජ නැගුමට
දෑ අභිමානෙන් පෙරට තබන පා
සතුරන් මැඩ මිස නොගනිමු ආපසු
දිවි දෙමු සාමයේ කුසුම් පිපෙන තුරු
ඒ කුසුමෙන් ලක් මව සැනසෙන තුරු//

දෑ අනුරාගෙන් ප්‍රාණ ප්‍රබෝධිත
සියරටටම කවදත් කැප අප වෙත
ශිල්ප ශ්‍රාස්ත්‍ර සංග්‍රාම තාක්ෂණ
ඥාණ විභූෂණ ශික්ෂණ දානී
ශ්‍රීමත් කොතලාවල ආරක්ෂක
සරසවි ලංකා ධරණී ජයතු

විශ්වවිද්‍යාල සිතියම

ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය - රත්මලාන



විශ්වවිද්‍යාලයේ දැක්ම, මෙහෙවර හා පරමාර්ථ

අපගේ දැක්ම

හමුදාවට, රාජ්‍ය අංශයට හා සමස්ත සමාජයට සුවිසල් මෙහෙවරක් ඉටුකෙරෙන වෙසෙස් සහ විෂයාන්තර ආරක්ෂාවට අදාල උසස් අධ්‍යාපනයෙහි උපාධි අපේක්ෂකයින් සහ උපාධිලාභී ශිෂ්‍යයින් යන දෙපාර්ශවයම නිරත කරවනු පිණිස පවත්නා අද්විතීය හැකියාව ජාතික හා ජාත්‍යන්තර වශයෙන් ප්‍රකට කෙරෙන විශ්වවිද්‍යාලයක් බවට පත්වීම.

අපගේ මෙහෙවර

ආරක්ෂක ක්ෂේත්‍රයෙහි විෂය ක්ෂේත්‍ර ගණනාවක් හරහා උසස් තත්වයේ පර්යේෂණ සමගින් උපාධි අපේක්ෂක, උපාධි, සහ වෘත්තීය වැඩසටහන් තුලින් ඉහල ගුණාත්වයේ ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපන අත්දැකීමක්, විශ්වවිද්‍යාලයෙහි වාසික හා වාසික නොවන සන්දර්භ දෙක තුලදීම සහතික කිරීම.

පරමාර්ථ

අ. කැඩෙට් නිලධාරීන් සන්නද්ධ සේනාවලට අනුයුක්ත කිරීමට පෙර, ඔවුන්ව සන්නද්ධ වෘත්තියට හඳුන්වාදීමට පහසුකම් සැලසීම සහ සිය වෘත්තිය පිළිබඳ ඔවුන්ගේ දැනුම හා කුසලතා දියුණු කිරීමට මාර්ගෝපදේශත්වය සැපයීම.

ආ. කැඩෙට් නිලධාරීන්ට, නිලධාරීන්ට හා රජයේ සේවකයින්ට සහ ඕනෑම වෙනත් තැනැත්තන්ට ඔවුන්ගේ වෘත්තීන් හා හැකියාවන්ට අදාල විෂයන්වල පළමු උපාධිය සඳහා සූදානම් වීමේද ශාස්ත්‍රීය අධ්‍යාපනය සඳහා පහසුකම් හා උපදෙස් ලබාදීම.

ඇ. සන්නද්ධ හමුදාවල නිලධාරීන්ගේ සේවාකාලය තුල ඒකාබද්ධ මෙහෙයුම් වලට පහසුකම් සැලසීමේ අරමුණ උදෙසා හමුදා නිලධාරීන් අතර මිත්‍රත්වය සහ සමගිය ගොඩනැගීමට කැඩෙට් නිලධාරීන් අතර සහෝදරාත්මක බැඳීම හා හොඳ හිත වර්ධනය කිරීම.

ඈ සන්නද්ධ සේනාවල නිලධාරීන්ට සහ වෙනත් තැනැත්තන්ට විශ්වවිද්‍යාලය මගින් පිරිනමන පශ්චාද් උපාධි, උපාධි, ඩිප්ලෝමා සහ වෙනත් සහතික පත්‍ර ලැබීමට සුදුසුකම් ලැබීම සඳහා ඔවුන්ගේ අඛණ්ඩ වෘත්තිය දියුණුව වෙනුවෙන් අධ්‍යයන පාඨමාලා පිරිනැමීම.

ඉ. විශ්වවිද්‍යාලයේ පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය බවට විශ්වවිද්‍යාලය මගින් සලකනු ලබන පර්යේෂණ සහ සංවර්ධන ඇතුළු වෙනත් කාර්යයන් ඉටුකිරීම.

උපකුලපතිතුමාගේ සමාලෝචනය



ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක අභ්‍යාස ආයතනය 1981 අංක 68 දරන පාර්ලිමේන්තු පනත මගින් පෙර-පුහුණුව ලත් කෙඩෙට් නිලධාරීන් සඳහා වන පුහුණුවට අදාළව යම් විෂයන් පිළිබඳව අධ්‍යාපනය ලබා දීම සහ එවැනි අධ්‍යයන ක්‍රියාකාරකම්වලදී උපදෙස් සැපයීම සඳහා පහසුකම් සැපයීමේ මූලික අරමුණ සහිතව මුලින් ස්ථාපනය කරන ලදී.

1988 අංක 27 දරන ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල (සංශෝධන) පනත මගින් අභ්‍යාස ආයතනය විශ්වවිද්‍යාල තත්ත්වයට උසස් කරනු ලැබූ පසුව, එය 2007 අංක 50 දරන සංශෝධන පනත මගින් 2007 ඔක්තෝබර් 11වන දින ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය ලෙස යළි නම් කරන ලදී.

වර්තමානයේදී ආරක්ෂක අධ්‍යයනය පිළිබඳ උපාධි පිරිනමන දකුණු ආසියානු කලාපයේ උසස් ආරක්ෂක විශ්වවිද්‍යාලය බවට පත් වීමේ කීර්තිය අත්පත් කර ගැනීමට, ගෝලීය ප්‍රවේශයක් සහිත විශ්වවිද්‍යාලයක් බවට පත්වීමෙන්, ආරක්ෂක විශ්වවිද්‍යාලයට හැකි වී තිබේ.

විශ්වවිද්‍යාලයට එක්සත් රාජධානියේ පොදුරාජ්‍ය මණ්ඩලීය විශ්වවිද්‍යාල, සංගමයේ සහ ජාත්‍යන්තර විශ්වවිද්‍යාල සංගමයේ සාමාජිකත්වය පිරිනමා ඇත. කොආවි හි මෙම මූලපිරීම අනාගතයේ දී උපායමාර්ගික සුදුසුකම් ලබා ගැනීමට සහ කීර්තිමත් වෘත්තීය මාර්ග ළඟා කර ගැනීමට උත්සාහ කරන අපේ රටේ සහ විදේශයන්හි ආරක්ෂක සේවා අංශයට, ත්‍රිවිධ හමුදාවට සහ සිවිල් සිසුන්ට දැනුම හා ඥානය ලබා දීමේ විශ්වවිද්‍යාලයේ කාර්යභාරයට චේතනාන්විතව ජවය ලබා දී ඇත.

ආරම්භයේ සිට කෙටි ඉතිහාසයක් පුරා විහිදී ඇති කොආවි, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිසි පරිදි පිළිගත් පූර්ණ ජාත්‍යන්තර විශ්ව විද්‍යාලයක් බවට පත් වී තිබේ. ආරක්ෂක විශ්වවිද්‍යාලය මෙම පරිවර්තන ක්‍රියාවලිය තුළ, පශ්චාත් උපාධි අධ්‍යයන, ආරක්ෂක හා උපක්‍රමික අධ්‍යයන, වෛද්‍ය විද්‍යාව, ඉංජිනේරු විද්‍යාව, නීතිය, කළමනාකරණය, සමාජ විද්‍යා හා මානව ශාස්ත්‍ර, සමසෞඛ්‍ය, නිර්මිත පරිසරය හා අවකාශීය විද්‍යා සහ පරිගණක යන පීඨ ඇතුළත් පීඨ 9 කින් සමන්විතව ඇත.

ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිදHdලය අතීතයේ සිටම ආදිකර්තෘන් විසින් පිහිටුවන ලද එහි සාරධර්ම හා විශ්වාස තුළ මුල් බැස තිබේ. වෘත්තීමයභාවය සාක්ෂාත් කර ගැනීමේ උත්සාහයේ දී, කොආවි, සිය රටටමයි කවදත් යන තේමා පාඨයට අඛණ්ඩව අනුකූල වේ. කොආවි සිය දැක්ම ගොඩනැගීමේ මාර්ගය තුළ, නිපුණතාවෙන් යුත් දේශීය සහ විදේශීය විදHdර්ශීන්ට උසස් මට්ටමේ උපාධි හා පශ්චාත් උපාධි පිරිනමයි.

කොආවි එහි 12වන ජාත්‍යන්තර පර්යේෂණ සම්මන්ත්‍රණය “නව තාක්ෂණය හමුවේ මානව සංහතිය මුහුණ දෙන අභියෝග” “Challenges to human kind in the face of new technology” යන මැයෙන් 2019 සැප්තැම්බර් මස 11

සහ 12 දින පවත්වන ලදී. විද්වතුන්, කර්මාන්ත වෘත්තිකයන් සහ දේශීය හා විදේශීය සිසුන්ගේ දායකත්වය විශ්වවිද්‍යාලයේ පර්යේෂණ සංස්කෘතිය නංවාලීය.

විශ්වවිද්‍යාලයේ උපාධි ප්‍රදානෝත්සවය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති ගෝඨාNය රාජපක්ෂ මහතාගේ සහභාගිත්වයෙන්, 2020 ජනවාරි 9 සහ 10 දිනවල පවත්වන ලදී.

කාලානුරූපව ජාත්‍යන්තර ප්‍රවණතා දුරදක්නා ලෙස සලකා විශ්වවිද්‍යාලය විසින් ක්‍රියාවට නංවන ලද බහුකාර්ය උපායමාර්ගික කළමනාකරණ ක්‍රමවේද සහ කාර්ය මණ්ඩල අභිප්‍රේරණ ක්‍රියාකාරකම්වල සැබෑ සමාජ බලපෑම විශ්වවිද්‍යාලයේ කාර්යසාධනය මත නිසැකවම පිළිබිඹු වනු ඇත. තවද, සමාජ ඒකාබද්ධතා ක්‍රියාකාරකම්, ශිෂ්‍ය-කථිකාචාර්ය සහභාගීත්ව වැඩසටහන් සහ පීඨ-කර්මාන්ත සබඳතා විවිධ ප්‍රවේශ තුළින් ශක්තිමත් වෙමින් පවති.

සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ විශ්වවිද්‍යාලය ලබා ඇති අධ්‍යයන හා භෞතික ප්‍රගතිය නිවැරදි කළමනාකරණ ප්‍රවේශ සහ නායකත්වය තුළින් කාර්ය මණ්ඩලය සාමූහිකව ලබා ගත් ජයග්‍රහණයකි. එය විශ්වවිද්‍යාලයේ නිත්‍ය පැවැත්මට ශක්තිමත් පදනමක් විය.

ඉගැන්වීම් හා ඉගෙනුම් ක්‍රියාකාරකම්, පර්යේෂණ හා සංවර්ධන, අධ්‍යයන කටයුතු සහ යටිතල පහසුකම් සංවර්ධනය යනාදිය කෙරෙහි වැඩි අවධානයක් යොමු කරමින් අපගේ දැක්ම කරා ළඟා වීමට අපි එක්ව ක්‍රියා කරමු. කොආවි සඳහා ඉදිරි මාවත වන අපගේ පාර්ශ්වකරුවන් වන බාහිර පාර්ශj සමඟ සහයෝගීතාව වැඩි දියුණු කිරීමට මෙය සැබවින්ම හේතු වනු ඇත.

එයාර් වයිස් මාෂල් HMSKB කොටකදෙණිය
WWV, RWP, RSP, VSV, USP, MSc (ආරක්ෂක සහ ක්‍රමෝපාය අධ්‍යයන), fndu, psc
උපකුලපති
ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය

අන්තර්ගතය

හැඳින්වීම i
විශ්වවිද්‍යාල ලාංඡනය ii
විශ්වවිද්‍යාල ධජය ii
විශ්වවිද්‍යාල ගීතය iii
විශ්වවිද්‍යාල සිතියම iv
විශ්වවිද්‍යාලයේ දැක්ම, මෙහෙවර සහ පරමාර්ථ v
උපකුලපතිතුමාගේ සමාලෝචනය vi

1. විශ්වවිද්‍යාලය
1.1 විශ්වවිද්‍යාලයීය ඉතිහාසය 03
1.2 ආයතනික ව්‍යුහය 04
1.3 කළමනාකරණ මණ්ඩලය 05
1.4 විශ්වවිද්‍යාලයේ සනාතන සභාව 07
1.5 විශ්වවිද්‍යාලයේ කුලපති හා ප්‍රධාන කාර්ය මණ්ඩලය 08
1.6 ප්‍රගති වාර්තාව 2019 10
1.7 ඉදිරි සැලසුම් 13

2. **විශ්වවිද්‍යාලයේ පීඨ සහ මණ්ඩප**

2.1 පීඨ
2.1.1 පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය 16
2.1.2 ආරක්ෂක සහ උපක්‍රමික අධ්‍යයන පීඨය 18
2.1.3 වෛද්‍ය පීඨය 21
2.1.4 ඉංජිනේරු පීඨය 39
2.1.5 නීති පීඨය 45
2.1.6 කළමනාකරණ, සමාජ විද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨය 48
2.1.7 සමසෞඛ්‍ය විද්‍යා පීඨය 52
2.1.8 නිර්මිත පරිසරය හා අවකාශ විද්‍යා පීඨය 61
2.1.9 පරිගණක පීඨය 67

2.2 මණ්ඩප
2.2.1 දක්ෂිණ මණ්ඩපය, සූරියවැව 75

3. පුස්තකාල ජාලය 78

4. ශිෂ්‍ය තොරතුරු
4.1 උපාධි අධ්‍යයන පාඨමාලා සඳහා ඇතුළත්වූ නවක සිසුන් (දේශීය) 84
4.2 උපාධි පාඨමාලා සඳහා ඇතුළත් වූ නවක සිසුන් (විදේශීය) 85

5. **විභාග දත්ත**
5.1 විශ්වවිද්‍යාලයීය උපාධිලාභී සිසුන් සංඛ්‍යාව 87
5.2 විශ්වවිද්‍යාලයීය පශ්චාත් උපාධිලාභී සිසුන් සංඛ්‍යාව 87
5.3 උපාධිලාභී සහ පශ්චාත් උපාධිලාභී සිසුන් සංඛ්‍යාව - ප්‍රතීතන ප්‍රදානය ලද හමුදා අභ්‍යාස විද්‍යාල 88

6. මානව සම්පත්
6.1 අනුමත සේවක සංඛ්‍යාව සහ සමාලෝචිත වර්ෂයේදී සේවයේ නියුක්ත කාර්ය මණ්ඩලය 89

7. කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලීය රෝහල 90

8. ශ්‍රී ලංකාවේ තිරසර සංවර්ධන අභිමතාර්ථ **(SDG)** සපුරාලීම සඳහා විශ්වවිද්‍යාලය විසින් ගනු ලබන ක්‍රියාමාර්ග 95

9. මූල්‍ය සමාලෝචනය
9.1 මූල්‍ය කාර්යසාධන විශ්ලේෂණය 97
9.2 2019.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන 99

10. විගණකාධිපති වාර්තාව 144

1. විශ්වවිද්‍යාලය

1.1 විශ්වවිද්‍යාලයීය ඉතිහාසය

තරුණ හමුදා නිලධාරීන්ගේ අධ්‍යාපනික ප්‍රමිතීන් ඉහළ නැංවීම පිණිස උසස් අධ්‍යාපන ආයතනයක් ස්ථාපනය කිරීම සඳහා යුධ හමුදා, නාවික හමුදා සහ ගුවන් හමුදා ආඥාපතිවරුන් විසින් 1978 වර්ෂයේදී රජය වෙත නිර්දේශ ඉදිරිපත් කරන ලදී. ඊට ප්‍රතිචාර දක්වමින්, විශේෂඥයින් විසින් අනාවරණය කරගත් කරුණුවල මහපෙන්වීම අනුව ආරක්ෂක සේවාවන් සඳහා උපාධි ප්‍රදානය කරනු ලබන හමුදා අභ්‍යාස ආයතනයක් පිහිටුවීමට රජය තීරණය කරන ලදී.

යෝජිත ආරක්ෂක අභ්‍යාස ආයතනය සඳහා සුදුසු ස්ථානයක් සම්බන්ධයෙන් අවිනිශ්චිතභාවයක් පැවති තත්ත්වයක් තුළ එවකට සිටි යුධ හමුදා ආඥාපති ලුතිනන් ජෙනරාල් ජේ.ඊ.ඩී.පෙරේරා මහතා විසින් අවශ්‍යතාවය ඒත්තු ගැන්වීමෙන් පසු ශ්‍රී ලංකාවේ තෙවන අග්‍රාමාත්‍යවරයා වූ ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල මැතිතුමා අක්කර 48 කින් සමන්විත කඳවල වත්ත එහි පැවති සියලුම ව්‍යවල සහ නිශ්වල දේපළ ඇතුළත්ව හමුදා අභ්‍යාස ආයතනයක් ස්ථාපනය කිරීම සඳහා රජයට පරිත්‍යාග කිරීමට ස්වකීය කැමැත්ත ප්‍රකාශ කරන ලදී. මෙම ප්‍රදානය සතුටින් පිළිගෙන අභ්‍යාස ආයතනය පිහිටුවීම සඳහා මූලික පියවර ගනු ලැබීය. 1980 ඔක්තෝබර් 01 වන දින අතිගරු ජනාධිපති ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා ලුතිනන් ජෙනරාල් ජේඒඩී පෙරේරා මහතා සමඟ ශ්‍රීමත් ජෝන් කොතලාවල මැතිතුමා හමු වී ඔහු වෙත ජෙනරාල් යන ගරු නිලය පිරිනමන ලද අතර පසුකාලීනව රජය සහ ආරක්ෂක සේවාවන් විසින් මෙම අධ්‍යයන ආයතනය ඔහුගේ නමින් නම්කර ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල මැතිතුමාට ගෞරව දක්වන ලදී.

මේ ආකාරයට ශ්‍රී ලංකා යුධ හමුදාව, නාවික හමුදාව සහ ගුවන් හමුදාව සඳහා මනාව සංවර්ධිත බුද්ධිමය හැකියාවෙන් හෙබි නිලධාරීන් බිහි කිරීමේ සුවිශේෂී කාර්යය පෙරදැරිව 1980 වර්ෂයේ දී ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක අභ්‍යාස ආයතනය ආරම්භ කරන ලදී. මෙම ආයතනය 1981 අංක 68 දරන ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක අභ්‍යාස ආයතන පනත යටතේ ස්ථාපනය කරන ලද අතර එම පනතට පසුකාලීනව එක් කරන ලද සංශෝධන කිහිපයක් මඟින් එහි මෙහෙයුම් ක්ෂේත්‍රය වැඩිදියුණු කරන ලදී. 1988 අංක 27 දරන ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක අභ්‍යාස ආයතනය (සංශෝධන) පනත මඟින් අභ්‍යාස ආයතනය විශ්වවිද්‍යාල තත්ත්වයට උසස් කරන ලද අතර 2007 ඔක්තෝබර් මස 11 වන දින එය ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය වශයෙන් නැවත නම් කරන ලදී.

1.2 ආයතනික ව්‍යුහය

1.3 කළමනාකරණ මණ්ඩලය (BOM)

විශ්වවිද්‍යාලයේ කළමනාකරණ හා පරිපාලන කටයුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපතිතුමා විසින් පත් කරනු ලැබූ පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත කළමනාකරණ මණ්ඩලය (BoM) විසින් සිදු කරනු ලබයි.

01. ලේකම්, ආරක්ෂක අමාත්‍යාංශය (සභාපති)	**හේමසිරි ප්‍රනාන්දු මහතා** (2018.10.31 – 2019.05.06) **ජෙනරල් එස්එච්එස් කෝට්ටෙගොඩ (විශ්‍රාමික)** WWV RWP RSP VSV USP ndc (2019.05.07-2019.11.19) **මේජර් ජෙනරාල් (විශ්‍රාමික) කමල් ගුණරත්න** WWV RWP RSP USP ndc psc (2019.11.20 – 2019.12.31)
02. යුද හමුදාපති	**ලුතිනන් ජෙනරාල් එන්යූඑම්එම්ඩබ්ලිව් සේනානායක** RWP RSP VSV USP psc (2017.06.27 – 2019.08.18) **ලුතිනන් ජෙනරාල් එල්එච්එස්සී සිල්වා** WWV RWP RSP VSV USP ndc psc (2019.08.18 – 2019.12.31)
03. නාවික හමුදාපති	**වයිස් අද්මිරාල් කේකේවීපීඑච් ද සිල්වා** WWV & Bar, RWP, RSP, VSV, USP, ndu (2019.01.01 – 2019.12.31)
04. ගුවන් හමුදාපති	**එයාර් මාෂල් කේවීබී ජයම්පති** WWV RWP RSP (3 bars) USP විද්‍යාපති (ජාත්‍යන්තර සම්බන්ධතා), fndu (2016.09.13 – 2019.05.29) **එයාර් මාෂල් ඩීඑල්එස් ඩයස්** RSP (3 bars), VSV, USP, MSc (ආරක්. සහ ක්‍රමෝ. අධ්‍යන.), ndc, psc (2019.05.30 – අද දක්වා)
05. අතිරේක ලේකම් (ආරක්ෂක) (ආරක්ෂක අමාත්‍යාංශය)	**අනුරාධ විජේකෝන් මහතා** (2018.11.12 – 2019.12.24)
06. උපකුලපති (කොආවි)	**රියර් අද්මිරාල් ජේජේ රණසිංහ** VSV USP, psc විද්‍යාපති (ආරක්.සහ ක්‍රමෝ.අධ්‍ය)කළමනා., MmaritimePol (ඕස්), CPS පශ්චාත් උපාධි ඩිප්., CR ඩිප්., AFNI (ලන්), සාම විනිසුරු (මුළු දිවයිනටම) (2016.01.01 – 2019.02.14) **එයාර් වයිස් මාෂල් එච්එම්එස්කේබී කොටකදෙණිය** WWV, RWP, RSP, VSV, USP, MSc (ආරක්. සහ ක්‍රම. අධ්‍ය.), fndu, psc (2019.02.14 – 2019.12.31)
07. නියෝජිත (විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව)	**මහාචාර්ය පීඑස්එම් ගුණරත්න** PhD (මූල්‍ය) සුකුබා විශ්වවිද්‍යාලය (ජපානය), විද්‍යාපති (මූල්‍ය) සුකුබා විශ්වවිද්‍යාලය (ජපානය), ව්‍යාපාර පරිපාලනපති (කොළඹ), විද්‍යාවේදී (ගෞරව) ව්‍යාපාර පරිපාලන (USJP) උපසභාපති – විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

මහාචාර්ය මොහාන් ද සිල්වා
Ms, FRCS Edin, FCSSL
සභාපති – විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (2018.03.19 -2019.12.31)

08. නියෝජිත (භාණ්ඩාගාරය)

පීබීඑස්සී නෝනිස් මහතා
විද්‍යාවේදී (ව්‍යාපාර පරිපාලන.) විශේෂ. ගෞරව රාජ්‍ය පරිපාලනපති, ඕස්ට්‍රේලියාව
LICA කොම්ප්ට්‍රොලර් ජනරාල්
මුදල් සහ ජනමාධ්‍ය අමාත්‍යාංශය (2018.06.07-2019.03.21)
එස්.ඒ.සී. කුලතිලක මහත්මිය
වාණිජවේදී (විශේෂ) (ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය), මූල්‍ය කළමණාකරණ ඩිප්ලෝමා (SLIDA) (2019.03.21 සිට 2019.12.31)

09. වැඩ බලන ලේඛකාධිකාරි (කොඅාවි)

කර්නල් පී.එස්.එස් සංජීව RSP psc
ශාස්ත්‍රපති (NPS, ඇඑජ), විද්‍යාපති (බංගලාදේශ විශ්වවිද්‍යාලය),M(Def.)S(කැලණිය විශ්වවිද්‍යාලය), IHR ඩිප්ලෝමා (ශ්‍රී ලංකාව)
(2018.03.09 - 2019.12.31)

1.4 විශ්වවිද්‍යාලයේ සනාතන සභාව

විශ්වවිද්‍යාලයේ සනාතන සභාව පහත දැක්වෙන නිලධාරීන්ගෙන් සමන්විත වේ;

- උපකුලපතිතුමා
- මණ්ඩපාධිපති - දක්ෂිණ මණ්ඩපය
- නියෝජ්‍ය උප කුලපති (ආරක්ෂක සහ පරිපාලන)
- නියෝජ්‍ය උප කුලපති (අධ්‍යයන)
- ප්‍රතීතන ප්‍රදාන ලද සහ අනුබද්ධිත ආයතන ප්‍රධානීන්
- පර්යේෂණ සහ සංවර්ධන පීඨාධිපති
- සියලුම පීඨවල පීඨාධිපතිවරු
- සියලුම මධ්‍යස්ථානවල අධ්‍යක්ෂවරු
- සෑම පීඨයකින් ම ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරු / මහාචාර්යවරු දෙදෙනෙක්
- ලේඛකාධිකාරී
- පුස්තකාලයාධිපති
- සහායක නිලධාරී
- බලගණ අණ දෙන නිලධාරීන්
- සියලුම අධ්‍යයනංශාධිපතීන්
- ආරක්ෂක සහ ක්‍රමෝපාය අධ්‍යයන පීඨයේ II වන ශ්‍රේණියේ මාණ්ඩලික නිලධාරියෙක්
- පීඨ සංඛ්‍යාවට සමාන වන පරිදි උපකුලපතිතුමා විසින් නම්කරන ලද සහාය මහාචාර්යවරු සහ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරු

2019 වර්ෂය තුළ සනාතන මණ්ඩලයේ රැස්වීම් දහතුනක් (13) ක් පවත්වන ලදී.

1.5 කුලපතිතුමා සහ විශ්වවිද්‍යාලයේ ප්‍රධාන කාර්ය මණ්ඩලය

2019 ජනවාරි 01 සිට 2019 දෙසැම්බර් 31 දක්වා

කුලපති
අද්මිරාල් දයා සඳගිරි, RSP, VSV, USP, rcds, psc, MSc(DS), FIMgt(UK), MNI(Lond), MRIN(Lond), සාම විනිසුරු (ශ්‍රී ලංකාව)

ප්‍රධාන මාණ්ඩලික නිලධාරීන්

හමුදා

උපකුලපති
එයාර් වයිස් මාෂල් එච්එම්එස්කේබී කොටකදෙණිය WWV RWP RSP VSV USP විද්‍යාපති (ආරක්ෂ. සහ ක්‍රමෝ. අධ්‍ය.) fndu psc

මණ්ඩපාධිපති – දක්ෂිණ මණ්ඩපය
බ්‍රිගේඩියර් ඒඑස් හේවාවිතාරණ RSP USP
බ්‍රිගේඩියර් ඩබ්ලිඒකේ තිලකරත්න psc

නියෝජ්‍ය උපකුලපති (ආරක්ෂක සහ පරිපාලන)
මේජර් ජෙනරාල් අයිපි රණසිංහ RWP RSP ndu MDefs විද්‍යාපති psc
බ්‍රිගේඩියර් එන් හතුරුසිංහ psc IG Hdmc

පීඨාධිපති – පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය
බ්‍රිගේඩියර් ආර්ජීයු රාජපක්ෂ RSP psc විද්‍යාවේදී(DS) KDA විද්‍යාපති(DS) කැලණිය MASS(NDU) වොෂින්ටන් DC

පීඨාධිපති - ආරක්ෂක සහ උපක්‍රමික අධ්‍යයන පීඨය
බ්‍රිගේඩියර් ජේඒමිසි ජයවීර RSP USP

පීඨාධිපති - සමසෞඛ්‍ය විද්‍යා පීඨය
ලුති. කර්. වෛද්‍ය. ඒඑඩීඒඑස් ගුණතිලක

ලේඛකාධිකාරි (වැඩ බලන)
ලුතිනන් කර්නල් පීඑස්එස් සංජීව RSP psc VIR MA (NPS, USA), MSc (බංගලාදේශ විශ්වවිද්‍යාලය), M (Def.) S (කැලණිය විශ්වවිද්‍යාලය), IHR ඩිප්ලෝමා (ශ්‍රී ලංකාව)

අණදෙන නිලධාරි (පරිපාලන)
ලුතිනන් කර්නල් ඒකේ පීරිස් RSP

විධායක අධිකාරී
ලුතිනන් කර්නල් ඩබ්එම්එන්කේඩී බණ්ඩාර RWP RSP USP Psc

සිවිල්

නියෝජ්‍ය උපකුලපති (අධ්‍යයන)
මහාචාර්ය එම්එච්ජේ ආරියරත්නMBBS (කොළඹ), MS (කොළඹ), FRCS (එඩින්බර්ග්), FRCS (එංගලන්තය),ජ්‍යෙෂ්ඨ සාමාජික - PGIM, (කොළඹ), FCS (SL)

පීඨාධිපති – වෛද්‍ය පීඨය
මහාචාර්ය එම්එච්ජේ ආරියරත්නMBBS (කොළඹ), MS (කොළඹ), FRCS (එඩින්බර්ග්), FRCS (එංගලන්තය),ජ්‍යෙෂ්ඨ සාමාජික - PGIM, (කොළඹ), FCS (SL)

පීඨාධිපති – ඉංජිනේරු පීඨය
ආචාර්ය ඩබ්සිඩීකේ ප්‍රනාන්දු BSc ඉංජී (මොරටුව), MEng (මොරටුව), PhD (මොරටුව), AMIE (SL), CTHE (කොළඹ), SEDA (එංගලන්තය), MSLAAS

ආචාර්ය ටීඑම්ඩබ්ආර්එම්බී සමරකෝන් BSc ඉංජී (පේරාදෙණිය), MEng (AIT, බැංකොක්), PhD (Saitama, ජපානය) AMIE(SL), MSLAAS, CTHE (කොළඹ)

පීඨාධිපති – නීති පීඨය
ඩබ්එම් අමරදාස මයා LLM (ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය), MA (කොළඹ), LLB (කොළඹ), BA (Hons) (ජ'පුර), නිතිඥ, Postgraduate Certificate (එංගලන්තය)

පීඨාධිපති - කළමනාකරණ, සමාජ විද්‍යාව සහ මානව ශාස්ත්‍ර පීඨය
ආචාර්ය ආර්එම්එන්ටී සිරිසෝම PhD (මොරටුව), BSc ඉංජී (ගෞරව) (මොරටුව), C.Eng, CMILT (එංගලන්තය), MITE (ඇඑජ), MIE (SL)

පීඨාධිපති – නිර්මිත පරිසරය සහ අවකාශීය විද්‍යා පීඨය
ආචාර්ය ඒආර් රූපසිංහ BSc (Hons) SP (භූගෝලය) (SOFIA Bulgaria) MSc සිතියම් විද්‍යාව සහ භූ විද්‍යාව, PhD (භූගෝලය)

පීඨාධිපති – පරිගණක පීඨය
කොමදොරු ජේයු ගුණසිල USP psc BSc. (විදුලි හා ඉලෙක්ට්‍රොනික), MEeg (ඉලෙක්ට්‍රොනික හා ටෙලි සන්නිවේදන), CEng.MIET, CEng.MIESL

පීඨාධිපති - පර්යේෂණ සහ සංවර්ධන
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ඒස්ආර් ද අල්විස් සෙනෙවිරත්න MD (ප්‍රජා වෛද්‍ය විද්‍යාව) (කොළඹ), DipMedEd (Dundee), MMEd (ගෞරව) (Dundee), MBBS (Ceylon) (ගෞරව), FCCP(SL)

මහාචාර්ය සීඑල් ගුණසේකර BSc (කොළඹ), PhD (කැනඩාව), Postdoctoral fellow (කැනඩාව)

පුස්තකාලයාධිපති (වැඩ බලන)
ටීසී රණවැල්ල BSc (කැලණිය), MLS (කොළඹ), ASLLA, CTHE

මූල්‍යාධිකාරි (වැඩ බලන)
ඒකේඑස් ආරියපාල මයා ACA,B.Sc (ගණකාධිකරණ) Sp (ජ'පුර), ACMA, APFA

1.6 වාර්ෂික ප්‍රගති වාර්තාව - 2019

01. <u>ආයතනය පිළිබඳ පොදු සමාලෝචනය</u>

ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය (කොආවි) 1981 අංක 68 දරන ශ්‍රීමත් ජෝන් කොතලාවල රාජ්‍ය ආරක්ෂක අභ්‍යාස ආයතන පනත යටතේ ස්ථාපිත කරන ලද අතර පසුව සිදු කරන ලද සංශෝධන කීපයක් මඟින් එහි මෙහෙයුම් විෂය පථය පුළුල් කර ඇත. මෙම විශ්වවිද්‍යාලය ආරක්ෂක අමාත්‍යාංශය යටතේ කළමනාකරණ මණ්ඩලයක් මගින් පාලනය වන ස්වාධීන ආයතනයක් ලෙස ක්‍රියා කරන රජයේ විශ්වවිද්‍යාලයක් වන අතර**,** එය ත්‍රිවිධ සේවා පුද්ගලයන්ට**,** රටේ සුදුසුකම් ලත් තරුණ ප්‍රජාවට**,** විදේශීය සිසුන් සහ පුද්ගලික සහ රාජ්‍ය අංශයේ පුද්ගලයන්ට අදාළ විෂය ක්ෂේත්‍රවලින් ප්‍රථම උපාධි සහ පශ්චාත් උපාධි මට්ටමේ උසස් අධ්‍යාපන අවස්ථා පිරිනමයි.

02. <u>මූල්‍ය ප්‍රගතිය</u>

<u>**31.07.2019** දිනට මූල්‍ය ප්‍රගතිය</u>

විස්තරය	**2019** ඇස්තමේන්තුවට අනුව ප්‍රතිපාදන (රු.)	**2019.09.30** දිනට සත්‍ය වියදම (රු.)	සමස්ත ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස සත්‍ය වියදම%
පුනරාවර්තන	1,456,000,000.00	862,982,446.14	59.27
ප්‍රාග්ධන	89,000,000.00	24,792,104.32	27.86
පොළී ගෙවීම - කොආවි විශ්වවිද්‍යාල රෝහල	4,160,000,000.00	1,971,296,775.89	47.39
මුළු එකතුව (පුනරාවර්තන+ප්‍රාග්ධන)	**5,705,000,000.00**	**2,859,071,326.35**	**50.12**

03. <u>ආයතනයේ ප්‍රගතිය</u>

3.1 ආයතනයේ සාමාන්‍ය කටයුතුවල ප්‍රගතිය

<u>3.1.1 ලේඛකාධිකාරී කාර්යාලය</u>

කාර්ය මණ්ඩලය	ලබා ගැනීම්	විශ්‍රාම ගැනීම්	ඉල්ලාඅස්වීම්	සේවය අහෝසි යාම	අවසන් කිරීම්	උසස් වීම්	කොන්ත්‍රාත් කාලයේ අවසානය	මරණය
අධ්‍යයන	08	00	01	00	00	13	02	00
පරිපාලන	01	00	01	00	00	02	01	00
අධ්‍යයන සහායක	25	00	04	00	00	01	02	00
ලිපිකරු සහ සමාන්තර ශ්‍රේණි	03	05	01	00	00	09	00	00
සුළු ශ්‍රේණි	43	03	10	03	00	16	00	00
එකතුව	80	08	13	02	00	41	05	00

<u>**3.1.2** අධ්‍යයන කාර්ය මණ්ඩල සංඛ්‍යාවේ සංවර්ධනය</u>

වර්ෂය	**2019**
කාර්ය මණ්ඩල සංඛ්‍යාව	09

3.1.3 ශිෂ්‍ය ගහනයේ සංවර්ධනය (ශිෂ්‍ය භට/දෛනික සිසුන්)

වර්ෂය	පීඨය	ශිෂ්‍ය සංඛ්‍යාව
2019	වෛද්‍ය පීඨය	42
	ඉංජිනේරු පීඨය	140
	නීති පීඨය	135
	කළමනාකරණ, සමාජ විද්‍යා සහ මානව ශාස්ත්‍ර පීඨය	231
	සම සෞඛ්‍ය අධ්‍යයන විද්‍යා	172
	නිර්මිත පරිසරය සහ අවකාශීය විද්‍යා පීඨය	88
	පරිගණක පීඨය	127

3.1.4 පුස්තකාලය

(KOHA) විවෘත මූලාශ්‍ර මෘදුකාංග භාවිතා කරමින් වෙබ් පාදක පුස්තකාල කළමනාකරණ පද්ධතිය (LMS) පුස්තකාල ජාලය සඳහා සාර්ථකව ස්ථාපනය කර ඇත. කොඅාවි එකතුව සඳහා D Space මෘදුකාංගය භාවිතා කරමින් ඩිජිටල් ලේඛනාගාරයක් තැනීමට කොඅාවි පුස්තකාලය පියවර ගෙන තිබේ.

3.2 ප්‍රධාන ප්‍රාග්ධන ව්‍යාපෘතිවල මූල්‍ය සහ භෞතික ප්‍රගතිය

කොඅාවි විසින් භාර ගන්නා ලද ප්‍රධාන ප්‍රාග්ධන ව්‍යාපෘති ලෙස හඳුනා ගත හැකි ව්‍යාපෘති තුනක් තිබේ. ඒවා නම්;

3.2.1 සූරියවැව දක්ෂිණ මණ්ඩපය ස්ථාපිත කිරීම.

3.2.2 වේරහැර විශ්වවිද්‍යාල රෝහල ඉදිකිරීම.

3.2.3 රත්මලානේ ඉංජිනේරු පීඨ ගොඩනැගිල්ල ඉදි කිරීම.

3.2.1 සූරියවැව දක්ෂිණ මණ්ඩපය ස්ථාපිත කිරීම.

ඉදිකිරීම් කටයුතු සඳහා ශ්‍රී ලංකා නාවික හමුදාවේ සහ මාර්ග ජාල ඉදිකිරීම සඳහා ශ්‍රී ලංකා යුද හමුදාවේ දායකත්වය සමග කොඅාවි විසින් දක්ෂිණ මණ්ඩපයේ ස්ථාපිත කිරීම කරගෙන යන ලදි. 2015, අවසානය වන විට (I) අදියරෙහි ඉදිකිරීම් කටයුතු අවසන් කරන ලදී (90% ට වඩා). 2015 මැයි මස 05 වන දින අතිගරු ජනාධිපතිතුමා විසින් මණ්ඩපය උත්සවාකාරයෙන් විවෘත කරන ලද අතර නිර්මිත පරිසරය හා අවකාශීය විද්‍යා පීඨයේ සහ පරිගණක පීඨයේ අධ්‍යයන කටයුතු 2015 පෙබරවාරි මාසයේදී ආරම්භ කරන ලදී.

දක්ෂිණ මණ්ඩපයේ ශිෂ්‍ය ගහනය පහත පරිදි වේ.



3.2.2 කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ විශ්වවිද්‍යාල රෝහල ඉදිකිරීම. (UHKDU)

විශ්ව විද්‍යාල රෝහල, කොතලවල ආරක්ෂක විශ්වවිද්‍යාල ඉදිකිරීම් ව්‍යාපෘතිය පහත සඳහන් ප්‍රධාන ක්ෂේත්‍රවලට බෙදා ඇත.

අ. රෝගීන්ගේ ඇඳන් 706 ක්, දැඩි සත්කාර ඇඳන් 70ක් සහ අනතුරු සහ හදිසි අනතුරු ඇඳන් 38ක් සහිත මහල් 9කින් යුත් ප්‍රධාන රෝහල් ගොඩනැගිල්ල.

ආ. බාහිර රෝගී ඒකකය, සායනික ශල්‍ය ඒකක, අනතුරු හා හදිසි අනතුරු ඒකක සහ ලොන්ඩ්‍රිය, මුළුතැන්ගෙය, ඔසුහල, වෙනත් ප්‍රදේශ වැනි වෙනත් උපකාරක සේවා සහිත පරිපාලන ගොඩනැගිල්ල.

ඇ. විවිධ වෘත්තීන් සඳහා පහසුකම් සැලසීමට පර්යන්ත වාසස්ථාන ගොඩනැගිලි 09ක් ඉදිකර තිබුණි.

ප්‍රධාන රෝහල් ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු කඩිනම් ක්‍රියාවලියක් යටතේ සිදු කෙරෙන අතර ඉදිකිරීම් කටයුතු වලින් දළ වශයෙන් 90%ක් කොන්ත්‍රාත්කරු පොලි ටෙක්නොලොජීස් සමාගම විසින් අවසන් කර ඇත.



3.2.3 ඉංජිනේරු පීඨ ගොඩනැගිල්ල ඉදි කිරීම.

ඉංජිනේරු පීඨය සඳහා නව ගොඩනැගිල්ල ඉදි කිරීම ශ්‍රී ලංකා රුපියල් මිලියන 500ක පිරිවැයකට 2013 දී ආරම්භ කරන ලද අතර ඉදිකිරීම් සඳහා අයවැය වෙන් කිරීම් වාර්ෂිකව ලබා දී ඇත. ගොඩනැගිල්ලේ I අදියර 2015 මාර්තු මාසයේදී නිම කරන ලද අතර, II අදියරේ ඉදිකිරීම් කටයුතු 2016 දී අඛණ්ඩව සිදු වූ නමුත් අයවැය වෙන් කිරීම් සීමා කිරීම හේතුවෙන් 2017 වසරට ගෙන යන ලදි. නව ගොඩනැඟිලි සංකීර්ණය අනාගතයේ දී වැඩි වන ශිෂ්‍ය ගහනයට පහසුකම් සැලසීම සඳහා ඉංජිනේරු පීඨයේ පරිසරය, ආර්ථිකය, ශක්තිය, පාරිසරික තිරසාරභාවය සහ ධාරිතාව ඉහළ නැංවීමට දායක වන අතර ඉඩ සලසයි.

1.7 අනාගත සැලසුම්

<u>ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය</u>

- උපාධි පාඨමාලා හතරකින් (04) සමන්විත අධ්‍යයනාංශ දෙකක් සහිත තාක්ෂණික පීඨය ස්ථාපනය කිරීම.
- පීඨ සංඛ්‍යාව ඉහළ නැංවීමත් සමඟ ඇතුළත්කරගනු ලබන ශිෂ්‍ය සංඛ්‍යාව ඉහළ නැංවීම.
- නීති පීඨය සහ කළමනාකරණ, සමාජ විද්‍යා සහ මානව ශාස්ත්‍ර පීඨය සඳහා නවීන පහසුකම්වලින් සමන්විත නව ගොඩනැඟිලි දෙකක් (02) ඉදිකිරීම.
- විශ්වවිද්‍යාලයේ ප්‍රධාන ශ්‍රවණාගාරයේ ඉදිකිරීම් කටයුතු නිමකිරීම .
- රත්මලාන පිහිටි නේවාසිකාගාරය පිළිසකර කිරීම.
- කාර්ය මණ්ඩලයේ ප්‍රයෝජනය සඳහා වාහන නැවැත්වීමේ පහසුකම්, නවාතැන් පහසුකම්, සුපිරි වෙළඳ සංකීර්ණය, අවන්හල ආදී බහු විධ පහසුකම් ඇතුළත් ගොඩනැඟිලි සංකීර්ණයක් ඉදිකිරීම.
- කොඇවි මූලස්ථානය වර්තමාන අධ්‍යයන කටයුතු සිදු කෙරෙන ගොඩනැගිල්ල වෙත ගෙන ඒම.
- ව්‍යායාම් මධ්‍යස්ථානය පුළුල් කිරීම .
- මිලෝදා මූල්‍ය අධ්‍යයන ආයතන ගොඩනැඟිල්ලෙහි විශ්විද්‍යාලයේ නාගරික මණ්ඩපය සථාපනය කිරීම.

<u>කොඇවි - විශ්වවිද්‍යාල රෝහල</u>

- වේරහැර පිහිටි කාන්තා නේවාසිකාගාරයේ ඉදිකිරීම් කටයුතු අවසන් කිරීම.
- රෝහල් තොරතුරු කළමනාකරණ පද්ධතියක් පිහිටුවීම.
- විකිරණ චිකිත්සක ප්‍රතිකාර ඒකකයක් පිහිටුවීම.
- දෙමුහුන් ශල්‍යාගාරයක් (hybrid theater) සහ හෘද රෝග විනිශ්චය කිරීමේ විද්‍යාගාරයක් (cath lab) කොඇවි රෝහලේ ස්ථාපනය කිරීම.
- කොඇවි රෝහලෙහි සුවසන ආධාරක කුටියක් (hypobaric chamber) ස්ථාපනය කිරීම.
- අනතුරු හා හදිසි ප්‍රතිකාර ඒකකයක් පිහිටුවීම.

<u>දක්ෂිණ මණ්ඩපය</u>

- අධ්‍යයන කාර්ය මණ්ඩල, ශිෂ්‍ය සහ සෙසු නිල මෙන්ම මණ්ඩපාධිපතිගේ නවාතැන් පහසුකම් වැඩිදියුණු කිරීම.
- පරිගණක පීඨය සඳහා නව ගොඩනැඟිල්ලක් ඉදිකිරීම.

2. විශ්වවිද්‍යාලයේ පීඨ සහ මණ්ඩප

කොඅවි පීඨ සහ උපාධි වැඩසටහන්

ආරක්ෂක සහ උපක්‍රමික අධ්‍යයන පීඨය

විද්‍යාවේදී ක්‍රමෝපාය අධ්‍යයන සහ ජාත්‍යන්තර සබඳතා

පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය

දර්ශනශූරී
දර්ශනපති
විද්‍යාපති කළමනාකරණ
විද්‍යාපති හමුදා විද්‍යා සහ තාක්ෂණ
විද්‍යාපති ඊ-පාලනය පිළිබඳ ව්‍යාපාර කළමණාකරණ
විද්‍යාපති කාර්ය සම්පාදන කළමනාකරණය පිළිබඳ ව්‍යාපාර කළමණාකරණ
නීතිපති (LLM)
විද්‍යාවේදී කළමනාකරණ

වෛද්‍ය පීඨය

වෛද්‍ය සහ ශල්‍ය වෛද්‍යවේදී (MBBS)

ඉංජිනේරු පීඨය

විද්‍යාවේදී ගෞරව (ගගනයාත්‍රික ඉංජිනේරු)
විද්‍යාවේදී ගෞරව (ගුවන් යානා නඩත්තු ඉංජිනේරු)
විද්‍යාවේදී ගෞරව (ජෛව වෛද්‍ය ඉංජිනේරු)
විද්‍යාවේදී ගෞරව (සිවිල් ඉංජිනේරු)
විද්‍යාවේදී ගෞරව (විදුලි සහ විද්‍යුත් ඉංජිනේරු)
විද්‍යාවේදී ගෞරව (ඉලෙක්ට්‍රොනික සහ විදුලි සන්නිවේදන)
විද්‍යාවේදී ගෞරව (නාවික ඉංජිනේරු)
විද්‍යාවේදී ගෞරව (යාන්ත්‍රික ඉංජිනේරු)
විද්‍යාවේදී ගෞරව (යාන්ත්‍රික විද්‍යුත් ඉංජිනේරු)

පරිගණක පීඨය

විද්‍යාවේදී ගෞරව (පරිගණක විද්‍යාව)
විද්‍යාවේදී ගෞරව (පරිගණක ඉංජිනේරු)
විද්‍යාවේදී ගෞරව (මෘදුකාංග ඉංජිනේරු)
විද්‍යාවේදී ගෞරව (තොරතුරු තාක්ෂණය)
විද්‍යාවේදී ගෞරව (තොරතුරු පද්ධති)

නීති පීඨය

නීතිවේදී (LLB)

කළමනාකරණ, සමාජ විද්‍යා සහ මානව ශාස්ත්‍ර පීඨය

විද්‍යාවේදී කාර්ය සම්පාදන කළමනාකරණ
විද්‍යාවේදී කළමනාකරණ සහ තාක්ෂණික විද්‍යා
විද්‍යාවේදී සමාජ විද්‍යා

සමසෞඛ්‍ය විද්‍යා පීඨය

විද්‍යාවේදී ගෞරව (වෛද්‍ය රසායනාගාර විද්‍යා)
විද්‍යාවේදී ගෞරව (භෙද)
ඖෂධවේදී
විද්‍යාවේදී ගෞරව (භෞතචිකිත්සාව)
විද්‍යාවේදී ගෞරව (විකිරණවේදය)

නිර්මිත පරිසරය සහ අවකාශීය විද්‍යා පීඨය

විද්‍යාවේදී ගෘහ නිර්මාණ ශිල්පය
විද්‍යාවේදී ගෞරව (නිර්මිත පරිසරය)
විද්‍යාවේදී නිර්මිත පරිසරය
විද්‍යාවේදී ගෞරව (මැනුම් විද්‍යා)
විද්‍යාවේදී මැනුම් විද්‍යා
විද්‍යාවේදී ගෞරව (ප්‍රමාණ සමීක්ෂණය)
විද්‍යාවේදී ප්‍රමාණ සමීක්ෂණය

2.1 පීඨ

2.1.1 පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය

<u>හැඳින්වීම</u>

ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය 2001 වසරේ දී විද්‍යාපති උපාධි අංශය ලෙස ස්ථාපනය කරන ලද අතර ත්‍රිවිධ හමුදා සහ පොලිස් නිලධාරීන් සඳහා විද්‍යාපති (ආරක්ෂක අධ්‍යයන) කළමනාකරණ උපාධිය හැදෑරීමට ඉඩප්‍රස්ථා සලසන ලදී. පළමු විද්‍යාපති (ආරක්ෂක අධ්‍යයන) කළමනාකරණ උපාධි වැඩසටහන 2001 මාර්තු 22 දින ආරම්භ කරන ලද අතර 2003 වසරේ ජූලි මස 10 දින විද්‍යාවේදී (ආරක්ෂක අධ්‍යයන) කළමනාකරණ උපාධි වැඩසටහන ආරම්භ කරන ලදී. ඉහළ අධ්‍යයන ප්‍රමිතියක් සහතික කිරීමට සහ සහභාගීවන්නන්ට සිය සේවා තුළ රැඳී සිටින අතරතුරදීම වසර දෙකක් තුළ උපාධිය අවසන් කිරීමට හැකි වන ආකාරයෙන් ශ්‍රී ලංකාවේ කීර්තිමත් විශ්වවිද්‍යාලවල ජ්‍යෙෂ්ඨ අධ්‍යාපනඥයින් සහ මහාචාර්යවරුන්ගෙන් සැදුම්ලත් මණ්ඩලයක් විසින් මෙම පාඨමාලා සකස් කරන ලදී. 2007 වසරේදී පශ්චාත් උපාධි අධ්‍යයන ආයතනය (IPGS) ස්ථාපිත කරන ලද අතර පසුව 2009 වසරේ දී කාර්ය මණ්ඩල සංවර්ධන සහ වෘත්තීය අභිවර්ධන අංශය ලෙස නම් කරනු ලැබීය. අවසානයේදී එය 2012 දී පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය (FGS) බවට උසස් කරන ලදී.

වර්තමානයේ දී පීඨය විසින් ත්‍රිවිධ හමුදාවල නිලධාරීන් සහ සෙසු නිලයන් සඳහා, පොලිස් නිලධාරීන් සහ පුද්ගලික අංශයේ විධායක නිලධාරීන් සඳහා පශ්චාත් උපාධි මට්ටමේ වැඩසටහන් සහ උපාධි අපේක්ෂකයින් සඳහා වූ වැඩසටහන් සහ ඩිප්ලෝමා/ සහතිකපත්‍ර පාඨමාලා පවත්වා ගෙන යාමෙහි අඛණ්ඩව නියැලී සිටියි. පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය (FGS) අන්තර්ක්‍රියාකාරී සැසි, අත්හදා බැලීමේ ඉගෙනුම් සහ ස්වාධීන පර්යේෂණ ව්‍යාපෘති ආදිය තුළින් සහභාගීවන්නන්ගේ පෞද්ගලික මෙන්ම වෘත්තීය සංවර්ධනය සහතික කරයි. තවද පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය ත්‍රිවිධ හමුදා නිළධාරීන් සඳහා පරිගණක ඩිප්ලෝමා සහ සහතිකපත් පාඨමාලා ගණනාවක්ද පවත්වා ගෙන යන අතර කොආවි හි තොරතුරු තාක්ෂණ සහාය සහ සංවර්ධන සේවාව (CITS & DS) හි දේශන සඳහා දායකත්වය ලබා දෙන පරිගණක පුහුණු මධ්‍යස්ථානයක් (CTC) ද ඇත.

<u>ප්‍රධාන පත්කිරීම්වල වෙනස් වීම්</u>

2019 වසර තුළදී ආරක්ෂක අධ්‍යයන පීඨය තුළ පහත ප්‍රධාන පත්වීම්වල වෙනස් වීම් සිදු විය.

- මාණ්ඩලික නිලධාරි I, ලුති කර් එස්එම් අතුකෝරල වෙනුවට ලුති කර් ටීඒල්එම් චන්ද්‍රසේකර 18.02.2019 දින පත්විම.
- මාණ්ඩලික නිලධාරි II, මේජර් ජීඩීඒඑන්පී සමරනායක වෙනුවට මේජර් ආර්එම්එස් රත්නායක 11.02.2019 දින පත්විම.
- මාණ්ඩලික නිලධාරි II (පරිපාලන), මේජර් යුකේඩීඑල්කේ උඩුගම වෙනුවට මේජර් ආර්එම්එච් කරුණාරත්න 27.01.2019 දින පත්විම.
- සහකාර ලේඛකාධිකාරි ඩීඑල්සී අලහකෝන් මෙය වෙනුවට අයිඩීඒටී ප්‍රියදර්ශනි මෙය 18.02.2019 දින පත්විම.

<u>කාර්ය මණ්ඩල සංවර්ධන ක්‍රියාකාරකම්</u>

- "කණ්ඩායම් ගොඩනැගීම සහ නායකත්ව සංවර්ධනය" පිළිබඳ වැඩමුළුව FGS හි සියලු කාර්ය මණ්ඩල සාමාජිකයින් සඳහා ඔවුන්ගේ කණ්ඩායම් ගොඩනැගීමේ හා නායකත්ව කුසලතා වැඩි දියුණු කිරීම සඳහා 2016.02.01 දින පවත්වන ලදී.

<u>විශේෂ සිදුවීම් / උත්සව</u>

- 2019 වර්ෂය සඳහා පශ්චාත් උපාධි අධ්‍යයන පීඨයේ සමාරම්භක උත්සවය 2019 මාර්තු මස 27 වන දින FGS ශ්‍රවණාගාරයේදී පැවැත්වූ අතර පහත සඳහන් වැඩසටහන්වලට සිසුන් 198 දෙනෙකු එක් විය;

අනු. අංකය	වැඩසටහන	ශිෂ්‍ය සංඛ්‍යාව
01	දර්ශනපති/දර්ශනශූරි	18
02	කළමනාකරණය පිළිබඳ විද්‍යාපති	15
03	කාර්ය සම්පාදන කළමනාකරණය පිළිබඳ ව්‍යාපාර	52

	පරිපාලනපති	
04	නීතිපති	58
05	ආරක්ෂක ක්‍රමෝපාය අධ්‍යයන පිළිබඳ විද්‍යාපති	13
06	සිවිල් හා ව්‍යුහාත්මක ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාපති	09
07	ආපදා අවදානම් අවම කිරීමේ සංවර්ධනය පිළිබඳ විද්‍යාපති	12
08	කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී	21

- පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය විසින් පවත්වන ලද තොරතුරු තාක්ෂණ වැඩසටහනේ ඩිප්ලෝමා ප්‍රදානෝත්සවය XVII 2019 අගෝස්තු 20 දින පවත්වන ලදි.

- පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය කොඅාවි හි ආරක්ෂක හා උපක්‍රමික අධ්‍යයන පීඨය සමඟ එක්ව 2019.09.11 සහ 2019.09.12 දින ජාත්‍යන්තර පර්යේෂණ සමුළුවේදී ආරක්ෂක හා උපක්‍රමික අධ්‍යයන සැසිය - 2019 සඳහා සත්කාරකත්වය දක්වන ලදී.

- පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය කොඅාවි හි ඇති පශ්චාත් උපාධි පාඨමාලා පිළිබඳ මහජනතාවගේ දැනුවත්භාවය වැඩි කිරීම සඳහා පීඨ වැඩසටහන් පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු ඇතුළත් ප්‍රදර්ශන කුටියක් සංවිධානය කිරීම මගින් පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය කොඅාවි විවෘත දිනය සඳහා දායක විය. තවද, මෙම පීඨය විසින් විශ්වවිද්‍යාල සහ නිර්මිත පරිසරය හා අවකාශීය විද්‍යා පීඨය සඳහා විවෘත දිනය ක්‍රියාකාරකම්වලට 2016.10.06 දින ඉඩ ලබා දී ඇත.

- පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය විසින් පවත්වන ලද තොරතුරු තාක්ෂණ ඩිප්ලෝමා වැඩසටහනේ සම්මාන ප්‍රදාන උළෙල XVIII 2019 දෙසැම්බර් 16 දින පැවැත්විණි.

- කොඅාවි උපාධි ප්‍රදානෝත්සවය 09.01.2020 සහ 10.01.2020 දිනවල BMICH හිදී පැවැත්වූ අතර මෙහි පශ්චාත් උපාධි සිසුන් 98කට සහ උපාධි අපේක්ෂකයින්ට උපාධි ප්‍රදානය කරන ලදී.;

අනු. අංකය	වැඩසටහන	උපාධිධාරීන් සංඛ්‍යාව
01	දර්ශනපති/ දර්ශනශූරි	01
02	කළමනාකරණය පිළිබඳ විද්‍යාපති	17
03	කාර්ය සම්පාදන කළමනාකරණය පිළිබඳ ව්‍යාපාර පරිපාලනපති	16
04	ඊ-පාලනය පිළිබඳ ව්‍යාපාර පරිපාලනපති	05
05	නීතිපති	24
06	ආරක්ෂක ක්‍රමෝපාය අධ්‍යයන පිළිබඳ විද්‍යාපති	11
07	ඉලෙක්ට්‍රොනික සහ විදුලි සංදේශ ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාපති	01
08	සිවිල් හා ව්‍යුහාත්මක ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාපති	01
09	ආරක්ෂාව සහ ක්‍රමෝපාය අධ්‍යයන පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	01
10	කාර්ය සම්පාදන කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	01
11	නීතිය පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	01
12	විදුලි ඉංජිනේරු පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	01
13	කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී	18

2.1.2 ආරක්ෂක සහ උපක්‍රමික අධ්‍යයන පීඨය

හැඳින්වීම

ආරක්ෂක හා උපක්‍රමික අධ්‍යයනය කොඇවි තුළ ප්‍රමුඛ අධ්‍යයන ක්ෂේත්‍රයක් වන අතර එහි ඇති වගකීම් විශ්වවිද්‍යාලයේ නියෝජ්‍ය උපකුලපතිතුමාගේ (ආරක්ෂක හා පරිපාලන) විෂය සීමාව යටතේ ක්‍රියාත්මක වන ආරක්ෂක හා උපක්‍රමික අධ්‍යයන පීඨයට (FDSS) භාර දී ඇත. FDSS, කෙඩෙට් නිලධාරීන්ට මෙන්ම අදාළ ක්ෂේත්‍රවල සිටින ත්‍රිවිධ-හමුදා සේවා හා වෙනත් අදාළ නිලධාරීන්ට උසස් තත්ත්වයේ හමුදා අධ්‍යාපනයක් හා පුහුණුවක් තහවුරු කිරීමට බහු-ආංශික අධ්‍යයන හා හමුදා පුහුණු කිරීමේ ක්‍රියාකාරකම් කරගෙන යාම සඳහා වගකිවයුතු, ආරක්ෂක අධ්‍යනාංශය හා ක්‍රමෝපාය අධ්‍යනාංශය නමැති අධ්‍යයනාංශ දෙකකින් සමන්විත වේ. කෙඩෙට් නිලධාරී පුහුණුව හැරුණු විට පෞද්ගලික හා රජයේ පාසල් සහ ශ්‍රී ලංකා පරිපාලන සේවා (SLAS) හි සාමාජිකයින් සඳහා නායකත්ව සහ පුද්ගලික සංවර්ධන පුහුණු වැඩසටහන් FDSS විසින් සිදු කරනු ලැබේ.

ආරක්ෂක අධ්‍යයන අධ්‍යනාංශය

ආරක්ෂක අධ්‍යයන අධ්‍යයනාංශය (DDS) කෙඩෙට් නිලධාරීන්ගේ සහ දෙනික සිසුන්ගේ විනය, හමුදා පුහුණුව හා සියලු පරිපාලන කටයුතු සඳහා වගකිව යුතු වේ. ආරක්ෂක අධ්‍යයන අධ්‍යනාංශය නම් වශයෙන් ඇතුළත් කර ගැනීම 32,33,34,35,36 සහ 37 යන බලගණ හයකින් (06) සමන්විත වන අතර එක් එක් බලගණය පිහිටුවා ඇත්තේ එක් එක් ඇතුළත් කර ගැනීමේ කෙඩෙට් නිලධාරීන් අණ හා පාලනය සඳහා බල කණ්ඩායම් කිහිපයකට බෙදීමෙනි. බලගණ අණදෙන නිලධාරී සම්පූර්ණ බලගණයේ සමස්ත වගකීම දරන අතර, හට කණ්ඩායම් අණ දෙන නිලධාරීන් ඔවුන්ට පවරා දී ඇති හට කණ්ඩායම්වල අධීක්ෂණය සඳහා වගකිව යුතු වේ.

ආරක්ෂක අධ්‍යයන පීඨයෙහි කාර්ය මණ්ඩලය

අනුමත කාර්ය මණ්ඩලය කෙඩෙට් නිලධාරී කණ්ඩායම් හයක් සඳහා සත්කාරකත්වය දක්වයි. 2019 දෙසැම්බර් 31වන දිනට ආරක්ෂක අධ්‍යයන පීඨයේ කාර්ය මණ්ඩලය පහත පරිදි වේ.

ප්‍රධාන පත්කිරීම්වල වෙනස් වීම්

2019 වසර තුළදී ආරක්ෂක අධ්‍යයන පීඨය තුළ පහත ප්‍රධාන පත්වීම්වල වෙනස් වීම් සිදු විය.

නම	තනතුර	රාජකාරි භාර ගත් දිනය	
		සිට	දක්වා
ලුතී. කර්. ඒඑම්ඒඩීආර් මංගල RSP	නියෝජ්‍ය පීඨාධිපති - වේරහැර	11.03.2018	31.12.2019
මේජර් ඒඑම්ඒඑච්එස් පෙරේරා	මාණ්ඩලික නිලධාරී - II	13.03.2018	30.06.2019
මේජර් ජේජීයු කුමාර	වැඩ බලන මාණ්ඩලික නිලධාරී - II	01.07.2019	04.08.2019
මේජර් ඩීජේපී දික්කුඹුර RSP	මාණ්ඩලික නිලධාරී - II	05.08.2019	31.12.2019
කපිතාන් ඩබ්ජේපී විජේසුන්දර	මාණ්ඩලික නිලධාරී - III	2014	08.03.2019
කපිතාන් කේඑම්එල් ගුණසේකර		25.02.2019	31.12.2019

නව බඳවා ගැනීම් (හමුදා):

2019 වසර තුළදී ආරක්ෂක අධ්‍යයන පීඨය තුළ පහත පත් කිරීම් සිදු විය.

අනු අංක.	නම	තනතුර	රාජකාරි භාර ගත් දිනය
1	ලුති කර් ටීඑල්එම් චන්ද්‍රසේකර RWP	නියෝජ්‍ය පීඨාධිපති – FDSS	13.11.2019

යටිතල පහසුකම්/නව ව්‍යාපෘති

රාත්‍රී භෝජන මේස 20, බ්‍රෙඩ් ස්ලයිසස් සහ ඩීප් ෆ්‍රීසර් 02 බැගින් සහ වානේ ලොකර් 178 (තනි) ශිෂ්‍යභට භෝජනාගාරය සහ කෙඩෙට් නිලධාරී නවාතැන් සඳහා 2019 දී කෙඩෙට් නිලධාරී භෝජනාගාර අරමුදල් භාවිත කර මිලදී ගන්නා ලදී.

හමුදා පුහුණු ක්‍රියාකාරකම්

ශාස්ත්‍රීය අධ්‍යයන කරගෙන යන අතරතුර, සියලු කෙඩෙට් නිලධාරීන් මූලික හමුදා පුහුණුවකටද භාජනය වීමට අවශ්‍යය. පිළිගත් ප්‍රතිපත්තියට අනුව, උපාධි වැඩසටහන්වලින් දළ වශයෙන් 75% ක් ශාස්ත්‍රීය අධ්‍යයන සඳහා වෙන් කරන අතර ඉතිරි 25% මූලික හමුදා පුහුණුව සඳහා 2019 වසරේදී ද වෙන් කරනු ලැබිණි.

කෙඩෙට් පාලනය – කොආවි

කෙඩෙට් නිලධාරීන් අතර ස්වයං-පාලන පද්ධතියක් හඳුන්වා දීමට මෙන්ම ඔවුන්ගේ නායකත්ව ගුණාංග වර්ධනය කර ගැනීමත් ඒවා ඇගයීමත් වෙනුවෙන් අවස්ථාව ලබා දෙනු පිණිස පාඨමාලා අංක 33, 34 හා 35 අතුරින් තෝරා ගත් කෙඩෙට් නිලධාරීන් 53 දෙනෙක් කොආවි කෙඩෙට් නිලධාරි පාලක මණ්ඩලයේ සාමාජිකයින් වශයෙන් පත් කරන ලදී.

නායකත්ව පුහුණු

කොආවි මගින් පවත්වන ලද නායකත්ව පාඨමාලා පහත සඳහන් පරිදි වේ.

- නායකත්ව පුහුණු වැඩසටහන (ඇතුළත් කර ගැනීම 36 දෙනික විද්‍යාර්ථීන්) 2019 මාර්තු 03 සහ 04 කොආවි හිදී පැවැත්විණි.
- සංගණන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ 40 දෙනෙකු සඳහා නායකත්ව පුහුණු වැඩසටහන 2019 මැයි 23 සහ 34 යන දිනවල පැවැත්විණි.

කොආවි සමාජ

සෑම බදාදාවකම කෙ/නි සහ දෙනික විද්‍යාර්ථීන් සමාජ ක්‍රියාකාරකම්වලට සහභාගි වේ.

එළිමහන් ක්‍රියාකාරකම්

කොආවි කෙඩෙට් නිලධාරීන් පහත එළිමහන් ක්‍රියාකාරකම්වල නිරත විය:

- සැතපුම් 8 දිවීම 19.01.2019, 18.11.2019 සහ 20.12.2019- ඇතුළත් කර ගැනීම 33,34,35,36
- සැතපුම් 10 දිවීම 02.03.2019 - ඇතුළත් කර ගැනීම 33
- වෙරළ පෙළපාලිය 11.08.2019 - ඇතුළත් කර ගැනීම 33,34,35,36
- වාර්ෂික පිහිනුම් උත්සවය 15.02.2019 & 16.02.2019 - ඇතුළත් කර ගැනීම 33
- වසරේ ඉහළම යෝග්‍යතාව සහිත කෙඩෙට් නිලධාරියා සහ දක්ෂතම පිහිනුම්කරු තරඟය 16,17,18,19,20,21 සහ 23.09.2019 - ඇතුළත් කර ගැනීම 33
- සජීව වෙඩි තැබීම 24.08.2019 - ඇතුළත් කර ගැනීම 33
- සජීව වෙඩි තැබීම 09.02.2019 සහ 24.08.2019 - ඇතුළත් කර ගැනීම 34
- සජීව වෙඩි තැබීම 23.06.2019 සහ 29.09.2019 - ඇතුළත් කර ගැනීම 35
- සජීව වෙඩි තැබීම 09,10.03.2019 සහ 14,15.09.2019 - ඇතුළත් කර ගැනීම 36
- වෙහෙසකර පා ගමන 22.06.2019 - ඇතුළත් කර ගැනීම 33,34,35,36

පිරිනමන ලද ගෞරව අසිපත්

2019 වසර සඳහා ගෞරව අසිපත් පිරිනමන ලදී.

4599 2/Lt JAD වීරසිංහ

උපාධි ප්‍රදානෝත්සවයේ රාත්‍රී සාදය

ඇතුළත් කර ගැනීම 32, ඇතුළත් කර ගැනීම 33 උපාධි ප්‍රදානෝත්සවයේ රාත්‍රී සාදය 2019 ජනවාරි 12වන දින ගල්කිස්ස මහ හෝටලයේදී පවත්වන ලදී.

විශේෂ සිදුවීම් / උත්සව / විෂය බාහිර ක්‍රියාකාරකම්

2019 වසර තුළදී පහත ක්‍රියාකාරකම් සංවිධානය කරන ලදී.

- වාර්ෂික පිහිනුම් උත්සවය 2019 පෙබරවාරි 15 සහ 16 දින කොආවි පරිශ්‍රයෙහිදී පවත්වන ලදි.

- වාර්ෂික ක්‍රීඩා උත්සවය 2019 මාර්තු 15 සහ 16 දිනවලදී දියගම මහින්ද රාජපක්ෂ ක්‍රීඩාංගනයේදී පවත්වන ලදි.
- නැසී ගිය ශ්‍රීමත් ජෝන් කොතලාවල මහතාගේ 122 වන ජන්ම සංවත්සර සැමරුම 2019 අප්‍රේල් 04 දින පවත්වන ලදි.
- ඇතුළත් කර ගැනීම 36 හි දෙමාපිය දිනය 2019 අප්‍රේල් 24 දින පවත්වන ලදි.
- අලුත් අවුරුදු උත්සවය 2019 අප්‍රේල් 12 පවත්වන ලදී.
- වෙසක් කූඩු තරඟය 2019 මැයි 18, 19 සහ 20 කොඇවි පරිශ්‍රය තුළදී පවත්වන ලදී.
- 2019 ජූලි 25 දින ජුලයි බෝල් සාදය පවත්වන ලදි.
- අන්තර්ජාතික පර්යේෂණ සම්මන්ත්‍රණය 2019 සැප්තැම්බර් 11 සහ 12 දිනවලදී පවත්වන ලදි.
- කොඇවි විවෘත දිනය 2019 ඔක්තෝබර් 06 දින පවත්වන ලදී.
- ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල මහතාගේ 38 වන අනුස්මරණය වෙනුවෙන් කොඇවි පරිශ්‍රය තුළ 2019 ඔක්තෝබර් 21 සහ 22 දින පරිත්‍රාණ ධර්ම දේශනාව සහ දානය පවත්වන ලදී.
- 2019 වසර තුළදී සෑම මසකම පෝය දින "ධර්ම දේශනා" පවත්වන ලදී.

<u>වාර්ෂික ක්‍රීඩා උත්සවය - 2019</u>

සියලු කෙඩෙට් නිලධාරීන් හා දෛනික සිසුන් ක්‍රීඩා කටයුතුවල වැඩි වශයෙන් සහභාගී වීම තහවුරු කිරීම පිණිස 15.03.2019 සහ 16.03.2019 යන දිනවල සාර්ථකව වාර්ෂික ක්‍රීඩා උත්සවය පවත්වන ලදී. සියලු කෙඩෙට් නිලධාරීන් හා දෛනික සිසුන් ගැමුණු, ගජබා, පැරකුම්, විජයබා, මහසෙන් සහ වළගම්බා නමැති නිවාස හයකට කණ්ඩායම්ගත කර මෙම නිවාස හය අතර මලල ක්‍රීඩා උත්සවයකින් අවසන් තරඟය පවත්වන ලදී. ජයග්‍රාහී නිවාසය හා ලකුණු පහත සඳහන් පරිදි වේ

- ගැමුණු - ලකුණු 415
- ගජබා - ලකුණු 316
- මහසෙන් - ලකුණු 194
- විජයබා - ලකුණු 176
- පැරකුම් - ලකුණු 157
- වළගම්බා - ලකුණු 112

<u>ක්‍රීඩා ජයග්‍රහණ</u>

සේවා ජීවිතය සඳහා කායික හා මානසික යෝග්‍යතාව, ශාරීරික ශක්තිය හා හැකියාව තිබීමේ වැදගත්කම සලකා බැලීමෙන් පසුව, පසුගිය වසරවල පැවැත්වූ ආකාරයෙන් සියලු කෙඩෙට් නිලධාරීන් ක්‍රීඩා සහ සරඹ කටයුතුවලට අඛණ්ඩව සහභාගී වීමට දිරිමත් කරන ලදී. විශ්වවිද්‍යාලය තුළ සිටින කාලයේ දී අවම වශයෙන් එක් කණ්ඩායම් ක්‍රීඩාවකට ක්‍රියාකාරී ලෙස සහභාගී වීම කෙඩෙට් නිලධාරීන්ට අනිවාර්ය කරන ලදී. කෙඩෙට් නිලධාරීන් හා දෛනික සිසුන් පහත ක්‍රීඩා සඳහා ක්‍රියාකාරිව සහභාගී වීමට දිරිමත් කරන ලද අතර ඒ සඳහා අවශ්‍ය සියලු පහසුකම් සපයන ලදී.

ඉහත ක්‍රීඩා සංවිධානය කිරීම ක්‍රීඩා නිලධාරියාගේ වගකීම විය. කෙඩෙට් නිලධාරීන් හා දෛනික සිසුන් අනෙක් විශ්වවිද්‍යාල හා බාහිර ආයතන වෙත නිරාවරණය කිරීමට හා ඒවා සමඟ සමීප සම්බන්ධයක් ඇති කිරීමට අනෙකුත් විශ්වවිද්‍යාල හා ක්‍රීඩා සමාජවලට එරෙහිව තරඟ පවත්වන ලදී. 2019 වර්ෂය තුළ ක්‍රීඩා ජයග්‍රහණ පහත දක්වා ඇති පරිදි වේ:

" කොඇවි වර්ණ " ලාභීන් ගණන :-

කොඇවි මට්ටමේ දක්ෂතාව	-	143
ජාතික මට්ටමේ දක්ෂතාව	-	15
අන්තර්ජාතික මට්ටමේ දක්ෂතාව	-	01

2.1.3 වෛද්‍ය පීඨය

හැඳින්වීම

2009 දී පිහිටුවන ලද කොඅාවි හි වෛද්‍ය පීඨය ශී ලංකාවේ වෛද්‍ය අධ්‍යාපන ක්ෂේත්‍රයේ ප්‍රමුඛස්ථානයක් ගනී. පීඨය විසින් පිරිනමනු ලබන MBBS උපාධි වැඩසටහන මිලිටරි වෛද්‍ය කෙඩෙට් නිලධාරීන් සඳහා මෙන්ම විදේශීය සිවිල් වෛද්‍ය සිසුන් සඳහා ගාස්තු අය කිරීමේ පදනම මත ලබා ගත හැකිය. පීඨයට ප්‍රධාන අධ්‍යනාංශ හතරක් ඇත; පූර්ව සායනික විද්‍යා අධ්‍යනාංශය, සම සායනික විද්‍යා අධ්‍යනාංශය, සායනික විද්‍යා අධ්‍යනාංශය සහ වෛද්‍ය අධ්‍යාපන අධ්‍යනාංශයයි. කොඅාවි හි වෛද්‍ය පීඨය කොළඹ පශ්චාත් උපාධි වෛද්‍ය ආයතනය විසින් පශ්චාත් උපාධි පුහුණු ආයතනයක් ලෙස පිළිගැනේ. MBBS උපාධි වැඩසටහන රටේ පළපුරුදු අධ්‍යයන හා වෛද්‍ය වෘත්තිකයන් විසින් පවත්වනු ලැබේ.

නව ව්‍යාපෘති

ව්‍යාපෘති පිළිබඳ විස්තර / අධීක්ෂණය

අනු අංකය	කාර්ය මණ්ඩල සාමාජිකයාගේ නම	පර්යේෂණ ව්‍යාපෘතියේ නම
01	මහාචාර්ය ඩබ්ලියූ. අභයවික්‍රම	අරමුදල් ලබා ගනු පිණිස ජාතික විද්‍යා පදනම (NSF) කරා වූ මාර්ග ඔස්සේ පර්යේෂණ ප්‍රදානයක් සඳහා යෝජනාවක් ඉදිරිපත් කරන ලදී.
02	ජ්‍යෙෂ්ඨ මහාචාර්ය නන්දනී ද සිල්වා	ජෙනරල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලීය රෝහලේ (UHKDU) පවුල් වෛද්‍ය සායනික හමුවේදී ප්‍රතිපෝෂණය උදෙසා ශිෂ්‍ය–රෝගී-පුද්ගල අන්තර්-ක්‍රියාකාරිත්වයන් පටිගත කිරීම සඳහා විඩියෝ කැමරාවක් හා දුරස්ථ-පාලක පටිගත කිරීමේ පද්ධතියක් සහිතව සන්නිවේදන කුසලතා පුහුණු විද්‍යාගාරය (CSTL) එම සායනය තුළ පිහිටුවන ලදී. මෙය පී.පී.ඩී. වැඩසටහන යටතේ වෛද්‍ය ශිෂ්‍ය-ශිෂ්‍යාවන්ගේ සන්නිවේදන කුසලතා පුහුණුව සඳහා ද භාවිතා කෙරෙනු ඇත.
03	මහාචාර්ය සී.එල්. ගුණසේකර	අ. ව්‍යාපෘතිය - ට්‍රැගියා ඉන්වොල්ක්‍රාටා එල්. විශේෂයේ රසායනික විභේදන සහ අධිමධුරක්තික පර්යේෂණ භාජිතයින් (*hyperglycaemic subjects*) මත ඵලය හඳුනා ගැනීම. (2014 විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා පර්යේෂණ ප්‍රදානයන්හි අරමුදල් සම්පාදනයෙනි.) මහාචාර්ය සී.එල්. ගුණසේකර – සම-අධීක්ෂක, පී.එච්.ඩී. උපාධි ශිෂ්‍ය - ආචාර්ය මුම්ටාස් ෂිෆා පල්ලි – 2014 සිට ක්‍රියාත්මක ය. ආ. ව්‍යාපෘතිය – ජැපනීස් එන්සෙෆලයිටිස් වයිරසය (JEV) කෙරෙහි පෙර ප්‍රතිශක්තිය ඩෙංගු රෝගයේ තීව්‍රතාව මත ඇති ඵලය. (2015 ජාතික විද්‍යා පදනමේ පර්යේෂණ ප්‍රදානයන්හි අරමුදල් සම්පාදනයෙනි.) මහාචාර්ය සී.එල්. ගුණසේකර – ප්‍රධාන අධීක්ෂක, එම්.ෆිල්. උපාධි ශිෂ්‍ය - ප්‍රදීප් දර්ශන මහතා – 2014 සිට ක්‍රියාත්මක ය. ඇ. ව්‍යාපෘතිය – ජානමය ද්‍රව්‍ය සෙවීම සඳහා නවමු ක්‍රමයක් ස්ථාපනය කිරීම: ඩෙංගු වයිරසය හා ක්ලැමයිඩියා ට්‍රැකෝමැටිස් සඳහා පුඩු මාධ්‍යගත සමෝෂ්ණ විස්තාරණ මැනුම් (Loop-Mediated Isothermal Amplification {LAMP} assays). ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලීය පර්යේෂණ ප්‍රදාන මහාචාර්ය සී.එල්. ගුණසේකර – සම-අධීක්ෂක, එම්.ෆිල්. උපාධි ශිෂ්‍ය - හේමාලි අත්තනායක මිය – 2017 සිට ක්‍රියාත්මක ය.

		ඈ. ව්‍යාපෘතිය – ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික වෙදකමේදී භාවිත කෙරෙන තෝරා ගත් ශාක ගණනාවක ඩෙංගු වයිරස් ප්‍රතිවිරෝධී ක්‍රියාකාරිත්වය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලීය පර්යේෂණ ප්‍රදානය මහාචාර්ය සී.එල්. ගුණසේකර – සම-අධීක්ෂක, එම්.ෆිල්. උපාධි ශිෂ්‍ය - කලණි පෙරේරා මිය – 2017 සිට ක්‍රියාත්මක ය.
04	බ්‍රිගේඩියර් (වෛද්‍ය) පී.ටී.ආර්. මකුලොළුව	ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලීය උපාධි අධ්‍යයන පීඨයෙහි ලියාපදිංචි වී, එම්.ෆිල්. උපාධි අධ්‍යයනය 2019 ජූලි මාසයේදී පී.එච්.ඩී. උපාධි අධ්‍යයනය බවට උසස් කරන ලදී. අධ්‍යයනයේ නාමය: පිළිකා වේදනාව පිළිබඳ සාකල්‍ය තක්සේරුව: පිළිකා වේදනාව සහිත රෝගීන් අතරේ පසු වේදනා 04 අනුවර්තනයේ තක්සේරු දිනපොතක් සංවර්ධනය කිරීම හා වලංගු කිරීම.
05	වෛද්‍ය එම්.පී.ඒ.බී. අබේසිංහ	ජෙනරල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලීය රෝහලේ (UHKDU) අධිකරණ වෛද්‍ය කටයුතු කොළඹ දකුණ ශික්ෂණ රෝහලේ අධිකරණ වෛද්‍ය නිලධාරිවරයා වෙත තාවකාලික භාර දෙනු පිණිස වූ අවසරය ලබා ගනු පිණිස සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජෙනරාල්වරයා සහ කොළඹ දකුණ ශික්ෂණ රෝහලේ අධිකරණ වෛද්‍ය නිලධාරි සමග සාකච්ඡා පැවැත්වීය. මෙම වැඩපිළිවෙළ යොදන ලද්දේ නව ශිෂ්‍ය-ශිෂ්‍යාවන් 600 දෙනකු අන්තර්ග්‍රහණය කර ගැනීමෙන් අනතුරුව අධික අධ්‍යයන කාර්යන් නිසා ඇති වූ නොවැළැක්විය හැකි තත්ත්වය හේතුවෙනි. හොරණ මූලික රෝහලෙහි නව අධිකරණ වෛද්‍ය පුහුණුව සඳහා විධිවිධාන සලස්වා පුහුණුව අධීක්ෂණයෙහි නිරත විය.
06	වෛද්‍ය එච්.එම්.එස්. විද්‍යාතිලක	අ. ජෙනරල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලීය රෝහලේ (UHKDU) රක්තවේද පරීක්ෂණාගාරයට අතිරේක වැඩ මෙස ඉඩ එක් කොට, වෛද්‍ය පරීක්ෂණාගාර තාක්ෂණිකඥයින් සිව්දෙනා පුහුණු කොට, ඒ සඳහා අදාළ ලියැවිලි පිළියෙළ කර ඇත. ආ. පරීක්ෂණාගාරය තුළ සිදුකෙරෙන එක් එක් පරීක්ෂාවක් සඳහා සම්මත මෙහෙයුම් කාර්යපටිපාටි (SOP) පිළියෙළ කර ඇත. නව පරීක්ෂාවන්—අස්ථි මිදුලු යකඩ කලංක, ජාලිකාසෛලික සංඛ්‍යාංකනය (Bonemarrow Iron stain, Reticulocyte count)—2019 ඔක්තෝබර් මස සිට ආරම්භ කරන ලදී. ඇ. රෝහල් සේවකයින් හා ආරක්ෂක හමුදා සාමාජිකයින් වෙතින් සාමාන්‍ය රාශිගත ප්ලාස්මා (Pool Normal plasma) පිළියෙළ කිරීම—2019.03.05 දින—සහ පරිත්‍යාගීන් සඳහා නොමිලේ එච්.බී.සී. (පූර්ණ රුධිර පරීක්ෂා), පී.ටී. (ප්‍රෝත්‍රොම්බින් කාල) හා ඒ.පී.ටී.ටී. (සක්‍රීය කරන ලද පාර්ශ්වික ප්‍රෝත්‍රොම්බින් පරීක්ෂා) වාර්තා සහ ආර්ථික අපහසුතා ඇති අය සඳහා උපදෙස් ලබා දීම.
07	මේජර් (වෛද්‍ය) ඩබ්ලියූ.එම්.එම්.එස්. බණ්ඩාර	ව්‍යාපෘතිය – රක්තවේදය තුළ ජෛව-සලකුණු සොයාගැනීම (Biomarker Discovery in Haematology) – මිංඡාසෛට-දූර්විකාර්ය සහලක්ෂණය (MDS—Myelodysplastic Syndrome) ප්‍රදාන අංක ආර්.පී.එච්.එස්./2016/සි.04 – ජාතික විද්‍යා පදනම—සෞඛ්‍ය විද්‍යාව පිළිබඳ පර්යේෂණ වැඩසටහන 2016/2017

		සම-විමර්ශකයෝ – වෛද්‍ය ඩබ්ලියු.එම්.එම්.එස්. බණ්ඩාර සහ වෛද්‍ය ඒ.ජේ.අයි.එස්. රත්නායක
08	වෛද්‍ය කේ.එස්.ආර්. පුෂ්පකුමාර	අ. ජෙනරල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලීය රෝහලේ (UHKDU) ස්නායු-ශල්‍ය වෛද්‍ය අංශයේ සංවර්ධනය උදෙසා තවදුරටත් කටයුතු කරමින් වෙනත් අංශයන්හි ප්‍රගතියට උරදීම. ආ. පත්වීමේ දින සිටම වෛද්‍ය පුෂ්පකුමාර ශල්‍යාගාරය සඳහා ස්නායු-ශල්‍ය වෛද්‍ය උපකරණ හා යන්ත්‍ර ප්‍රසම්පාදනය වේගවත් කරනු පිණිස වෙහෙසී කටයුතු කර ඇත.
09	වෛද්‍ය ටී.අයි. විතානවසම්	ශ්‍රී ලංකා ජාතික රුධිර පාරවිලයන සේවය (NBTS) හා ඒකාබද්ධ ජෙනරල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලීය රෝහල් (UHKDU) රුධිර බැංකුව සංස්ථාගත කිරීම සහ කොළඹ පර්ෂදයේ රෝහල් රුධිර බැංකුවක් ලෙස ක්‍රියාත්මක වීම.
10	වෛද්‍ය ටී.වී. සංජීවනී	ශ්‍රී ලංකාවේ සලප මුඛදාහය (aphthous stomatitis) යලි යලිත් ඇතිවන රෝගීන් තුළ විටමින් ‘ඩී’(25-Hydroxy) මට්ටම්.
11	වෛද්‍ය ඒ.ජේ.අයි.එස්. රත්නායක	ව්‍යාපෘතිය – මයලෝඩිස්ප්ලාස්ටික් සහලක්ෂණයේ රක්තවේදය තුළ ජෛව-සලකුණුකාරක ප්‍රදාන අංක ආර්.පී.එච්.එස්./2016/සී.04 – ජාතික විද්‍යා පදනම – සෞඛ්‍ය විද්‍යා පර්යේෂණ වැඩසටහන – 2016/2017 සම-විමර්ශකයෝ – වෛද්‍ය ඩබ්ලියු.එම්.එම්.එස්. බණ්ඩාර සහ වෛද්‍ය ඒ.ජේ.අයි.එස්. රත්නායක
12	වෛද්‍ය වයි.එස්.එච්.ටී.ඩී. සිල්වා	ව්‍යාපෘතිය – ඩෙංගු ආසාදනයේදී වාහිනීය (vascular) කාන්දුව ඇති කිරීමෙහිලා ප්‍රදාහ-කාරක එන්සයිම, ලිපිඩ මධ්‍යකාරක (lipid mediators), සයිටෝකීන, ලියුකෝට්‍රීන සහ හිස්ටමින සිදුකරන කාර්යභාරය විමර්ශනය කිරීම පී.එච්.ඩී. උපාධි ශිෂ්‍ය වෛද්‍ය වයි.එස්.එච්.ටී.ඩී. සිල්වා (මෙම පර්යේෂණය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේදී සිදුකෙරේ.)

<u>පුහුණු කටයුතුවලට සම්බන්ධ වීම / ජයග්‍රහණ / ප්‍රකාශන</u>

<u>පූර්ව සායනික විද්‍යා අධ්‍යනාංශය</u>

මහාචාර්ය සී.එල්. ගුණසේකර

<u>ප්‍රකාශන</u>

- කුරුප්පු ඒ.අයි., පරණගම පී. ගුණසේකර සී.එල්. (2019) ශ්‍රී ලංකාවේ පාරම්පරික ඖෂධ වට්ටෝරු තුළ පිළිකාවට එරෙහිව සුලභව භාවිත කෙරෙන ඖෂධීය ශාක ජේ. 27: 565–573.

<u>සමුළු තුළ ප්‍රකාශන</u>

- නාදුගල එම්.එන්., ප්‍රේමරත්න පී.එච්., ගුණසේකර සී.එල් (2019) පැර-නයිට්‍රෝ ෆෙනිලැලනයින් සමගින්විකරණය කරන ලද ඩෙංගු ඊ-ප්‍රෝටීන් පෙප්ටයිඩවල ප්‍රතිශක්තිජනනතාව (Immunogenicity). 27 වන ආසියානු හා ඕසියානියානු ජෛව-රසායනඥ හා අණුක ජීවවිද්‍යාඥ සම්මේලනය (FAOBMB) හා 44 වන මැලේසියානු ජෛවරසායන විද්‍යා හා අණුක ජීව විද්‍යා සමාජ සමුළුව (MSBMB), ක්වාල ලම්පූර්, මැලේසියාව.

<u>ජයග්‍රහණ</u>

- මහාචාර්ය සී.එල්. ගුණසේකර 2017 වර්ෂය තුළ සම්පූර්ණ කරන ලද ‘‘ඩෙංගුවලට එරෙහිව පුළුල් ලෙස ප්‍රතික්‍රියාකාරී උදාසීනකාරක ප්‍රතිශක්ති ප්‍රතිචාරයක් සහිත එන්නත් අපේක්ෂිතයක් සංවර්ධනය කිරීම’’ නමැති ව්‍යාපෘතිය තුළ සිදුකරන ලද පර්යේෂණ කටයුතු සඳහා ජෛවතාක්ෂණවේද ප්‍රභේදය යටතේ ජාතික විද්‍යා පදනම් පර්යේෂණ ප්‍රදානය දිනා ගෙන ඇත.

මහාචාර්ය ඒ.එල්.එස්. මෙණ්ඩිස්

පුහුණු කටයුතුවලට සම්බන්ධ වීම:

- විද්වත් සමුළු කීපයකදී ප්‍රධාන අමුත්තා හා ප්‍රධාන දේශකයා වශයෙන් ඇරයුම් ලැබීය.
- ශ්‍රී ලංකා නිර්වින්දන හා දැඩි සත්කාර විශේෂඥ වෛද්‍යවරුන්ගේ විද්‍යාලය – වේදනා වෛද්‍ය පීඨය (Faculty of Pain Medicine)
- විශ්වවිද්‍යාලයීය පුස්තකාලයාධිපතිවරුන්ගේ ජාත්‍යන්තර සමුළුව - ශ්‍රී ලංකාව

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය - ටී.ආර්. වීරසූරිය

පුහුණු කටයුතුවලට සම්බන්ධ වීම:

- "ඇක්ටායියා රැසිමෝසස් (A. racemoses) ශාකයේ පුරුෂ වන්ධ්‍යභාවය මත ඵලය" නමැති ව්‍යාපෘතියේ පී.එච්.ඩී. උපාධි අධීක්ෂණය

ප්‍රකාශන

සුවිගත ජර්නල තුළ ප්‍රකාශන

- වයි.ඒ.යූ.ඩී. කරුණාරත්න, එල්.ඩී.ඒ.එම්. ඇරැව්වල, ඒ.පී.ජී. අමරසිංහ, ටී.ආර්. වීරසූරිය, යූ.කේ.ඒ. සමරසිංහ; (2019) (2019) ශ්‍රී ලංකා සම්භවය සහිත (කැලෑවට වැවෙන) ඇස්පැරගස් රැසිමෝසස් මූලෙහි කුඩුවල භෞත-රසායනික, ශාක-රසායනික හා පෝෂණවේදාත්මක වින්‍යාස (profiles), භිෂග්-ඥානනය (Pharmacognosy) පිළිබඳ ශ්‍රී ලංකා ජර්නලය 3 (3)

උධෘත ප්‍රකාශනය

- කරුණාරත්න වයි.ඒ.යූ.ඩී., සමරසිංහ යූ.කේ.ඒ., අමරසිංහ ඒ.පී.ජී., වීරසූරිය ටී.ආර්., ඇරැව්වල එල්.ඩී.ඒ.එම්., ; (2017) ශ්‍රී ලංකා සම්භවය සහිත (කැලෑවට වැවෙන) ඇස්පැරගස් රැසිමෝසස්: මූලෙහි කුඩුවල භෞත-රසායනික, ශාක-රසායනික හා පෝෂණවේදාත්මක වින්‍යාස (profiles), ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමය, 2017 දෙසැම්බර් 6 වන දින
- කරුණාරත්න වයි.ඒ.යූ.ඩී., සමරසිංහ යූ.කේ.ඒ., අමරසිංහ ඒ.පී.ජී., වීරසූරිය ටී.ආර්., ඇරැව්වල එල්.ඩී.ඒ.එම්., ; (2017) ශ්‍රී ලංකා හා ඉන්දීය සම්භවය සහිත (කැලෑවට වැවෙන) ඇස්පැරගස් රැසිමෝසස් දෙවර්ගය ඒවායේ මූල්වල භෞත-රසායනික, ශාක-රසායනික හා පෝෂණවේදාත්මක වින්‍යාස (profiles) සම්බන්ධයෙන් සන්සන්දනය, උපාධි අධ්‍යයන පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය, 2017 නොවැම්බර්

වෛද්‍ය කේ.එම්.එන්. කුමාරසිංහ

පුහුණු කටයුතුවලට සම්බන්ධ වීම:

- 2019 ජූනි මාසය තුළ පනාගොඩ යුධහමුදා ක්‍රීඩා ගම්මානයේ ක්‍රීඩා සම්බාහන ශිෂ්‍ය-ශිෂ්‍යාවන් 30 දෙනකු සඳහා එක් දින කායව්‍යවච්ඡේද දේශන කාර්ය දර්ශනයක් සම්බන්ධීකරණය කිරීම
- හේතුකාරක නොදත් නිදන්ගත වකුගඩු රෝග උපස්ථාන ව්‍යාපෘතියේ (CKDu CARE project) හා අංක 1 ජෛව-වෛද්‍ය පර්යේෂණාගාරයේ (BML1) ඇති පහසුකම් උපයෝගී කරගනිමින් 'ව්‍යවහාරික අධ්‍යයනය පිළිබඳ බ්‍රිතාන්‍ය විද්‍යාලයේ (BCAS)' ශිෂ්‍ය-ශිෂ්‍යාවන් 4 දෙනකු සඳහා පර්යේෂණ ක්‍රමවේද සහ පරීක්ෂණාගාර පුහුණුව ලබා දීම (සාර්ථකව සම්පූර්ණ කරන ලදී.)
- බටලන්ද ආරක්ෂක සේවා ආඥා හා මාණ්ඩලික විද්‍යාලයේ එක් එම්.එස්.සී. උපාධි ශිෂ්‍යයකු අධීක්ෂණය (සාර්ථකව සම්පූර්ණ කරන ලදී). ජෙනරල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ ලියාපදිංචි ශිෂ්‍ය-ශිෂ්‍යාවන් දෙදෙනකු අධීක්ෂණය (සිදුකෙරෙමින් පවතී).

ප්‍රකාශන

- ප්‍රනාන්දු එච්.එන්., විමලදාස අයි.ටී.පී., සත්කෝරළගේ ඒ.එන්., ආරියදාස ඒ.එන්., උදේනි සී., ගල්ගමුව එල්.එස්., හේරත් පී. සහ කුමාරසිංහ එන්., 2019. ශ්‍රී ලංකාවේ වැඩිහිටි පිරිමින් අතර දුම්බීම ආශ්‍රිත සමාජ-ආර්ථික සාධක. ජෛව-වෛද්‍ය කේන්ද්‍ර මහජන සෞඛ්‍ය සඟරාව (BMC Public Health), 19 (1), 778 පිටුව. https://bmcpublichealth.biomedcentral.com/articles/10.1186/s12889-019-7147-9#citeas
- කුමාරසිංහ එන්., සූරියකුමාර වී., අස්ලම් එෆ්., හක්මනගේ එන්.එම්. සහ ගල්ගමුව එල්., 2019. ශ්‍රී ලංකාවේ උතුරුමැද පළාතේ කැබිතිගොල්ලෑව තුළ හේතුකාරක නොදත් නිදන්ගත වකුගඩු රෝග ඇති බවට විනිශ්චිත රෝගීන් සඳහා ශ්‍රී ලංකාවේ පාරම්පරික වෛද්‍ය ප්‍රතිකාර පිළිබඳ පසු විපරම් අධ්‍යයනය. වකුගඩු ජර්නලය, 5 (175), 2 පිටුව. https://www.longdom.org/open-access/follow-up-study-on-sri-lankan-traditional-medicine-treatment-on-diagnosed-chronic-kidney-disease-of-unknown-etiology-pat.pdf

- ධර්මදේව එස්., ගල්ගමුව එල්.එස්., ප්‍රසාදිනී සී., කුමාරසිංහ එන්. ඇල්බියුමින් නිස්ස්වාභාවීකරණ (albumin denaturation) ක්‍රමය භාවිතයෙන් ෆිකස් රැසිමෝසා එල්. පොත්තෙහි නල තුළ ඉදිමුම් මර්ධන (In vitro anti-inflammatory) ක්‍රියාකාරිත්වය පිරික්සීම. අයු 2018; 39: 239-42 http://www.ayujournal.org/article.asp?issn=0974-8520;year=2018;volume=39;issue=4;spage=239;epage=242;aulast=Dharmadeva
- අස්ලම් එෆ්., හක්මනගේ එන්., සූරියකුමාර වී. සඳරුවන් එල්. සහ කුමාරසිංහ එන්. (2019). ශ්‍රී ලංකාවේ උතුරු මැද පළාතේ හේතුකාරක නොදත් නිදන්ගත වකුගඩු රෝගීන් (CKDu patients) තුළ සීරම් ක්‍රියැටිනීන් (serum creatinine) සහ තුනටියේ වේදනාව ආශ්‍රිත ජීවන තත්ත්වය අතර සම්බන්ධය. ශුද්ධ හා ව්‍යවහාරික විද්‍යා පිළිබඳ ජාත්‍යන්තර පර්යේෂණ විද්වත් සමුළුව (IRSPAS), 1 (4), 165 පිටුව.

මේජර් වෛද්‍ය ඩබ්ලියු.එම්.එම්.එස්. බණ්ඩාර

<u>ප්‍රකාශන:</u>

- **ඩබ්ලියු.එම්.එම්.එස්. බණ්ඩාර** සහ **ඒ.ජේ.අයි.එස්. රත්නායක**, උදෑසන සමග සන්ධ්‍යා ව්‍යායාම සන්සන්දනය: වඩා යහපත් ප්‍රතිඵලයක් ලබා දෙන්නේ කුමක්ද? (2019) හදිසි වෛද්‍ය කර්මය සහ බැරෑරුම් සත්කාරය (Emergency Medicine and Critical Care), 3 (9): 601–609

<u>සමුළු තුළ ප්‍රකාශන</u>

- බණ්ඩාර එම්.එස්., රත්නායක අයි., නෙත්තිකුමාර එන්., ගුණසේකර එච්., දිසානායක වී. (2019), නව මිංඟාදුනම්‍ය ස්වේතරක්ත සහලක්ෂණයන් (de novo Myelodysplastic Syndromes) තුළ රක්තාණුකරණික (Hematopoietic) හා මෙසෙන්කයිමල් ස්ටෙම් ශෛල (Mesenchymal Stem Cells) ජානමය ප්‍රභේද. වෛද්‍ය පිලිකාවේදය (Oncology) පිළිබඳ යුරෝපීය සංගමයේ සම්මේලනය, නොවැම්බර් 22–24 දිනයන්හි සිංගප්පූරුවේදී.

වෛද්‍ය ඒ.ජේ.අයි.එස්. රත්නායක

<u>පුහුණු කටයුතුවලට සම්බන්ධ වීම:</u>

- 2019 වර්ෂයේ ‘ගෝලීය සෞඛ්‍ය පුහුණු කේන්ද්‍රය’ විසින් මෙහෙයවන ලද “පර්යේෂණ ආචාරධර්ම” මාර්ගගත (online) පාඨමාලාව සමත් විය.
- 2019 වර්ෂයේ ‘ගෝලීය සෞඛ්‍ය පුහුණු කේන්ද්‍රය විසින් මෙහෙයවන ලද “වසංගත, හදිසි තත්ත්ව හා ව්‍යසන තුළ ආචාර ධර්ම: පර්යේෂණය, ආවේක්ෂණය හා රෝගී උපස්ථානය” ආචාරධර්ම” මාර්ගගත (online) පාඨමාලාව සමත් විය.

වෛද්‍ය එල්.එස්. කත්ත්‍රිආරච්චි

<u>පුහුණු කටයුතුවලට සම්බන්ධ වීම:</u>

- ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පීඨයේ දර්ශනවාද අධ්‍යයනාංශයේ පර්යේෂණ පරීක්ෂණාගාරයේදී “ශ්‍රී ලංකාවේ කොළඹ දිස්ත්‍රික්කය තුළ නව යෞවනයින් අතර ප්‍රජානන ක්‍රියාකාරිත්වයන් හා ඒ ආශ්‍රිත මනෝ-සාමාජීය නිශ්චායක” පිළිබඳ පී.එච්.ඩී. උපාධි පර්යේෂණය තවදුරටත් සිදුකර ඇත.
- ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ උපාධි අධ්‍යයන පීඨයේ පර්යේෂණ ක්‍රමවේදය සහ විද්‍යාත්මක රචනය පිළිබඳ පාඨමාලාවේ සහභාගිකයෙක් විය.
- ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණ පීඨයේ පරිගණක-පාදක දත්ත විශ්ලේෂණය පිළිබඳ පාඨමාලාවක සහභාගිකයෙක් විය.

<u>ප්‍රකාශන</u>

- “ශ්‍රී ලාංකික නව යෞවනයින්ගේ ප්‍රජානනීය ක්‍රියාකාරිත්වයන් මත විඩාවේ (stress) ඵල” නමැති උධෘතයක් හා පූර්ණ පත්‍රිකාව ඕස්ට්‍රේලියාවේ මෙල්බර්න් නුවර මොනෑශ් විශ්වවිද්‍යාලයේ කෝල්ෆිල්ඩ් මණ්ඩපයේදී 2019 දෙසැම්බර් 12 වන දින සිට 14 වන දින දක්වා පැවැත්වීමට නියමිත 16 වන ජාත්‍යන්තර ව්‍යාපාරික කළමනාකරණ සමුළුවේදී වාචික ඉදිරිපත් කිරීමක් සඳහා පිළිගනු ලැබ තිබේ.

වෛද්‍ය පී.වී. ලෝගේන්දිරන්

<u>පුහුණු කටයුතුවලට සම්බන්ධ වීම:</u>

- 2019 ජාත්‍යන්තර පර්යේෂණ සමුළුව – වෛද්‍ය විද්‍යා පීඨයේ උධෘත කමිටුවේ සම්බන්ධීකාරක.
- වෛද්‍ය විද්‍යා පීඨයේ භෞතවේද පැන විසඳුම් තරගය – භෞතවේද පැන විසඳුම් කණ්ඩායමේ පුහුණුකරු.

- වෛද්‍ය විද්‍යා පීඨාන්තර අධිරුධිර පීඩන පැන විසඳුම් තරගය – අධිරුධිර පීඩන කණ්ඩායමේ පුහුණුකරු.
- ජෙනරල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලීය වෛද්‍ය විද්‍යා පීඨයේ සායනික කුසලතා පරීක්ෂණාගාරයේ නියෝජ්‍ය කාර්ය භාර නිලධාරී.
- ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාලීය වෛද්‍ය විද්‍යා අංශයේ න්‍යූෆීල්ඩ් කාන්තා හා ප්‍රජනන සෞඛ්‍ය අධ්‍යයනාංශයේ ඩී.ෆිල්. (ජී.එච්.ඩී.) තනතුරක් ලැබීය.
- අධ්‍යයන නිවාඩු ලැබ 2019 ඔක්තෝබර් 1 වන දින සිට ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාලයෙහි ඩී.ෆිල්. උපාධිය සඳහා හදාරමින් සිටියි.
- ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාලීය න්‍යූෆීල්ඩ් කාන්තා හා ප්‍රජනන සෞඛ්‍ය අධ්‍යයනාංශයේ ශිෂ්‍ය කමිටුවේ ලේකම් තනතුරට තෝරා පත් කර ගනු ලැබ සිටී.
- ඔක්ස්ෆර්ඩ් සංගමයේ යාවජීව සාමාජිකත්වය ලබා ඇත.

වෛද්‍ය අයි.යූ. විමලසිරි

<u>පුහුණු කටයුතුවලට සම්බන්ධ වීම:</u>

- කොළඹ විශ්වවිද්‍යාලීය පශ්චාත් උපාධි වෛද්‍ය ආයතනයේ එම්.ඩී. (මනෝචිකිත්සා) උපාධි වැඩසටහන තුළ පුහුණුව අඛණ්ඩව සිදු කළේය.
- 2019 ජූනි මාසයේදී කොළඹ විශ්වවිද්‍යාලීය පශ්චාත් උපාධි වෛද්‍ය ආයතනයේ වෛද්‍ය අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි සහතිකය සාර්ථකව සම්පූර්ණ කළේය.
- ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ආචාර ධර්ම කමිටුවේ සාමාජික (2018 අප්‍රේල්–2020 අප්‍රේල්)

<u>ප්‍රකාශන</u>

- විමලරත්න අයි.යූ., ගෝවින්නගේ ජේ.සී., මොහමඩ් එම්.එන්.එන්., විලියම් එස්.එස්.. වෙන් වීම එතරම් මිහිරි ශෝකයක් වන විට: සම්පත් පොදි ගැහීමේ මානසික අක්‍රමිකතාව (hoarding disorder) පිළිබඳ සිද්ධි වාර්තාවක්. පෝස්ටර් ඉදිරිපත් කිරීම – සාක් මනෝචිකිත්සක සම්මේලනයේ 11 වන සමුළුව සහ ශ්‍රී ලංකා මනෝචිකිත්සක විද්‍යාලයේ 16 වන වාර්ෂික විද්වත් සැසි, 2019 ඔක්තෝබර්.
- ෆොන්සේකා ටී.පී.එම්., ගුණසේකර පී.ඒ.ටී.එන්.පී., විමලසිරි අයි.යූ., ගෝවින්නගේ ජේ.සී., නෙත්තසිංහ එන්.එම්.පී.ජේ., අමරසිංහ ඩී.කේ., ඕබඩආරච්චි එල්.එන්., විලියම් එස්.එස්.. ශ්‍රී ලංකාවේ වඩා වයස්ගත වැඩිහිටියන් තක්සේරු කරනු පිණිස මොන්ට්‍රියල් ප්‍රජානනීය තක්සේරුව හා ක්ෂුද්‍ර-මානසික තත්ත්ව විභාගය යොදා ගැනීමේ යෝග්‍යතාව. වාචික ඉදිරිපත් කිරීම – සාක් මනෝචිකිත්සක සම්මේලනයේ 11 වන සමුළුව සහ ශ්‍රී ලංකා මනෝචිකිත්සක විද්‍යාලයේ 16 වන වාර්ෂික විද්වත් සැසි, 2019 ඔක්තෝබර්.
- ඉසුරු උපේක්ෂා විමලසිරි, රවිවර්මා රාඹ පානිර්සෙල්වම්, කැමිල් නොයෙල්. ළමා හා නවයෞවන මනෝචිකිත්සාව පිළිබඳ 15 වන ජාත්‍යන්තර පුහුණු සම්මන්ත්‍රණය. ලිපිය – ලෝක මනෝචිකිත්සක සංගමය, ළමා හා නවයෞවන මනෝචිකිත්සක අංශ කාර්යාලයේ ජර්නලය, 16 වන කලාපය, 2016 සැප්තැම්බර්.

<u>සමුළු සහභාගිත්වය</u>

- ළමාකාලය හා නවයෞවන විය පිළිබඳ අධ්‍යයන හා පර්යේෂණ පදනම විසින් සංවිධානය කරන ලද ළමා හා නවයෞවන මනෝචිකිත්සාව පිළිබඳ 15 වන ජාත්‍යන්තර පුහුණු සම්මන්ත්‍රණයේදී ශ්‍රී ලංකාව නියෝජනය කිරීම – 201 9මැයි 12-17, ඉතාලියේ රෝම නුවර.
- සහභාගිත්වය – සාක් මනෝචිකිත්සක සම්මේලනයේ 11 වන සමුළුව සහ ශ්‍රී ලංකා මනෝචිකිත්සක විද්‍යාලයේ 16 වන වාර්ෂික විද්වත් සැසි, 2019 ඔක්තෝබර් 13–15.

වෛද්‍ය වයි.එස්.එච්.ටී.ඩී. සිල්වා

<u>පුහුණු කටයුතුවලට සම්බන්ධ වීම:</u>

- ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ඩෙංගු පර්යේෂණ කේන්ද්‍රය විසින් සංවිධානය කරන ලද ‘‘ආර්.එන්.ඒ. ජෛව-සලකුණුකාරක සෙවීම විප්ලවීකරණය කිරීමේ නවමු ශිල්පක්‍රමයක්’’ පිළිබඳ වැඩමුළුවකට සහභාගි වීම, 2019 අගෝස්තු 2.
- ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ඩෙංගු පර්යේෂණ කේන්ද්‍රය විසින් සංවිධානය කරන ලද ‘‘ශ්‍රී ලංකාවේ ඩෙංගු රෝග විනිශ්චය වැඩිදියුණු කිරීම: පිබිද එන තාක්ෂණයන්’’ පිළිබඳ වැඩමුළුවට සහභාගි වීම, 2019 නොවැම්බර් 27–28.

සමුළු තුළ ප්‍රකාශන

- සිල්වා වයි.එස්.එච්.ටී.ඩී., ගෝමස් එල්., මහාපටුන එස්.ඩී., වික්‍රමතුංග සී.කේ., ජීවන්දර සී., විජේවික්‍රම ඒ., ඔග් ජී., මලවිගේ ජී.එන්. (2019) තදබල ඩෙංගු ආසාදනය සහිත රෝගීන් තුළ රෝගයේ තීව්‍රතාව පිළිබඳ ජෛව-සලකුණුකාරකයක් වශයෙන් මුත්‍ර එල්.ටී.ඊ.4 මට්ටම්. බ්‍රිතාන්‍ය ප්‍රතිශක්තිවේද සමාජය, දෙසැම්බර් 2–5, එක්සත් රාජධානිය.

ඩී.එන්. දහනායක මිය

පුහුණු කටයුතුවලට සම්බන්ධ වීම:

- ජෛව-වෛද්‍ය ඉංජිනේරු පාඨමාලාව, ඉංජිනේරු පීඨය – මානව භෞතවේදය

ඉදිරිපත් කිරීම්

- 2019 නොවැම්බර් මාසයේදී ඉන්දියාවේ කල්කටා නුවර පැවති 49 වන වෛද්‍ය භෞතවේදී ජාත්‍යන්තර සමුළුවේදී "පුරස්ථ ග්‍රන්ථියේ පිළිකාවෙහිදී සමගාමී සමෝධානිත වෘද්ධි තීව්‍රතා-මූර්ඡිත විකිරණ චිකිත්සාවට (SIB-IMRT) සාපේක්ෂව ත්‍රිමාන රසායන-විකිරණ චිකිත්සාව (3-D CRT) පිළිබඳ මාත්‍රා-මානක (Dosimetric) සන්සන්දනාත්මක අධ්‍යයනය" නමැති පෝස්ටරය ඉදිරිපත් කළාය.
- 2019 නොවැම්බර් මාසයේදී කොළඹ විශ්වවිද්‍යාලීය විද්‍යා පීඨයෙහි වාර්ෂික වාර්ෂික පර්යේෂණ විද්වත් සමුළුවේදී " සම්මත තීව්‍රතා-මූර්ඡිත විකිරණ චිකිත්සාවට (IMRT), සමගාමී සමෝධානිත වෘද්ධි තීව්‍රතා-මූර්ඡිත විකිරණ චිකිත්සාවට (SIB-IMRT) හා අණුක්‍රමික තීව්‍රතා-මූර්ඡිත විකිරණ චිකිත්සාවට (sequential IMRT) සාපේක්ෂව ත්‍රිමාන රසායන-විකිරණ චිකිත්සාව (3-D CRT) තුළ ඌර්වීය ශීර්ෂය (femoral head) මත මාත්‍රාවේ සන්සන්දනය" නමැති පත්‍රිකාව ඉදිරිපත් කළාය.
- සහභාගික, විකිරණවේදී විද්‍යාව පිළිබඳ 1 වන ජාතික වැඩමුළුව, යාපනය, ශ්‍රී ලංකාව, 2019 අප්‍රේල්.

පාර-සායනික විද්‍යා අධ්‍යයනාංශය

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය නන්දනී ද සිල්වා

පුහුණු කටයුතුවලට සම්බන්ධ වීම:

- සම-සෞඛ්‍ය විද්‍යා පීඨයේ හෙද-හෙදියන් සඳහා සායනික හමුවීම් කාර්යවිධි (appointment portfolios) සම්බන්ධයෙන් ආචර්ජනාත්මක රචනය පිළිබඳව පුහුණු කිරීම

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එස්.ආර්. ද අල්විස් සෙනෙවිරත්න

පුහුණු කටයුතුවලට සම්බන්ධ වීම:

- පර්යේෂණ හා සංවර්ධන පීඨාධිපති ලෙස සේවය කළාය. තත්කාර්ය මණ්ඩල කීපයක සේවය කළාය.
- ජෙනරල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි වෛද්‍ය ආයතනයෙහි පශ්චාත් උපාධිධාරීන් සහ උපාධි අධ්‍යයන පීඨයෙහි හා සම-සෞඛ්‍ය විද්‍යා පීඨයෙහි උපාධි අපේක්ෂක අපේක්ෂිකාවන් පුහුණු කිරීමෙහි සම්බන්ධව සිටියාය.
- උධෘත 12 ක් ප්‍රකාශයට පත් කළාය. ශ්‍රී ලංකාව සඳහා වූ පර්යේෂණ තන්ත්‍රණ උපායමාර්ගයක හා පර්යේෂණ සඳහා වෘත්තීය කාර්ය සංග්‍රහයක සම-කර්තෘත්වය දැරුවාය.
- කොළඹ විශ්වවිද්‍යාලීය ප්‍රජා වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ප්‍රජා වෛද්‍ය විද්‍යාව පිළිබඳ එම්.ඩී. උපාධි නිබන්ධ දෙකක් අධීක්ෂණය කිරීම සාර්ථකව සම්පූර්ණ කළේය.

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය බී.එම්.ආර්. ප්‍රනාන්දුපුල්ලේ

පුහුණු කටයුතුවලට සම්බන්ධ වීම:

- ප්‍රනාන්දුපුල්ලේ බී.එම්.ආර්., නාලිකා ගුණවර්ධන, ද සිල්වා එස්.එච්.පී., චින්තා අබේවර්ධන සහ එල්.කේ. හිරිමුතුගොඩ. ශ්‍රී ලංකාව තුළ බෝ නොවන රෝග සඳහා ඖෂධ වෙත ප්‍රවිෂ්ටය සම්බන්ධයෙන් රෝගීන්ගේ අත්දැකීම්: විශ්ව ආවරණය කරා වූ සාර්ථකත්වයේ වෘත්තාන්තය සම්බන්ධයෙන් සාක්ෂි. "උපස්ථාන ස්ථානයේදී ඖෂධ වෙත ප්‍රවිෂ්ටය" (Medicine Access @ Point of Care) 1–10, 2019 සැප්තැම්බර්.

සම්මාන

- හිෂග්වේදය පිළිබඳ විශිෂ්ටතම ඉදිරිපත් කිරීම සඳහා වූ ශ්‍රී ලංකා සායනික හිෂග්වේද හා චිකිත්සක සංගමයේ එස්.එල්.ඒ.සී.පී.ටී. (SLACPT) සම්මානය ලැබීය. — ජාත්‍යන්තර වෛද්‍ය සංගමයේ 132 වන සංවත්සරය, 2019 ජූලි.

ප්‍රකාශන

- පත්‍රිකාව සඳහා 'ජාතික පර්යේෂණ සභා (NRC) කුසලතා සම්මානය' — "වර්ධා එෆ්. රිෆායි, නයනි පී. මදාරසිංහ, බුත්සිරි සුමනසේන, සුදත් වීරසිංහ, අමලා ද සිල්වා, රෝහිණි ප්‍රනාන්දුපුල්ලේ, අහේ ආර්. සාතෝකර් සහ නදිරා ඩී. කරුණාවීර, ලෙයිශ්මානියා දොනොවානි (Leishmaniadonovani) පරපෝෂිතයා මගින් ප්‍රේරණය කරන ලද චර්මීය ලෙයිශ්මානියසිස් රෝග ප්‍රතිකාරයේදී තාප-චිකිත්සාවෙහි ගුණය, ආරක්ෂාව හා පිරිවැය කාර්යක්ෂමතාව: සසම්භාවිත පාලිත සායනික අත්හදා බැලීමක්, සර්මකලාපික වෛද්‍ය විද්‍යාව හා ස්වස්ථතාව පිළිබඳ ඇමෙරිකානු ජර්නලය (Am. J. Trop. Med. Hyg.), 97(4, 2017, 1120–1126 පිටු"

මහාචාර්ය ඩබ්ලියු අබේවික්‍රම

පුහුණු කටයුතුවලට සම්බන්ධ වීම:

- බී.සී.ඒ.එස්. උපාධි අපේක්ෂිකාවකගේ බී.එස්.සී. උපාධිය සඳහා පර්යේෂණ ව්‍යාපෘතියක් සිදුකිරීම සඳහා පුහුණු කර ඇත.

ජයග්‍රහණ

- දින සිට ක්‍රියාත්මක වන පරිදි කැලණිය විශ්වවිද්‍යාලයේ සම්මානිත මහාචාර්ය පදවිය පිරිනමනු ලැබීය.

ප්‍රකාශන

ජර්නල ලිපි

- එන්.ඩී.ඒ.ඩී. විජේගුණවර්ධන, ඩබ්ලියු. අබේවික්‍රම, වයි.අයි. නිල්මිණි සිල්වා ගුණවර්ධන, ආර්. එස්. දසනායක, එන්. චන්ද්‍රසේන, එල්. උදයංග. (2019). ඊඩීස් (Aedes) වාහක දර්ශක හා දේශගුණික සාධක ශ්‍රී ලංකාවේ ගම්පහ දිස්ත්‍රික්කයේ ඩෙංගු ව්‍යාප්තිය මත ඇති කරන ඵල ඇගයීම, ජීව-වෛද්‍ය පර්යේෂණ ජාත්‍යන්තර සඟරාව (BioMed Research International). 2019 වෙළුම, ලිපි අංක අයි.ඩී. 2950216, 1–11 පිටු.https://doi.org/10.1155/2019/2950216
- එන්. ගුණතිලක, ටී. රණතුංග, එල්. උදයංග, එන්.ඩී.ඒ.ඩී. විජේගුණවර්ධන, ජේ.ආර්.එල්. ගිල්ස්, ඩබ්ලියු. අබේවික්‍රම. (2019). බීජාණු විරහිත කෘමි ශිල්පක්‍රම හා නොපෑහෙන කෘමි ශිල්පක්‍රම යෙදවුම්/ආලේපන (applications) සඳහා ස්ත්‍රී ඊඩීස් ඊජිප්ටි හා ඊඩීස් ඇල්බොපික්ටස් තුරන් කිරීමේ යාන්ත්‍රික හා චර්යාත්මක ක්‍රම භාවිතය. පරපෝෂිතයෝ හා වාහකයෝ (Parasites & Vectors). 12(1), ලිපි අංක 148. doi.org/10.1186/s13071-019-3398-7.
- එන්.ඩී.ඒ.ඩී. විජේගුණවර්ධන, වයි.අයි.එන්. සිල්වා ගුණවර්ධන, ඩබ්ලියු. අබේවික්‍රම, ටී.ජී.ඒ.එන්. චන්ද්‍රසේන, ආර්.එස්. දසනායක, ෂියොං ක්සයි, කේ. බුවර්ට්සිස්. පර්යේෂණ සඳහා ඊඩීස් ඇල්බොපික්ටස් මදුරු පරීක්ෂණාගාර ජනපද පිහිටුවීම හා පවත්වා ගෙන යාම සඳහා නිසි මාර්ගෝපදේශ. ව්‍යවහාරික කෘමි විද්‍යා ජර්නලය (Journal of Applied Entomology) වෙත ඉදිරිපත් කරන ලදී. (අත්පිටපත් අංක JEN-2019-0054)
- රධිකා එන්.එම්.එල්., ගුණතිලක එන්. උදයංග එල්., කස්තුරිරත්න ඒ., අබේවික්‍රම ඩබ්ලියු. (2019) ශ්‍රී ලංකාවේ ගම්පහ දිස්ත්‍රික්කය තුළ පාසල් ළමුන් අතර ඩෙංගු රෝගය පිළිබඳ දැනුවත්භාවයේ මට්ටම සහ පොදුවේ දැනුම හා පිළිවෙත් දියුණු කිරීම මත පාසල්-පාදක සෞඛ්‍ය අධ්‍යාපන වැඩසටහන්වල ඵලය. ජීව-වෛද්‍ය පර්යේෂණ ජාත්‍යන්තර සඟරාව (BioMed Research International) ලිපි හැඳුනුම් කේතය 3092073, පිටු 8යි. https://doi.org/10.1155/2019/3092073
- ගුණතිලක, එන්., රණතුංග, ටී., උදයංග, එල්., විජේගුණවර්ධන, ඒ., ගිල්ස්, ජේ.ආර්.එල්., සහ අබයවික්‍රම, ඩබ්ලියු. (2019). බීජාණු විරහිත කෘමි ශිල්පක්‍රම හා නොපෑහෙන කෘමි ශිල්පක්‍රම යෙදවුම්/ආලේපන (applications) සඳහා ස්ත්‍රී ඊඩීස් ඊජිප්ටි හා ඊඩීස් ඇල්බොපික්ටස් තුරන් කිරීමේ යාන්ත්‍රික හා චර්යාත්මක ක්‍රම භාවිතය. පරපෝෂිකයෝ හා වාහකයෝ (Parasites & Vectors). 12(1), 148. doi.org/10.1186/s13071-019-3398-7
- ගුණතිලක, එන්., හපුගොඩ, එම්., වික්‍රමසිංහ, ආර්., සහ අබයවික්‍රම, ඩබ්ලියු. (2019) ශ්‍රී ලංකාවේ මන්නාරම දිස්ත්‍රික්කය තුළ විභව්‍ය මැලේරියා වාහකයින්ගේ බහුලතාව, බෙදී යාම හා ජෛව-පරිසරවේදය පිළිබඳ විස්තීර්ණ විශ්ලේෂණයක්. මැලේරියා පර්යේෂණය හා ප්‍රතිකාරය. 2019 වෙළුම, ලිපි හැඳුනුම් කේතය 1650180, පිටු 13 යි. https://doi.org/10.1155/2019/1650180

උධෘත

- එන්.ඩී.ඒ.ඩී. විජේගුණවර්ධන, ඩබ්ලියු. අබේවික්‍රම, වයි.අයි.නිල්මිණි සිල්වා ගුණවර්ධන, ආර්.එස්. දසනායක, එන්. චන්ද්‍රසේන, කේ. බුවර්ට්සිස්., ඉසෙඩ්. ක්සයි. (2018). ශ්‍රී ලංකාවේ ඊඩීස් ඇල්බොපික්ටස් ජනගහනය පාලනය සඳහා වූ සමෝධානිත ඩෙංගු වාහක පාලනය තුළ අතිරේක මෙවලමක් ලෙස ඒකාබද්ධ බීජාණු-විරහිත කෘමි ශිල්පක්‍රමයක් හා වොල්බාකියා පාදක ප්‍රවේශයක් (නොපැහෙන කෘමි ශිල්පක්‍රමය, IIT). ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමයේ 74 වන වාර්ෂික සැසිවාරයේ කාර්යසැසි, ශ්‍රී ලංකාව. 35 පිටුව.
- එන්.ඩී.ඒ.ඩී. විජේගුණවර්ධන, ඩබ්ලියු. අබේවික්‍රම, වයි.අයි.නිල්මිණි සිල්වා ගුණවර්ධන, ආර්.එස්. දසනායක, එන්. චන්ද්‍රසේන, කේ. බුවර්ට්සිස්., ඉසෙඩ්. ක්සයි. (2018). ශ්‍රී ලංකාව තුළ ඊඩීස් ඇල්බොපික්ටස් ඩෙංගු වාහකය පාලනය සඳහා ඒකාබද්ධ බීජාණු-විරහිත කෘමි ශිල්පක්‍රමයක් (SIT) හා වොල්බාකියා පාදක ප්‍රවේශය භාවිතය. ජාත්‍යන්තර පශ්චාත් උපාධි පර්යේෂණ සැසිවාරයේ කාර්යසැසි, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව. උධෘත හැඳුනුම් කේතය IPCR/18/32. 18, 32 පිටුව.
- ජූඩ් පී.ජේ., ගුණතිලක පී.ඒ.ඩී.එච්.එන්., ප්‍රනාන්දු එස්.ඩී., ප්‍රේමරත්න පී.එච්., වික්‍රමසිංහ ඒ.ආර්., ප්‍රියදර්ශන් එස්.ඊ., අබේවික්‍රම ඩබ්ලියු. (2019). ශ්‍රී ලංකාවේ මන්නාරම දිස්ත්‍රික්කය තුළ වාහක බහුලතාව විපරිනාමනය කිරීම: වර්තමානය හා අතීතය පිළිබඳ සන්සන්දනාත්මක අධ්‍යයනයක්. 12 වන ජාත්‍යන්තර පර්යේෂණ සමුළුව, ජෙනරල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව. 159
- රාධිකා එන්.එම්.එල්., ගුණතිලක පී.ඒ.ඩී.එච්.එන්., කස්තුරිරත්න සහ අබේවික්‍රම ඩබ්ලියු. (2018). ශ්‍රී ලංකාවේ ගම්පහ දිස්ත්‍රික්කයේ කැලණිය අධ්‍යාපන කලාපය තුළ වයස අවුරුද 13–15 පාසල් දරුවන් අතර පවතින ඩෙංගු පිළිබඳ දැනුම ඇගයීම. ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමයේ වාර්ෂික සැසි, 74:106.
- උදයංග එන්.ඩබ්ලියු.බී.ඒ.එල්., ගුණතිලක පී.ඒ.ඩී.එච්.එන්., ඉක්බාල් එම්.සී.එම්., ප්‍රනාන්දු එම්.ඒ.එස්.ටී., අබයවික්‍රම ඩබ්ලියු. (2018). මහනුවර, අකුරණ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාසය තුළ ඩෙංගු වසංගතය කළමනාකරණය කිරීම සඳහා වූ සීමා අගයන් නිර්වචනය කිරීමේ සංඛ්‍යානමය ප්‍රවේශයක්. 19 වන ජාත්‍යන්තර පශ්චාත් උපාධි පර්යේෂණ සමුළුව, උපාධි අධ්‍යයන පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව. 30.
- උදයංග එන්.ඩබ්ලියු.බී.ඒ.එල්., ගුණතිලක පී.ඒ.ඩී.එච්.එන්., ඉක්බාල් එම්.සී.එම්., ප්‍රනාන්දු එම්.ඒ.එස්.ටී., අබයවික්‍රම ඩබ්ලියු. (2018). මහනුවර, අකුරණ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාසය තුළ ඩෙංගු වසංගතය කළමනාකරණය කිරීම සඳහා වූ සීමා අගයන් නිර්වචනය කිරීමේ සංඛ්‍යානමය ප්‍රවේශයක්. 19 වන ජාත්‍යන්තර පශ්චාත් උපාධි පර්යේෂණ සමුළුව, උපාධි අධ්‍යයන පීඨය, උපාධි අධ්‍යයනය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව. 30.

ලුතිනන් කර්නල් (වෛද්‍ය) ඒ. බාලසූරිය

<u>පුහුණු කටයුතුවලට සම්බන්ධ වීම:</u>

- ජෙනරල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ mYapd;a උපාධි අධ්‍යයන පීඨයේ හා සම-සෞඛ්‍ය විද්‍යා පීඨයේ කථිකාචාර්යවරයෙක් වශයෙන් සහ පශ්චාත් උපාධි වෛද්‍ය ආයතනයේ ආරාධිත කථිකාචාර්යවරයකු වශයෙන් ප්‍රථම හා පශ්චාත් උපාධි අපේක්ෂක-අපේක්ෂිකාවන් පුහුණු කිරීමෙහිද යෙදී සිටි අතර අධ්‍යයන මණ්ඩල සාමාජික හා සෞඛ්‍ය අංශ ව්‍යසන කළමනාකරණය පිළිබඳ විශේෂතා මණ්ඩල සභාපති තනතුරු හෙබවීය.
- පීඨයේ ආචාර ධර්ම සමාලෝචන කමිටුවේ සභාපති වශයෙන් පත්විය.
- ග්‍රන්ථයක පරිච්ඡේදයක්, සමානයින් විසින් සමාලෝචිත ජර්නලයක ලිපියක් හා සමුළුවලදී උධෘත 19 ක් ප්‍රකාශයට පත්කර ඇත.

වෛද්‍ය එම්.පී.ඒ.බී. අබේසිංහ

<u>පුහුණු කටයුතුවලට සම්බන්ධ වීම:</u>

- මරණයට හේතුව වෛද්‍යමය ලෙස සහතික කිරීම (MCCOD) පිළිබඳ ප්‍රථම උපාධි විෂයමාලාව සංවර්ධනය කිරීමේ වැඩමුළුවට සහභාගි විය. මරණයට හේතුව වෛද්‍යමය ලෙස සහතික කිරීම (MCCOD) පිළිබඳ නියමු කමිටුවේ සාමාජිකයකු වශයෙන් කටයුතු කළේය.
- විශේෂඥ සාක්ෂිකරුවෙක් වශයෙන් පානදුර, කොළඹ, රත්නපුර, ඇඹිලිපිටිය, ගම්පහ, මීගමුව හා අවිස්සාවේල්ල අධිකරණවලට සහභාගි විය.

වෛද්‍ය එස්.එම්. කොළඹගේ

<u>පුහුණු කටයුතුවලට සම්බන්ධ වීම:</u>

- සාමාජික, "2019 - ශ්‍රී ලංකා වෝහාරික ව්‍යාධිවේදීන්ගේ විද්‍යාලයේ දේශනය" සඳහා ව්‍යක්ත කථිකයකු සෙවීමේ මඩුල්ල
- "2019 - ශ්‍රී ලංකා වෝහාරික ව්‍යාධිවේදීන්ගේ විද්‍යාලයේ" විද්‍යාත්මක සැසිවාරයේදී ඉදිරිපත් කරන ලද පත්‍රිකාවල සමාලෝචක
- "2019 - ශ්‍රී ලංකා වෝහාරික ව්‍යාධිවේදීන්ගේ විද්‍යාලයේ" විද්‍යාත්මක සැසිවාරයේදී ඉදිරිපත් කරන ලද විද්‍යාත්මක පත්‍රිකාවන්හි සමාලෝචක

වෛද්‍ය එච්.එම්.එස්. විද්‍යානිලක

<u>පුහුණු කටයුතුවලට සම්බන්ධ වීම:</u>

- ශ්‍රී ලංකා රක්තවේදීන්ගේ විද්‍යාලය (SLCH) විසින් 2019 පෙබරවාරි 6 වන දින කොළඹදී සංවිධානය කරන ලද රක්තානුවේදය (Haemoglobinopathy) පිළිබඳ ජාත්‍යන්තර වැඩමුළුවේ සහභාගිකයෙක් විය.
- 2019 සැප්තැම්බර් 19 වන දින ශ්‍රී ලංකා රක්තවේදීන්ගේ විද්‍යාලයේ (SLCH) වාර්ෂික විද්වත් සැසිවාරයේදී පවත්වන ලද රක්තකාම්‍යය (හීමපිලියාව / haemophilia) පිළිබඳ විද්වත් සමුළුවේදී මූලාසනය දැරීය.
- එමාර් ෆාමා (Emar Pharma) විසින් 2019 ඔක්තෝබර් මාසයේදී සංවිධානය කරන ලද රක්තානුවේදය (Haemoglobinopathy) පිළිබඳ වැඩමුළුවේ සහභාගිකයෙක් විය.
- 2019 සැප්තැම්බර් 11 හා 12 දිනවල ජෙනරල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේදී පවත්වන ලද ජාත්‍යන්තර පර්යේෂණ සමුළුව සඳහා රක්තවේදය හා පරීක්ෂණාගාර වෛද්‍ය විද්‍යාව ආශ්‍රිත පර්යේෂණ පත්‍රිකා 3 ක් සමාලෝචනයේ යෙදුණි.

වෛද්‍ය ටී.අයි. විතානවසම්

- ජාත්‍යන්තර පර්යේෂණ සමුළුවේදී හොඳම පෝස්ටර් ඉදිරිපත් කිරීම, 2019.
- ජෙනරල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලීය රෝහල (UHKDU) තුළ රුධිර පරිත්‍යාගී ඒකකය ක්‍රියාත්මක කිරීමට මූලික විය.
- රෝහලේ හෙද නිලධාරිවරුන් සඳහා සයන-අද්දර රුධිර පාරවිලයන පිළිවෙත් පිළිබඳ දේශන පැවැත්වීය.
- ජෙනරල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලීය රෝහල (UHKDU) රුධිර බැංකුවෙහි රුධිර පරිත්‍යාගී සංචිතය ඇති කිරීමට මූලික විය.

වෛද්‍ය ඒ.ඩී.එම්. ගුණසේකර

<u>පුහුණු කටයුතුවලට සම්බන්ධ වීම:</u>

සම-සෞඛ්‍ය විද්‍යා පීඨයේ ඖෂධවේදය පාඨමාලාව සඳහා භිෂග්චිකිත්සීය දේශන පැවැත්වීමෙහි යෙදුණි.

<u>ජයග්‍රහණ</u>

- තායිලන්තයේ මහිදෝල් විශ්වවිද්‍යාලයේදී පී.එච්.ඩී. උපාධිය හැදෑරීමට ශිෂ්‍යත්වයක් ලැබීය.
- 2019 ජූලි මාසයේදී ශ්‍රී ලංකා වෛද්‍ය සංගමයේ 132 වන සාංවත්සරික ජාත්‍යන්තර වෛද්‍ය සම්මේලනයේදී ඉදිරිපත් කරන ලද නිදහස් පත්‍රිකා සඳහා භිෂග්වේදය විෂයෙන් විශිෂ්ටතම ඉදිරිපත් කිරීම සඳහා වූ ශ්‍රී ලංකා සායනික භිෂග්වේද හා චිකිත්සක සංගමයේ එස්.එල්.ඒ.සී.පී.ටී. (SLACPT) සම්මානය ලැබීය.

<u>ප්‍රකාශන</u>

- ගුණසේකර ඒ.ඩී.එම්., යසරත්න කේ.ඩබ්ලියු.ජී.කේ.පී., බෙණරගම බී.වී.එස්.එච්., පනාපිටිය එල්., වන්නිආරච්චි එල්.සී., ප්‍රනාන්දුපුල්ලේ බී.එම්.ආර්. උචිත ප්‍රතිජීවක භාවිතය පිළිබඳ ගුණාත්මකතා දර්ශක භාවිත කරමින් ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශය තුළ ප්‍රතිජීවක පරිභෝජනය. (2019) [උධෘතය] ශ්‍රී ලංකා වෛද්‍ය සංගමයේ 132 වන සාංවත්සරික ජාත්‍යන්තර වෛද්‍ය සම්මේලනය, 2019 ජූලි 24–27. වාචික හා පෝස්ටර් ඉදිරිපත් කිරීම්වල උධෘත.

සායනික විද්‍යා අධ්‍යයනාංශය

මහාචාර්ය එම්.එච්.ජේ. ආරියරත්න

<u>පුහුණු කටයුතුවලට සම්බන්ධ වීම:</u>

- අවසාන එම්.බී.බී.එස්. උපාධි පරීක්ෂණයේ විභාග පරීක්ෂක, කොළඹ විශ්වවිද්‍යාලය.

- සාමාජික, දර්ශනපති උපාධි/ ආචාර්ය උපාධි ඇගයීම් කමිටුව 2018, උපාධි අධ්‍යයන පීඨය, ජෙනරල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය
- ශල්‍යවේදීන්ගේ විද්‍යාලයේ වාර්ෂික සැසිය, උධෘත සමාලෝචක.
- සිලූවට සංස්කාරක කමිටුවේ සභාපති, ජෙනරල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය

ප්‍රකාශන:
- 'ශල්‍යවේදය තුළ සුලභ කෙටි කර්තව්‍ය වෙත මාර්ගෝපදේශනය' පිළිබඳ ග්‍රන්ථයක් ප්‍රකාශයට පත් කළේය. (2වන සංස්කරණය)
- 'ශල්‍යවේදී හමු වෙත මාර්ගෝපදේශනය' පිළිබඳ ග්‍රන්ථයක් ප්‍රකාශයට පත් කළේය. (2වන සංස්කරණය)

වෛද්‍ය ජී.ඩී.අයි. රොඩ්‍රිගෝ

පුහුණු කටයුතුවලට සම්බන්ධ වීම:
- ඇනැෆිලැක්සිස් ආසාත්මික ප්‍රතික්‍රියාව (අසංරක්ෂණත්වය anaphylaxis) කළමනාකරණය පිළිබඳ පුහුණු වැඩමුළුව — ළමා-ආරෝග්‍යවේදය තුළ උත්කෘෂ්ටත්වය, ප්‍රේග්, 2019 දෙසැම්බර්.
- ළමා-ආරෝග්‍යවේදය (Paediatrics) පිළිබඳ පුහුණු වැඩමුළුව — ශ්‍රී ලංකා ළමා-ආරෝග්‍යවේදීන්ගේ විද්‍යාලය, 2019 ඔක්තෝබර්.

ප්‍රකාශන
- යූ.ඩී.එස්.එම්. අබයරත්න, කේ.එච්.පී. පෙරේරා, ඩබ්ලියූ.වී.එන්. ද මෙල්, ඩී.සී. මධුශාන්, ජී.ඩබ්ලියූ.එන්.කේ. චන්ද්‍රසිරි, එම්.එන්. ප්‍රියදර්ශනී, ජී.ඩී.අයි. රොඩ්‍රිගෝ; පෙරපාසල් ක්‍රියාකාරකමක් හරහා පෙරපාසල් ළමුන් තුළ ආහාර තෝරා ගැනීමේ චර්යාව වෙනස් කිරීම.
- ශ්‍රී ලංකා ළමා-ආරෝග්‍යවේදීන්ගේ විද්‍යාලයේ 22 වන වාර්ෂික විද්‍යාත්මක සම්මේලනයේදී වාචික ඉදිරිපත් කිරීම, 2019 අගෝස්තු.
- ආර්.ටී. ගුණවර්ධන, ඩී.එස්. විජේසිංහ, ආර්.එම්.ඒ.ඩී.එම්. රත්නායක, එච්.ජී.එච්. පූර්ණෝදය, එච්.ඩී.යූ. යසස්සිලාවූ, ඩී. විදානගේ, ජී.ඩී.අයි. රොඩ්‍රිගෝ; වයස අවුරුදු 1 සිට 5 දක්වා ළමුන් සිටින නිවෙස්වල ගෘහ පරිසරයේ ආරක්ෂාව වැඩිදියුණු කිරීමේ මැදිහත්වීමක සඵලදායිත්වය.
- ශ්‍රී ලංකා ළමා-ආරෝග්‍යවේදීන්ගේ විද්‍යාලයේ 22 වන වාර්ෂික විද්‍යාත්මක සම්මේලනයේදී වාචික ඉදිරිපත් කිරීම, 2019 අගෝස්තු.
- යූ.ඩී.එස්.එම්. අබයරත්න, කේ.එච්.පී. පෙරේරා, ඩබ්ලියූ.වී.එන්. ද මෙල්, ඩී.සී. මධුශාන්, ජී.ඩබ්ලියූ.එන්.කේ. චන්ද්‍රසිරි, එම්.එන්. ප්‍රියදර්ශනී, ජී.ඩී.අයි. රොඩ්‍රිගෝ; පානදුර නගර සභා කොට්ඨාසය තුළ අවුරුදු 2–5 වයසේ පෙරපාසල් ළමුන් තුළ ආහාර තෝරා ගැනීමේ චර්යාව වෙනස් කිරීමෙහිලා ආහාර-පාදක ක්‍රියාකාරකමක සඵලදායිත්වය.
- වාචික ඉදිරිපත් කිරීම, 12 වන ජාත්‍යන්තර පර්යේෂණ සමුළුව, ජෙනරල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය, 2019 සැප්තැම්බර්.

බ්‍රිගේඩියර් (වෛද්‍ය) පීටීආර් මකුලොලුව

පුහුණු කටයුතුවලට සම්බන්ධ වීම:
- ශ්‍රී ලංකා නිර්වින්දන හා දැඩි සත්කාර විශේෂඥ වෛද්‍යවරුන්ගේ විද්‍යාලයේ 35 වන වාර්ෂික විද්වත් සම්මේලනය, 2019 ජනවාරි 19 හා 20 (කොළඹ) — එක්සත් රාජධානියේ රාජකීය නිර්වින්දනවේදීන්ගේ විද්‍යාලය (RCoA) විසින් 'අඛණ්ඩ වෘත්තීයවේදී විෂයබැර' (CPD Credits) 12 ක් ප්‍රදානය කරන ලදී.
- 2019 නොවැම්බර් 1–3 දිනවල චීනයේ ග්වැංෂෝ නුවර පැවති චීන නිර්වින්දනවේදීන්ගේ සමාජයේ (CSA) වාර්ෂික සමුළුවට සහභාගි විය.
- නිර්වින්දනවේදය හා භෞතවේදය පිළිබඳ දේශන, පාඩම් හා තිරසාර සංවර්ධන පරමාර්ථ

සම-සෞඛ්‍ය විද්‍යා පීඨය
- ජෙනරල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ සම-සෞඛ්‍ය විද්‍යා පීඨයේ ඉගැන්වීම හා පුහුණුව සහ උපාධි අපේක්ෂක-අපේක්ෂිකාවන් තක්සේරු කිරීම
- මූලික විද්‍යා මොඩියුල
- භෞතචිකිත්සාව පිළිබඳ බී.එස්.සී. උපාධි මොඩියුල

ප්‍රකාශන

- කේ.එම්.ඩී. නදීශානි, ඩබ්ලියු.එස්. කෞශල්‍යා, ඒ.ආර්.සී. තරිඳුලතා, එම්.ඩී.ඩී.එම්. මුණසිංහ, එන්.බී. කල්පගේ, එච්.එම්.පී. හේරත්, පී.ටී.ආර්. මකුලොලුව. ශ්‍රී ලංකාවේ බස්නාහිර පළාත තුළ රාජ්‍ය බැංකුකරුවන් අතර හෘත්වාහිනී රෝග සඳහා වූ විකරණය කළ හැකි හා නොහැකි අවදානම් සාධක පැවතීම: මහජන සෞඛ්‍යය හා යහපැවැත්ම පිළිබඳ 1 වන ජාත්‍යන්තර සමුළුවේ (පබ්ලික් හෙල්ත් 19) උධෘත ග්‍රන්ථය, අප්‍රේල් 19 (වාචික ඉදිරිපත් කිරීම/ උධෘතය) https://www.facebook.com/iConferenceOrganizers/
- නිරෝෂා පී. එදිරිසිංහ, තමාසි ආර්. මකුලොළුව, තමරා ඩී. අමරසේකර, ක්‍රිස්ටින් එස්.ඊ. ගුණවර්ධන. ශ්‍රී ලංකාවේ අපේක්ෂා රෝහලේ වේදනා සායනයට සහභාගි වන පිළිකාව වැළඳුනු රෝගීන් අතර කෙටි ස්වරූපයේ සංක්ෂිප්ත පරිලේඛනයේ සිංහල පරිවර්තිත පිටපතක වලංගුතාව හා විශ්වාසය තැබිය හැකි බව, ජාත්‍යන්තර වසංගතවේද සංගමයේ අග්නිදිග ආසියානු කලාපීය කණ්ඩායම් 1 වන රැස්වීමෙහි (IEA – SEA) උධෘත ග්‍රන්ථය, 2019 සැප්තැම්බර් (වාචික ඉදිරිපත් කිරීම/ උධෘතය OP 098, 58 පිටුව)
- එදිරිසිංහ එන්.පී., මකුලොළුව පී.ටී.ආර්., අමරසේකර ඒ.ඒ.ටී.ඩී., ගුණවර්ධන සී.එස්.ඊ. පිළිකා වේදනාවෙහි සංවේදනාත්මක පැතිකඩ හා පිළිකා වේදනාව සහිත රෝගීන්ගේ ජීවන තත්ත්වය සමග ඒවායේ සම්බන්ධය: විස්තරාත්මක හරස්කඩාත්මක අධ්‍යයනයක්, ජාත්‍යන්තර සෞඛ්‍ය විද්‍යා සමුළුවේ කාර්යසැසි, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය 2019 ඔක්තෝබර් (පෝස්ටරය/ උධෘතය 47 පිටුව IHC-USJP)
- පී.ටී.ආර්. මකුලොළුව, එම්.කේ.එච්. පීරිස්, ආර්.පී.ඒ.එන්. ආරියදාස, ඩබ්ලියු.ඒ.ඩී.ඩී.ටී. රත්නසේකර, එන්.පී. එදිරිසිංහ. ජෙනරල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලීය රෝහලෙහි (UHKDU) ශල්‍යකර්ම-පශ්චිම වේදනා සේවය: ගුණාත්මකතාව හා ආරක්ෂාව වැඩිදියුණු කිරීමේ අදහස ඇතිව වේදනා නාශක පිළිවෙත්වල ප්‍රබලතා හා දුබලතා සමාලෝචනය, 12 වන ජාත්‍යන්තර පර්යේෂණ සමුළුව, ජෙනරල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය (IRC-KDU) 2019 සැප්තැම්බර් (පෝස්ටරය/ උධෘතය)
- පී.ටී.ආර්. මකුලොළුව, එම්.කේ.එච්. පීරිස්, ආර්.පී.ඒ.එන්. ආරියදාස, ඩබ්ලියු.ඒ.ඩී.ඩී. රත්නසේකර, එන්.පී. එදිරිසිංහ. ජෙනරල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලීය රෝහලේ (UHKDU) පරි-ශල්‍යකර්ම වේදනා සේවාවන් ආවර්ජනය කිරීමක් ලෙස ශල්‍යකර්මයෙන් පැය 24 කට පසුව වේදනා තීව්‍රතා ප්‍රතිඵල සමාලෝචනය කිරීම: සිතීමට කරුණු, කාර්යසැසි, ජෙනරල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලීය 12 වන ජාත්‍යන්තර පර්යේෂණ සමුළුව, 2019 සැප්තැම්බර් (වාචික ඉදිරිපත් කිරීම/ උධෘතය)
- පී.ටී.ආර්. මකුලොළුව, කේ.එම්.ඩී. නදීශානි, එස්.එන්.ඊ. ජයතිස්ස, ඩී.ඩබ්ලියු.ජී.එස්.සී. අලුකුඹුර, එම්.අයි.ඩී. පෙරේරා, ඩී.එස්.එම්. පෙරේරා, බී.පී. කුඩාවිදානගේ. ජෙනරල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලීය රෝහලෙහි ස්වයංතීරක ශල්‍යකර්ම සඳහා සාමාන්‍යයෙන් සිදුකෙරෙන ශල්‍යකර්ම-පූර්ව පරීක්ෂා නියම කිරීම: සාමාන්‍යයෙන් සිදුකෙරෙන ශල්‍යකර්ම-පූර්ව පරීක්ෂා පිළිබඳ ‘ජාතික සෞඛ්‍ය හා සායනික විශිෂ්ටත්වතා ආයතනයේ (NICE) මාර්ගෝපදේශ පිළිපැදීම (යාවත්කාලිකය) 2016 (NG45), ජෙනරල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලීය 12 වන ජාත්‍යන්තර පර්යේෂණ සමුළුව, 2019 සැප්තැම්බර් (පෝස්ටරය/ උධෘතය)
- එන්.පී. එදිරිසිංහ, පී.ටී.ආර්. මකුලොළුව, ඒ.ඒ.ටී.ඩී. අමරසේකර, සී.එස්.ඊ. ගුණවර්ධන. පිළිකා සහිත රෝගීන් තුළ ප්‍රත්‍යක්ෂ වේදනාව මත ජනසංයුතික හා රෝග-විශේෂිත විචනයන්ගේ බලපෑම, ශ්‍රී ලංකා නිර්වින්දන හා දැඩි සත්කාර විශේෂඥ වෛද්‍යවරුන්ගේ විද්‍යාලීය වේදනා වෛද්‍ය පීඨයේ 7 වන වාර්ෂික විද්වත් සැසි, 2019 ඔක්තෝබර් 15 වන දින (වාචික ඉදිරිපත් කිරීම/ උධෘතය)
- එදිරිසිංහ එන්.පී., මකුලොළුව පී.ටී.ආර්., අමරසේකර ඒ.ඒ.ටී.ඩී., ගුණවර්ධන සී.එස්.ඊ. මහරගම අපේක්ෂා රෝහලට පැමිණෙන පිළිකාව සහිත රෝගීන් අතර පුද්ගල-බද්ධ වේදනා අත්විඳීමෙහි එකිනෙකට වෙනස් ගති. බහු-විෂයක්ෂේත්‍රීය ප්‍රවේශයන් පිළිබඳ ජාත්‍යන්තර සමුළුව (iCMA) උපාධි අධ්‍යයන පීඨය-ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, 2019 නොවැම්බර් (වාචික ඉදිරිපත් කිරීම/ උධෘතය)

ජර්නල් ප්‍රකාශන

- කේ. අභයසිංහ, එන්. එදිරිසිංහ, ටී. මකුලොළුව සහ ඊ.එස්. හිල්. සායනික උපදේශනය: එය ශ්‍රී ලංකාවේ හෙද අධ්‍යාපනය සඳහා වැදගත්ද? ‘නව දැක්ම’ වාර්ෂික කලාපය (ISSN 2613 – 8735); ශ්‍රී ලංකා උපාධිධාරී හෙද පදනම 8 වෙළුම 1 කලාපය 2019 මාර්තු නිරෝෂා පී. එදිරිසිංහ, තමාසි ආර්. මකුලොළුව, තමරා ඩී. අමරසේකර, ක්‍රිස්ටින් එස්.ඊ. ගුණවර්ධන. ශ්‍රී ලංකාවේ පිළිකාව වැළඳුනු රෝගීන් අතර කෙටි ස්වරූපයේ මැක්ගිල් වේදනා ප්‍රශ්නාවලි අංක 2 හි සිංහල පිටපතේ (SF MPQ-2-Sin) මනෝ-මිතික ගුණ; හින්දවි, වේදනා පර්යේෂණය හා කළමනාකරණය, 2019 වෙළුම, ලිපි කේතය 5050979, පිටු 6 කි. 2019 ඔක්තෝබර් https://doi.org/10.1155/2019/5050979

- ජයවීර කේ. ක්‍රෙයිග් ජේ.එම්., සැවෝස් එච්.එම්.එස්. සහ තවත් අය. ශ්‍රී ලංකාවේ හා දකුණු ආසියාවේ වෙනත් පහළ- සහ මැදි-ආදායම් රටවල මානසික සෞඛ්‍ය පර්යේෂණ හා ධාරිතා නැංවීම සඳහා ළමා හා නවයෞවන ද්විත්ව ලේඛනයක් ස්ථාපිත කිරීම සඳහා වූ කාර්යවිධිය. බී.එම්.ජේ. විවෘත 2019-9:

ගෘප් කපිතාන් (වෛද්‍ය) ආර්.ඒ.එන්.කේ. විජේසිංහ

<u>පුහුණු කටයුතුවලට සම්බන්ධ වීම:</u>

- 2019 නොවැම්බර් මස සිංගප්පූරුවෙහි හෘද රෝග වෛද්‍යවරුන් සඳහා වූ හෘත් 'ආගණිත ස්ථරරූපන චිත්‍රරේඛනය' (CTA) පිළිබඳ ප්‍රගීත පාඨමාලාව 1 හා 2 මට්ටම තුළ පුහුණුව ලැබීය.

<u>ප්‍රකාශන</u>

- ජයසේකර එම්.එම්.පී.ටී., විජේසිංහ ආර්.ඒ.එන්.කේ., නවරත්න ටී.එන්.ඩී., වන්නිආරච්චි ඩබ්ලියු.කේ.එම්.එන්.යූ., නවරත්න එම්.බී., 2019, ශ්‍රී ලංකාවේ තෘතීය උපස්ථායක රෝහලක හදිසි ප්‍රතිකාර අංශයට පපුවේ වේදනාවක් සහිතව ඉදිරිපත් වූ රෝගීන්ගේ දින 30 ක ප්‍රතිඵලය; 65 පිටුව (වාචික ඉදිරිපත් කිරීම, 3 වන වාර්ෂික විද්වත් සැසි, ශ්‍රී ලංකා අභ්‍යන්තර වෛද්‍ය විද්‍යාලය – 2019)
- අබේගුණවර්ධන එච්. මයුරන් එස්., ජයවර්ධන ජේ., විජේසිංහ ආර්.ඒ.එන්.කේ., නවරත්න පී.බී.වී., බාලසූරිය ඒ. ද සිල්වා ඒ.ඩී. 2019. වාණිජමය එන්සයිම-බද්ධ ප්‍රතිශක්ති-ග්‍රාහක මිනුම් දෙකක් භාවිත කරමින් 'ඩෙංගු-වයිරස් මර්ධන ඉම්‍යුනෝග්ලොබියුලින්' (anti-DENV IgG) හෝ අතීත 'ඩෙංගු වයිරස්' (DENV) ආසාදනය සෙවීම. (7 වෙළුම); 05 පිටුව (ශ්‍රී ලංකා ක්ෂුද්‍රජීව විද්‍යා සංගමයේ [SSM] 8 වන වාර්ෂික සමුළුව හා විද්‍යාත්මක සැසිවාරය තුළ වාචික ඉදිරිපත් කිරීම - 2019)
- අත්‍යවශ්‍ය හෘත්වේද පාඨග්‍රන්ථය
  (වෛද්‍ය උපාධි අපේක්ෂක-අපේක්ෂිකාවන් හා කණිෂ්ඨ වෛද්‍යවරුන් සඳහා රචනා කරන ලද හෘත්වේද පාඨග්‍රන්ථයකි.)
- වැඩිහිටි වෛද්‍ය හදිසි අවස්ථා කළමනාකරණය පිළිබඳ පාඨග්‍රන්ථය
  (වෛද්‍ය උපාධි අපේක්ෂක-අපේක්ෂිකාවන් හා කණිෂ්ඨ වෛද්‍යවරුන් සඳහා ලියන ලද වෛද්‍ය හදිසි අවස්ථාවන් කළමනාකරණය පිළිබඳ පාඨග්‍රන්ථය)
- විශේෂාංග ලිපි සාකච්ඡාව - "ශ්‍රී ලංකා වෛද්‍ය සංගමය" (SLMA) පළකරන පුවත් සංදේශය තුළ පළවූ "ශ්වසන අපහසුතාව සහිත මැදිවියේ කාන්තාව: දුර්ලභ දුහ්ශ්වසන (dyspnoea) රෝගී අවස්ථාවක්", 2019 ජූනි (12 වෙළුම, 06 කලාපය)

වෛද්‍ය එන්.එෆ්.ජේ. ප්‍රනාන්දු

<u>පුහුණු කටයුතුවලට සම්බන්ධ වීම:</u>

- අධ්‍යයනමය වශයෙන් දුර්වල වෛද්‍ය ශිෂ්‍ය-ශිෂ්‍යාවන්ට උපකාර කිරීමේ වැඩසටහන

අධ්‍යයන අධීක්ෂක –

උපාධි අධ්‍යයන පීඨයේ පී.එච්.ඩී. උපාධි/ එම්.එස්.සී. උපාධි (Master's) පර්යේෂණ ව්‍යාපෘතිය

බටලන්දේ ආඥා හා කාර්ය මණ්ඩල විද්‍යාලයේ එම්.එස්.සී. උපාධි (Master's) පර්යේෂණ ව්‍යාපෘති 2 ක්

සම-සෞඛ්‍ය විද්‍යා පීඨයේ ප්‍රථම උපාධි පර්යේෂණ ව්‍යාපෘති 2 ක්

වෛද්‍ය ආර්.එන්. එල්ලාවල

<u>පුහුණු කටයුතුවලට සම්බන්ධ වීම:</u>

- 32 වන ශිෂ්‍ය කාණ්ඩයේ වෘත්තීයවේදී ශල්‍යවේදය ශිෂ්‍ය-ශිෂ්‍යාවන් 140 දෙනකු පුහුණු කළේය.

වෛද්‍ය සී.ඩී. ඒකනායක

<u>පුහුණු කටයුතුවලට සම්බන්ධ වීම:</u>

- ප්‍රසවවේදයේ හා නාරීවේදයේ ප්‍රතිඵල තක්සේරු කිරීම:සෞඛ්‍ය-ආර්ථික විද්‍යා පර්යාලෝකයක්. ශ්‍රී ලංකා ප්‍රසවවේදී හා නාරීවේදී විද්‍යාලය.52 වාර්ෂික විද්‍යාත්මක සැසි. වැඩසටහන් පොත 2019;52-53.

වෛද්‍ය බී.ජී.ඩී.එස්. ගෝවින්දපාල

<u>ජයග්‍රහණ</u>

- ලංකා වෛද්‍ය වෘත්තිකයින්ගේ විද්‍යාලයෙන් 2019 වර්ෂය සඳහා පර්යේෂණ ප්‍රදානය

<u>ප්‍රකාශන</u>

විශේෂාංග ලිපි සාකච්ඡාව - "ශ්‍රී ලංකා වෛද්‍ය සංගමය" (SLMA) පළකරන පුවත් සංදේශය තුළ පළවූ "ශ්වසන අපහසුතාව සහිත මැදිවියේ කාන්තාව: දුර්ලභ දුහ්ශ්වසන (dyspnoea) රෝගී අවස්ථාවක්", 2019 ජූනි (12 වෙළුම, 06 කලාපය)

වෛද්‍ය එම්.එම්.පී.ටී. ජයසේකර

ජයග්‍රහණ

- ලංකා වෛද්‍ය වෘත්තිකයින්ගේ විද්‍යාලයේ සම්මාන සාමාජිකත්වය
- එඩින්බර්ග් රාජකීය විද්‍යාලයේ සම්මාන සාමාජික
- උසස් අධ්‍යාපනය තුළ ඉගැන්වීම පිළිබඳ සහතික පත්‍ර (CTHE) විශිෂ්ටතම කාර්යසාධනය, ජෙනරල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය 2019
- ශ්‍රී ලංකා ජාතික ආඝාත සංගමයේ සම්මානය - ආඝාතය පිළිබඳ විශිෂ්ටතම නිදහස් පත්‍රිකාව, එඩින්බර්ග්හි රාජකීය වෛද්‍ය වෘත්තිකයින්ගේ විද්‍යාලය සමග ඒකාබද්ධව පවත්වන ලද 52 වන වාර්ෂික විද්වත් සැසිවාරය

ප්‍රකාශන

ජයසේකර එම්.එම්.පී.ටී., විජේසිංහ ආර්.ඒ.එන්.කේ., නවරත්න ටී.එන්.ඩී., වන්නිආරච්චි ඩබ්ලියු.කේ.එම්.එන්.යූ., නවරත්න එම්.බී., ශ්‍රී ලංකාවේ තෘතීය උපස්ථායක රෝහලක හදිසි අංශයට පපුවේ වේදනාවක් සහිතව ඉදිරිපත් වූ රෝගීන්ගේ දින 30 ක ප්‍රතිඵලය - පෝස්ටර් ඉදිරිපත් කිරීම, වාර්ෂික විද්වත් සැසි, ශ්‍රී ලංකා අභ්‍යන්තර වෛද්‍ය විද්‍යාලය – 2019

ජයසේකර එම්.එම්.පී.ටී., ද සිල්වා ඩී. - පරි-ප්‍රසූත උණ රෝගී සිද්ධි මාලාවක් - පෝස්ටර් ඉදිරිපත් කිරීම - වාර්ෂික විද්වත් සැසි, ශ්‍රී ලංකා අභ්‍යන්තර වෛද්‍ය විද්‍යාලය –2019 නොවැම්බර්.

ජයසේකර එම්.එම්.පී.ටී., ප්‍රනාන්දුපුල්ලේ ආර්.එම්.එස්., වීරසිංහ ටී., ද සොයිසා, රණවීර ටී. - 2019, ශ්‍රී ලංකාවේ තෘතීය උපස්ථායක රෝහලක වයෝවෘද්ධ රෝගීන්ගේ උකුළු අස්ථි භග්න හා ප්‍රතිඵලය - වාචික ඉදිරිපත් කිරීම - වාර්ෂික විද්වත් සැසි, ශ්‍රී ලංකා වෛද්‍ය සංගමය – 2019)

ජයසේකර එම්.එම්.පී.ටී., දසනායක ජී.කේ.ජී., බණ්ඩාර පී.එම්.කේ., ජයවර්ධන ඩී.ඒ.එන්.එල්., මල්කාන්ති කේ.එම්.එස්.ඒ. - ශ්‍රී ලංකාවේ තෘතීය උපස්ථායක රෝහලක හදිසි ප්‍රතිකාර අංශයට ආඝාතය සහිතව ඉදිරිපත් වූ රෝගීන් පිළිබඳ අධ්‍යයනය - පෝස්ටර් ඉදිරිපත් කිරීම, වාර්ෂික විද්වත් සැසි, ලංකා වෛද්‍ය වෘත්තිකයින්ගේ විද්‍යාලය - ආඝාත පර්යේෂණ ජයග්‍රාහක

විශේෂාංග ලිපි සාකච්ඡාව - "ශ්‍රී ලංකා වෛද්‍ය සංගමය" (SLMA) පළකරන එස්.එල්.එම්.ඒ. පුවත් සංදේශය තුළ පළවූ "ශ්වසන අපහසුතාව සහිත මැදිවියේ කාන්තාව: දුර්ලභ දුශ්වසන (dyspnoea) රෝගී අවස්ථාවක්", 2019 ජූනි (12 වෙළුම, 06 කලාපය)

ඒ.එම්.එස්.බී. අධිකාරි, ජයසේකර එම්.එම්.පී.ටී., විජේවර්ධන එම්.ජී.ඩී.ඩී., ජයරත්න බී.බී. - කුරුණෑගල ශික්ෂණ රෝහලේ අනතුරු හා හදිසි තත්ත්ව අංශයට ඉදිරිපත් කිරීමේදී 'නාල රුධිරගුටිකාරෝධ ආරෝහණ හෘත්-කන්තුක ඉන්පාකිභවන' (STEMI) රෝග ලක්ෂණ විශ්ලේෂණය පිළිබඳ අධ්‍යයනය - 2017–2018

ජයසේකර එම්.එම්.පී.ටී., විද්‍යාරත්න ඩබ්ලියු.ඩී.පී., මාපලගම කේ.පී. රත්නවීර කේ.ජී.කේ., ජයරත්න ඒ.එම්.එස්.ආර්., සිරිවර්ධන එච්.වී.වයි.ඩී.; අභ්‍යන්තර අවයවීය ලශ්මේනියව (Visceral leishmaniasis) සහිත රෝගියකු තුළ විස්තෘත මාත්සර්ය (disseminated malignancy); ලංකා වෛද්‍ය වෘත්තිකයින්ගේ විද්‍යාලයේ ජර්නලය. 2018, 49, 72–74

වෛද්‍ය ඩබ්ලියු.ඩී.ඩී. ද සිල්වා

පුහුණු කටයුතුවලට සම්බන්ධ වීම:

- කොළඹ විශ්වවිද්‍යාලයේ හා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ අවසන් එම්.බී.බී.එස්. උපාධි පරීක්ෂණ සඳහා බාහිර විභාග පරීක්ෂකයෙක් ලෙස සහභාගි විය.

ප්‍රකාශන

බ්‍රිතාන්‍ය ජාත්‍යන්තර වෛද්‍යාචාර්ය සංගමයේ (BIDA) ජර්නලය තුළ ලිපියක් පළ කළේය.

ද සිල්වා, දුලන්ත, ඇන්ටනි, දනේන්දිරන්, සෙල්වසේකර්, වෙල්ලයියා. අන්ත්‍රාවරණ පෘෂ්ඨීය මාත්සර්ය (peritoneal surface malignancy) කළමනාකරණය කිරීමෙහිලා සෛල-ඔක්සිහාරක (Cytoreductive) ශල්‍යකර්මය හා තප්ත අන්තඃ අන්ත්‍රාවරණ රසායන චිකිත්සාව පිළිබඳ දසුනක්. බ්‍රිතාන්‍ය ජාත්‍යන්තර වෛද්‍යාචාර්ය සංගමය 2019; 25(2):18–20

වෛද්‍ය කේ.එස්.ආර්. පුෂ්පකුමාර

පුහුණු කටයුතුවලට සම්බන්ධ වීම:

32 වන ශිෂ්‍ය කාණ්ඩයේ ශල්‍යවේදය තුළ මහාචාර්ය හමු සම්බන්ධයෙන් ශිෂ්‍ය-ශිෂ්‍යාවන් 140 දෙනකු පුහුණු කිරීම සම්පූර්ණ කළේය.

ජපානයේ වෛද්‍ය විද්‍යාව පිළිබඳ හෝග්ගෝ විද්‍යාලයේ ලෝක ස්නායුශල්‍ය සංගම් සම්මේලනය සඳහා පශ්චාත් උපාධි පුහුණු කේන්ද්‍රයේදී 2019 මාර්තු මස සිට මැයි මස දක්වා අන්තෝස්නායුවාහිණික (Endoneurovascular) චිකිත්සාව පිළිබඳ අධිශිෂ්‍යත්වය/ උසස් පුහුණුව ලැබීය.

වියට්නාමයේ හෝ චි මිං නුවර විශ්වවිද්‍යාලීය වෛද්‍ය මධ්‍යස්ථානයේදී ජූනි සිට ජූලි දක්වා අන්තෝස්නායුවාභිණික (Endoneurovascular) චිකිත්සාව පිළිබඳ අධිශිෂ්‍යත්වය/ උසස් පුහුණුව ලැබීය.
ජපානයේ යොකොහාමා නුවරදී 2019 මැයි මාසයේදී ජපන් ස්නායුශල්‍ය සම්මේලනයේ වාර්ෂික විද්වත් සැසිවාරයට සහභාගි විය.
ජපානයේ හෝක්කයිඩෝ වෛද්‍ය විද්‍යාලය විසින් පළකරන ලද අන්තෝස්නායුවාභිණික (Endoneurovascular) චිකිත්සාව පිළිබඳ විද්‍යුත් ග්‍රන්ථයේ සමසංස්කාරක විය.

වෛද්‍ය ටී.අයි. සමරවික්‍රම

<u>ප්‍රකාශන</u>

විශේෂාංග ලිපි සාකච්ඡාව - "ශ්‍රී ලංකා වෛද්‍ය සංගමය" (SLMA) පළකරන එස්.එල්.එම්.ඒ. පුවත් සංදේශය තුළ පළවූ "ශ්වසන අපහසුතාව සහිත මැදිවියේ කාන්තාව: දුර්ලභ දුඃශ්වසන (dyspnoea) රෝගී අවස්ථාවක්", 2019 ජූනි (12 වෙළුම, 06 කලාපය)

වෛද්‍ය ආර්.ඊ. වික්‍රමාරච්චි

<u>පුහුණු කටයුතුවලට සම්බන්ධ වීම:</u>

- 2019.02.21 දින සිට 2019.10.18 දින දක්වා උසස් අධ්‍යාපනය තුළ ඉගැන්වීම පිළිබඳ සහතික පත්‍ර (CTHE) පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කළේය.

වෛද්‍ය ඩී.එස්.පී. පුල්ලපෙරුම

<u>පුහුණු කටයුතුවලට සම්බන්ධ වීම:</u>

- 2019.02.21 දින සිට 2019.10.18 දින දක්වා උසස් අධ්‍යාපනය තුළ ඉගැන්වීම පිළිබඳ සහතික පත්‍ර (CTHE) පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කළේය.

වෛද්‍ය ටී.වී. සංජීවනී

<u>පුහුණු කටයුතුවලට සම්බන්ධ වීම:</u>

- 16 වන වාර්ෂික විද්වත් සැසි - 2019
- උසස් අධ්‍යාපනය තුළ ඉගැන්වීම පිළිබඳ සහතික පත්‍ර (CTHE) වැඩසටහන සම්පූර්ණ කළාය.
- ජාත්‍යන්තර පර්යේෂණ සමුළුව සඳහා කමිටු සාමාජිකාවක් ලෙස තෝරා ගනු ලැබුවාය.
- පුවත් සංදේශයේ සාමාජික - වෛද්‍ය විද්‍යා පීඨය, ජෙනරල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය
- වෛද්‍ය ශිෂ්‍ය- ශිෂ්‍යාවන් සඳහා හමුව අවසන 'වාස්තවික ව්‍යුහගත සායනික විභාගය' (OSCE) සහ වාචික පරීක්ෂණය පැවැත්වූවාය.

<u>ප්‍රකාශන</u>

- පුනරාවර්තනය වන මුඛ සලප වෘණ සහිත රෝගීන්ගේ විටමින් 'ඩී' (25-හයිඩ්‍රොක්සි) තත්ත්වය පිළිබඳ පෝස්ටර් ඉදිරිපත් කිරීම - 'ශ්‍රී ලංකාවේ කණ, නාසය හා උගුර පිළිබඳ විශේෂඥයින්ගේ හා හිස හා ගෙල පිළිබඳ ශල්‍යවේදීන්ගේ විද්‍යාලය'.

නිරාවරණිත මහා උපයටිහනු ප්‍රණාල අශ්මරී (Exposed giant submandibular duct calculus): සිද්ධි වාර්තාව, 'විවෘත සායනික හා වෛද්‍ය සිද්ධි අධ්‍යයන ජර්නලය' 5 වෙළුම (2019) 8 කලාපය.

වෛද්‍ය සී.ඩී. ඒකනායක

<u>පුහුණු කටයුතුවලට සම්බන්ධ වීම:</u>

ප්‍රසවවේදයේ හා නාරිවේදයේ ප්‍රතිඵල තක්සේරු කිරීම: සෞඛ්‍ය-ආර්ථික විද්‍යා පර්යාලෝකයක්. ශ්‍රී ලංකා ප්‍රසවවේදී හා නාරිවේදී විද්‍යාලය. 52 වාර්ෂික විද්‍යාත්මක සැසි. වැඩසටහන් පොත 2019; 52-53.

ථිනා සොලමන්ස් මිය

<u>පුහුණු කටයුතුවලට සම්බන්ධ වීම:</u>

- සෞඛ්‍ය අමාත්‍යාංශය සඳහා ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පාදක ප්‍රචණ්ඩත්වය සම්බන්ධ සන්නිවේදන කුසලතා පිළිබඳ පුහුණුකරුවන් පුහුණු කිරීමේ අත්පොත පිළිබඳ හඳුන්වා දීමේ සැසිය.
- අසමාන ස්ත්‍රී-පුරුෂ සහභාගිත්වය හා ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පාදක ප්‍රචණ්ඩත්වය කරා බලපාන ආර්ථික සාධක - 5 වන ජගත් කාන්තා අධ්‍යයන සමුළුව - 2019, බැංකොක්, තායිලන්තය. https://drive.google.com/file/d/1451EPkiiMjvwAQ2veCy9Hn7DTiHT-WAo/view
- ජාත්‍යන්තර වසංගත අධ්‍යයන සංගමයේ ප්‍රථම දකුණු ආසියා කලාපීය කණ්ඩායමේ රැස්වීමේදී එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල (UNFPA) විසින් මෙහෙයවන ලද "තිරසාර සංවර්ධනය සඳහා කාන්තා සෞඛ්‍යය හා අයිතිවාසිකම් සහතික කිරීම" පිළිබඳ විද්වත් සමුළුවේදී හා ශ්‍රී ලංකා ප්‍රජා

වෛද්‍ය වෘත්තික විද්‍යාලයේ 24 වන වාර්ෂික විද්වත් සැසිවාරයේදී කථිකාචිය ලෙස ආරාධනා ලැබුවාය. සැප්තැම්බර් 19–21, සිනැමන් ග්‍රෑන්ඩ් හෝටලය, කොළඹ.

ප්‍රකාශන

- උධෘතය — ලිංගික හා ප්‍රජනන සෞඛ්‍යය හා ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පාදක ප්‍රචණ්ඩත්වය සම්බන්ධ මනෝ-සාමාජීය උපකාර සහ මානසික සෞඛ්‍ය අංශය
- කොළඹ විශ්වවිද්‍යාලීය හෙද පීඨයේ ක්ෂුද්‍ර-පර්යේෂණ විද්වත් සමුළුව සඳහා පූර්ණ-සැසි කථික — 2019 දෙසැම්බර් 2 වන දින.
- උධෘතය — "වඩා යහපත් සෞඛ්‍ය උපස්ථානය සඳහා මනෝ-සාමාජීය යහපැවැත්ම"
- "යහපත් පවුලක් සඳහා ධනාත්මක සන්නිවේදන කුසලතා" නමැති පුහුණුකරුවන් පුහුණු කිරීමේ අත්පොතේ ප්‍රධාන කර්තෘ – ප්‍රකාශනය: එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල (UNFPA) සහ සෞඛ්‍ය අමාත්‍යාංශය ISBN – 9789558375174

එම්.කේ.ඕ.කේ. ද සිල්වා මිය

පුහුණු කටයුතුවලට සම්බන්ධ වීම්:

- මෝහාත්මක අක්‍රමිකතාව (ඊර්ෂ්‍යා පරවශ ප්‍රභේදය): මානසික සෞඛ්‍ය සේවාවන්ට ඉදිරිපත් වීමේ සංඛ්‍යාතය — සමීප සබඳතාවන්හි අසාමාන්‍ය ඊර්ෂ්‍යාව පිළිබඳ මනෝවිද්‍යාත්මක යාන්ත්‍රණ, මනෝ-සාමාජීය සහසම්බන්ධතා සහ වෙබ්-පාදක ප්‍රජා සමීක්ෂණය
- නාවුක හමුදා මහරෝහල (NGH), යුධහමුදා රෝහල හා ජෙනරල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලීය රෝහල (UH-KDU) වෙත දරුපල උෆණතාව පිළිබඳව වාර්තා කළ යුවතිපතීන්ගේ ජීවන ගුණාත්මකතාව, මනෝවිද්‍යාත්මක පීඩාව හා සබඳතා තෘප්තිය, උෆණ දරුපල පිළිබඳ ඔවුන්ගේ අත්දැකීම් සහ උෆණ දරුපල වටා ඇති මිථ්‍යා හා දුර්මත.
- ශ්‍රී ලංකාවේ ගර්භනී මව්වරුන් කණ්ඩායමක් අතර මාතෘ දිවියේ ගුණාත්මකතාව, ප්‍රසූති-පූර්ව ආතතිය ඇගයීම හා සමනය කර ගැනීම.
- ගර්භනී කාලය තුළ බර වැඩි වීමේ, ශරීර කෙරෙහි ආකල්පයේ හා මනෝවිද්‍යාත්මක චිත්ත පීඩාවේ ඵලය.
- ලිංගික අකර්මන්‍යතාවේ හා ලිංගික අතෘප්තියේ මනෝ-ලිංගික හා සාමාජීය සහසම්බන්ධතා
- එක්සත් රාජධානියේ වෙස්ට් ලන්ඩන් විශ්වවිද්‍යාලයෙහි සායනික හා සෞඛ්‍ය මනෝවිද්‍යාව පිළිබඳ එම්.එස්.සී. උපාධියේ ප්‍රමිතිලාභී කථිකාචාර්යවරියක් හා උපාධි නිබන්ධ අධීක්ෂිකාවක් ලෙස සම්බන්ධ වූවාය.
- බුත්තල නිලධාරී වෘත්තීය සංවර්ධන කේන්ද්‍රයේ (OCDC) ආරාධිත කථිකාචාර්යවරියක ලෙස සේවය සැලසුවාය.

ප්‍රකාශන

- මෝහාත්මක ඊර්ෂ්‍යාව තුළ සමීප සහකාර ප්‍රචණ්ඩත්වය: ආකර්ෂණීයත්වයේ හා ලිංගික තෘප්තියේ භූමිකාව - 3 වන ජාත්‍යන්තර සමාජ විද්‍යා හා මානව ශාස්ත්‍ර බර්ලින් සමුළුව, බර්ලින්, ජර්මනිය.
- "ශ්‍රී ලංකාව තුළ මෝහාත්මක ඊර්ෂ්‍යාව සහිත රෝගීන් තුළ ලිංගික සබඳතාවෙහි ගුණාත්මකතාව හා සබඳතා තෘප්තිය", 32 වන වාර්ෂික ජාත්‍යන්තර වෛද්‍ය සම්මේලනය, ශ්‍රී ලංකා වෛද්‍ය විද්‍යා සංගමය.
- "ශ්‍රී ලංකාවේ බහු-කෝෂ්ඨ ඩිම්බකෝෂ සහලක්ෂණය සහිත කාන්තාවන් තුළ ශරීරය පිළිබඳ සැලකිල්ල හා එහි මනෝ-සංස්කෘතික සාධක සමග ඇති සම්බන්ධය." 52 වන වාර්ෂික විද්‍යාත්මක සම්මේලනය, ප්‍රසවවේදීන්ගේ හා නාරිවේදීන්ගේ විද්‍යාලය - 2019
- "මෝහාත්මක ඊර්ෂ්‍යාව සහිත රෝගීන්ගේ සමීප සබඳතා තුළ සහකාර වටිණාකම හා අනෙකා කෙරෙහි ආධිපත්‍යය සමග එහි ඇති සම්බන්ධය" 2019 වර්ෂය තුළ සාක් මනෝචිකිත්සක සම්මේලනයේ 11 වන සමුළුවේදී හා ශ්‍රී ලංකා මනෝචිකිත්සක විද්‍යාලයේ 16 වන වාර්ෂික විද්වත් සැසිවාරයේදී පෝස්ටර් ඉදිරිපත් කිරීමක් සඳහා මෙය තෝරා ගනු ලැබීය. (2019 ඔක්තෝබර් 13–15).
- "ශ්‍රී ලංකාවේ සායනික උපකාර පතන ජනගහනය තුළ මෝහාන්විත ඊර්ෂ්‍යාවෙහි සමාජ-ජනසංයුතික ලක්ෂණ" 12 වන ජාත්‍යන්තර පර්යේෂණ සමුළුව, ජෙනරල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය - 2019.

වෛද්‍ය ඩී.එච්. ජයසේන

<u>ප්‍රකාශන:</u>

- පාඨ ග්‍රන්ථය: වෛද්‍ය විද්‍යාව ජයගන්න – අවසන් උපාධි පරීක්ෂණය සඳහා තනි හොඳම පිළිතුර තේරීමේ ප්‍රශ්න (SMA) - 300 ක් - 2 වන සංස්කරණය, හිරුණි ජයසේන, බෙන්ජමින් වුඩ් සහ සාරාන් ශාන්තිකුමාර්. (එක්සත් රාජධානියේ ටේලර් ඇන්ඩ් ෆ්‍රාන්සිස් සමූහය විසින් ප්‍රකාශයට පත් කිරීමට නියමිතය.)

වෛද්‍ය ඒ.එම්.එන්.එල්. ද සිල්වා

<u>පුහුණු කටයුතුවලට සම්බන්ධ වීම:</u>

2019 ජූනි මාසයේ සිට ශ්‍රී ලංකා ජාතික රෝහලේ අන්තෝසර්ගවේදය පිළිබඳ ජ්‍යෙෂ්ඨ ලේඛකාධිකාරී වශයෙන් පුහුණුව ලබමින් සිටී.

<u>ප්‍රකාශන</u>

- විශේෂාංග ලිපි සාකච්ඡාව - "ශ්‍රී ලංකා වෛද්‍ය සංගමය" (SLMA) පළකරන පුවත් සංදේශය තුළ පළවූ "ශ්වසන අපහසුතාව සහිත මැදිවියේ කාන්තාව: දුර්ලභ දුෂ්ශ්වසන (dyspnoea) රෝගී අවස්ථාවක්", 2019 ජූනි (12 වෙළුම, 06 කලාපය)
- නිපුන් ලක්ෂිත ද සිල්වා, ප්‍රවීන් වීරතුංග, තිරුඥානම් උමාපති, නීලිකා මලවිගේ, තාශි චෑං. ඩෙංගු උණ රෝගයේ අතුරු-ආසාදන විද්‍යමාන වීමක් වශයෙන් වර්ධනය වන මිලර් ෆිශර් සහලක්ෂණය: සිද්ධි අධ්‍යයනයක් සහ ලියවී ඇති දේ සමාලෝචනයක්. වෛද්‍ය සිද්ධි වාර්තා ජර්නලය, 2019
- පොන්සුගේ චතුරානි සිගේරා, රන්මලී අමරසේකර, චතුරිකා රොඩ්‍රිගෝ, සේනක රාජපක්ෂ, ප්‍රවීන් වීරතුංග, නිපුන් ලක්ෂිත ද සිල්වා, චුන් හොං හුවාං, මලයා කේ. සාහූ, බෙන්ජමින් ඒ. පින්ස්කි, ඩිලන් ආර්. පිල්ලයි, හසිත ඒ. තිසේරා, සරෝජ් ජයසිංහ, ශිරෝමා හඳුන්නෙත්ති, සුමධ්‍යා ඩී. ප්‍රනාන්දු. තදබල රෝග සඳහා අවදානම් පුරෝකථනය හා මුල් ඩෙංගු ආසාදනයේදී වඩා යහපත් රෝගවිනිශ්චය නිරවද්‍යතාව: කොළඹ ඩෙංගු අධ්‍යයනය. ජෙව-වෛද්‍ය කේන්ද්‍ර (BMC) ආසාදන රෝග - 2019.
- නිපුන් ලක්ෂිත ද සිල්වා, සුරන්ජිත් සෙනෙවිරත්න. සිස්ටීමික් ලූපස් එරිතිමටෝසස් (දෝෂ සහගත ප්‍රතිශක්ති අධික්‍රියාකාරිත්ව) රෝගයේදී රක්ත ශෘෂ්ඨීක ස්ටෙම් ශෛල බද්ධ කිරීම: ක්‍රමානුකූල සමාලෝචනයක්. ආසාත්මිකතාව, ඇදුම හා සායනික ප්‍රතිශක්තිවේදය, 2019
- සේනක රාජපක්ෂ, නිපුන් ලක්ෂිත ද සිල්වා, ප්‍රවීන් වීරතුංග, චතුරිකා රොඩ්‍රිගෝ, චතුරානි සිගේරා, සුමධ්‍යා දීපිකා ප්‍රනාන්දු. ඩෙංගු රෝගයේදී කැරිකා පැපායා (ගස්ලබු) සාරය: ක්‍රමානුකූල සමාලෝචනයක් හා බහු-මූලාශ්‍ර විශ්ලේෂණයක්. ජෙව-වෛද්‍ය කේන්ද්‍ර (BMC) පරිපූරක හා වෙකල්පික වෛද්‍ය විද්‍යා සඟරාව, 2019
- පොන්සුගේ චතුරානි සිගේරා, රන්මලී අමරසේකර, චතුරිකා රොඩ්‍රිගෝ, සේනක රාජපක්ෂ, ප්‍රවීන් වීරතුංග, නිපුන් ලක්ෂිත ද සිල්වා, චුන් හොං හුවාං, මලයා කේ. සාහූ, බෙන්ජමින් ඒ. පින්ස්කි, ඩිලන් ආර්. පිල්ලයි, ශිරෝමා හඳුන්නෙත්ති, සුමධ්‍යා ඩී. ප්‍රනාන්දු. තදබල රෝග සඳහා අවදානම් පුරෝකථනය හා මුල් ඩෙංගු ආසාදනයේදී වඩා යහපත් රෝගවිනිශ්චය නිරවද්‍යතාව: කොළඹ ඩෙංගු අධ්‍යයනය. බී.එම්.සී. ආසාදන රෝග - 2019. ශ්‍රී ලංකාවේ කොළඹ නගරය තුළ තනි නල ප්‍රතිවර්ත්‍ය අනුලේඛ පුඩු මධ්‍යවර්තී සමෝෂ්ණ විස්තාරණය (Single Tube Reverse-Transcription-Loop-Mediated Isothermal Amplification — RT-LAMP) ශ්‍රී ලංකා වෛද්‍ය විද්‍යා සංගමයේ 132 වන සංවත්සර ජාත්‍යන්තර වෛද්‍ය සම්මේලනයේ කාර්යසැසි, 2019
- පොන්සුගේ චතුරානි සිගේරා, රන්මලී අමරසේකර, චතුරිකා රොඩ්‍රිගෝ, සේනක රාජපක්ෂ, ප්‍රවීන් වීරතුංග, නිපුන් ලක්ෂිත ද සිල්වා, චුන් හොං හුවාං, මලයා කේ. සාහූ, බෙන්ජමින් ඒ. පින්ස්කි, ඩිලන් ආර්. පිල්ලයි, සරෝජ් ජයසිංහ, ශිරෝමා හඳුන්නෙත්ති, දීපිකා ප්‍රනාන්දු. මුල් ඩෙංගු ආසාදනයේදී තදබල රෝගී තත්ත්වය පිළිබඳව අවදානම් පුරෝකථනය; කොළඹ ඩෙංගු අධ්‍යයනය. 6වන ආසියා ශාන්තිකර දැඩි සත්කාර සංසද කාර්යසැසි, 2019
- රණතුංග අයි., දිල්රුක්ෂි එම්.ඩී.එස්.ඒ., රත්නසාමි වී. විජේවික්‍රම පී.එස්.ඒ., ද සිල්වා ඒ.එම්.එන්.එල්., නවීන්කුමාර් ජේ.පී., ගුරුසිංහ සී., සුමනතිලක එම්., සෝමසුන්දරම් එන්.පී. - විටමින් 'ඩී' ඌණතාව, ආශ්‍රිත සාධක හා විභව්‍ය අහිතකර ප්‍රතිවිපාක – කොළඹ තෘතීය උපස්ථායක ආයතනයකදී ප්‍රාරම්භක අධ්‍යයනයක්. ශ්‍රී ලංකා අන්තරාසර්ග කොන්ග්‍රසයේ කාර්යසැසි, 2019.
- ද සිල්වා ඒ.එම්.එන්.එල්., මුෆිනා එම්.එන්.එෆ්., සෑම් ජී., දයාරත්න එස්., කුමාරි එල්.ඊ.ඩී.අයි., විජේරත්න ඩී.ආර්., පටබැඳිගේ සී.ජී.යූ.ඒ., ජයසිංහ එස්. ශ්‍රී ලංකා ජාතික රෝහලේ විශ්වවිද්‍යාල වෛද්‍ය ඒකකයේ බාහිර රෝගී ඒකකවලට පැමිණෙන වකුගඩු රෝගය සහිත හා රහිත රෝගීන් අතර ස්ටැෆිලෝකොකල් වාහක අනුපාතික සන්සන්දනයක්. ලංකා වෛද්‍ය වෘත්තිකයින්ගේ විද්‍යාලයේ 52 වන වාර්ෂික විද්වත් සැසිවාරයේ කාර්යසැසි, 2019.

- පාඨ ග්‍රන්ථය: සේනක රාජපක්ෂ, නිපුන් ලක්ෂිත ද සිල්වා, අනෝජා රාජපක්ෂ. එම්.බී.බී.එස්. උපාධි අවසන් පරීක්ෂණ සඳහා දීර්ඝ සිද්ධි සාකච්ඡා. කුමරන් පොත් මැදුර, කොළඹ.

<u>ජයග්‍රහණ</u>

- කොළඹ විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි වෛද්‍ය ආයතනය වෙතින් වෛද්‍ය විද්‍යාව සඳහා එම්.ඩී. උපාධි සුදුසුකම් ලබා ඇත.
- ලංකා වෛද්‍ය වෘත්තිකයින්ගේ විද්‍යාලයේ 2019 වර්ෂයේ 52 වන සංවත්සර විද්වත් සැසිවාරයේදී විශිෂ්ටතම පෝස්ටර් ඉදිරිපත් කිරීම වෙනුවෙන් මහාචාර්ය කේ. රාජසූරිය සම්මානය ලැබීය.

හර්ශි අබේගුණවර්ධන මහත්මිය

<u>ප්‍රකාශන</u>

- හේරත් එච්.එම්.එම්.කේ., අබේගුණවර්ධන එච්., කරුණාරත්න එච්.එම්.එස්., සේනානායක එම්.පී. 2019. ශ්‍රී ලංකාවේ ජාතික රෝහලෙහි ශල්‍ය ඒකකයක වර්ම පුළුන් සාම්පල වෙතින් වෙන්කර ගත් කැටිගැසුම්කාරක නිෂේධ ස්ටැෆිලෝකොකල් වියෝජකයන්හි ප්‍රතිජීවක නැඹුරුතා රටා හා වසංගතවේදය. ශ්‍රී ලංකා ක්ෂුද්‍රජීවවේදීන්ගේ විද්‍යාලයේ 28 වන වාර්ෂික විද්‍යාත්මක සැසිවාරයේදී හා ආසාදන රෝග සහ ආසාදන නිවාරණය හා පාලනය පිළිබඳ 50 වන සාංවත්සරික සමුළුවේදී පෝස්ටර් ඉදිරිපත් කිරීම. කාර්යසැසි 17 වෙළුම, 2019 අගෝස්තු, ISSN 1391-930X. 24-25 පිටු.
- දුලාංජලී එස්.කේ.එම්., අබේගුණවර්ධන එච්., කරුණාරත්න එච්.එම්.එස්., සේනානායක එම්.පී. 2019. කැටිගැසුම්කාරක නිෂේධ ස්ටැෆිලෝකොකල් වියෝජකයන් තුළ වැන්කොමයිසින් නම්‍යතාව පරීක්ෂාව සඳහා තැම්බුම්සාර සූක්ස්ම තනුකකරණ (broth microdilution) පරීක්ෂාව හා එප්සයිලෝමීටර් පරීක්ෂා (Etest) සන්සන්දනය කිරීම. ශ්‍රී ලංකා ක්ෂුද්‍රජීවවේදීන්ගේ විද්‍යාලයේ 28 වන වාර්ෂික විද්‍යාත්මක සැසිවාරයේදී හා ආසාදන රෝග සහ ආසාදන නිවාරණය හා පාලනය පිළිබඳ 50 වන සාංවත්සරික සමුළුවේදී පෝස්ටර් ඉදිරිපත් කිරීම. කාර්යසැසි 17 වෙළුම, 2019 අගෝස්තු, ISSN 1391-930X. 25–26 පිටු.
- අබේගුණවර්ධන එච්. මයුරන් එස්., ජයවර්ධන ජේ., විජේසිංහ ආර්.ඒ.එන්.කේ., නවරත්න පී.බී.වී., බාලසූරිය ඒ., ද සිල්වා ඒ.ඩී. 2019. වාණිජමය එන්සයිම-බද්ධ ප්‍රතිශක්ති-ග්‍රාහක මිනුම් දෙකක් භාවිත කරමින් ‘ඩෙංගු-වයිරස් මර්ධන ඉම්‍යුනෝග්ලොබියුලින්’ (anti-DENV IgG) හෝ අතීත ‘ඩෙංගු වයිරස්’ (DENV) ආසාදනය සෙවීම. ශ්‍රී ලංකා ක්ෂුද්‍රජීවවිද්‍යා සංගමයේ [SSM] 8 වන වාර්ෂික සමුළුව හා විද්‍යාත්මක සැසිවාරය තුළ වාචික ඉදිරිපත් කිරීම - 2019, 7 වෙළුම, ISSN 2345-9646, 05 පිටුව
- දිසානායක සී., අබේගුණවර්ධන එච්., කරුණාරත්න එච්.එම්.එස්., සේනානායක එන්.පී., 2019. තෘතීය සත්කාර රෝහලක නේවාසික රෝගීන් අතර ස්ටැෆිලෝකොකස් ඕරියස් නාසික ප්‍රවාහනය සහ ප්‍රතිජීවක නම්‍යතා රටා. ශ්‍රී ලංකා ක්ෂුද්‍රජීවවිද්‍යා සංගමයේ [SSM] 8 වන වාර්ෂික සමුළුව හා විද්‍යාත්මක සැසිවාරය තුළ පෝස්ටර් ඉදිරිපත් කිරීම - 2019, 7 වෙළුම, ISSN 2345-9646, 29 පිටුව
- එන්.පී. සේනානායක, එෆ්.එස්. සැලී, එච්. අබේගුණවර්ධන, එච්.එම්.එස්. කරුණාරත්න, එන්.එස්. චන්ද්‍රසිරි. ශ්‍රී ලංකාවේ තෘතීය සත්කාර රෝහලක මෙතිසිලින්වලට ප්‍රතිරෝධී ස්ටැෆිලෝකොකස් ඕරියස් බැක්ටීරියාවට වැන්කොමයිසින් සංයෝගයේ අවම ප්‍රතිෂේධාත්මක සාන්ද්‍රතාව, ලංකා වෛද්‍ය විද්‍යා ජර්නලය, 2019, 56 වෙළුම (2 කලාපය) - ප්‍රකාශයට පත් කිරීම අපේක්ෂිතය.

2.1.4 ඉංජිනේරු පීඨය

හැඳින්වීම

ගගනයාත්‍රා ඉංජිනේරු අධ්‍යයනාංශය, සිවිල් ඉංජිනේරු අධ්‍යයනාංශය, විදුලි, විද්‍යුත් හා විදුලිසංදේශ ඉංජිනේරු අධ්‍යයනාංශය, සමුද්‍රීය ඉංජිනේරු අධ්‍යයනාංශය, යාන්ත්‍රික ඉංජිනේරු අධ්‍යයනාංශය හා ගණිත අධ්‍යයනාංශය යන අධ්‍යනාංශ 6 න් සහ කර්මාන්ත පුහුණු ඒකකයෙන් ඉංජිනේරු පීඨය සමන්විත වෙයි. මෙම පීඨය එකිනෙකට වෙනස් විෂය ක්ෂේත්‍ර 9 ක් තුළ ශිෂ්‍යාහට නිලධාරින් සඳහා අවුරුදු 4½ ක හා දිවා විද්‍යාර්ථීන් සඳහා අවුරුදු 4 ක කාලයක බී.එස්.සී. ඉංජිනේරු උපාධි පිරිනමයි. ඉංජිනේරු උපාධි වැඩසටහන් සඳහා සංයුක්ත ශිෂ්‍ය කාණ්ඩයක් ඇතුළත් කර ගැනේ. ජෙනරල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය සාක් (දකුණු ආසියානු කලාපීය සහයෝගිතා සංගමයට අයත්) කලාපයේ විදේශීය ශිෂ්‍ය-ශිෂ්‍යාවන්ට උපාධි ඉදිරිපත් කිරීමෙහිද නිරත වූ අතර මේ වන විට එය මුදල් අයකිරීමේ පදනම මත සියලුම මිත්‍ර රටවල් සඳහා විවෘතය. 2013 වර්ෂයේදී මෙම පීඨය නව උපාධි වැඩසටහන් 3 ක් ඇරඹීය. එම නව උපාධි වන්නේ: යාන්ත්‍ර-විද්‍යුත් ඉංජිනේරු විද්‍යාව පිළිබඳ බී.එස්.සී. ඉංජිනේරු උපාධිය, ජීව-වෛද්‍ය ඉංජිනේරු විද්‍යාව පිළිබඳ බී.එස්.සී. ඉංජිනේරු උපාධිය හා ගුවන්යානා නඩත්තු ඉංජිනේරු විද්‍යාව පිළිබඳ බී.එස්.සී. ඉංජිනේරු උපාධියයි.

ත්‍රිවිධ හමුදාවන්ට අධ්‍යයනමය වශයෙන් සුදුසුකම් ලත් නිලධාරීන් බිහි කිරීම උදෙසා ඉංජිනේරු පීඨය විසින් ඉටුකරන ලද කාර්යභාරය ඉතා සුවිශේෂී වේ. මෙම පීඨය සියලුම අධ්‍යයන වැඩසටහන් මෙහෙයවීමට සීමා නොවී, තරුණ කෙඩෙට් නිලධාරින්ගේ සෑම බුද්ධිමය ප්‍රයත්නයකටදීම සම්බන්ධ වන අතර, විශ්වවිද්‍යාලයේ විෂය-සමගාමී හා විෂය-බාහිර ක්‍රියාකාරකම්වලට නවමු වෙනස්කම් හඳුන්වා දෙයි.

ජෙනරල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයෙහි මෙහෙයවනු ලබන අධ්‍යයන වැඩසටහන් වෙනත් කීර්තිමත් විශ්වවිද්‍යාල සමග සම වන සේ ඉතා ඉහළ ප්‍රමිතියකින් පවත්වා ගෙන යනු ලැබේ. මෙම අධ්‍යයන වැඩසටහන් ස්වාධීන ලෙස පවත්වා ගෙන යනු පිණිස ජෙනරල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය සතුව සුදුසුකම් ලත් අධ්‍යයන කාර්ය මණ්ඩලයක් සිටින අතරම එයට මොරටුව විශ්වවිද්‍යාලයේ හා විවෘත විද්‍යාලයේ මෙන්ම ත්‍රිවිධ හමුදාවන්හි හා කර්මාන්ත ක්ෂේත්‍රයන්හි ආරාධිත කථිකාචාර්යවරුන්ගේ හා උපදේශකවරුන්ගේ සේවාවන් ලබාගැනීමේ වරප්‍රසාදය ඇත.

ප්‍රධාන පත්වීම්හි වෙනස්කම් (හමුදා/අධ්‍යයන)

- සිවිල් ඉංජිනේරු අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය ටී.එම්.ඩබ්ලියු.ආර්.එම්.බී. සමරකෝන් ඉංජිනේරු පීඨයේ පීඨාධිපති වශයෙන් 2019 අප්‍රේල් 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි පත්කරන ලදී.
- ආචාර්ය ඩබ්ලියු.සී.ඩී.කේ. ප්‍රනාන්දු ඉංජිනේරු පීඨයේ පීඨාධිපති ධුරය 2019 මාර්තු 31 වන දින අවසන් කර ඇත.
- පී.පී.එස්.එස්. පුස්සපිටිය මහත්මිය යාන්ත්‍රික ඉංජිනේරු අධ්‍යයනාංශයේ අධ්‍යයනාංශය ප්‍රධානී ලෙස සිය ධුරකාලය 2019 පෙබරවාරි 28 වන දින සම්පූර්ණ කර ඇත.
- ඩබ්ලියු.එස්.පී. ප්‍රනාන්දු මහතා යාන්ත්‍රික ඉංජිනේරු අධ්‍යයනාංශයේ අධ්‍යයනාංශය ප්‍රධානී ලෙස 2019 අගෝස්තු 31 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි මාස 6 ක කාලපරිච්ඡේදයක් සඳහා පත්කර ඇත.
- කපිතාන් (ඉංජිනේරු) එම්.සී.පී. දිසානායක යාන්ත්‍රික ඉංජිනේරු අධ්‍යයනාංශයේ නව අධ්‍යයනාංශය ප්‍රධානී ලෙස 2019 සැප්තැම්බර් 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි පත්කර ඇත.
- ගaaජ් කපිතාන් සී.ජේ. හෙට්ටිආරච්චි ගගනයාත්‍රා ඉංජිනේරු අධ්‍යයනාංශයේ අධ්‍යයනාංශ ප්‍රධානී ලෙස සිය ධුරකාලය 2019 අගෝස්තු 01 වන දින අවසන් කර ඇත.
- වින්ග් කමාන්ඩර් යූ.ඩී.එල්.පී. ගුණසිංහ ගගනයාත්‍රා ඉංජිනේරු අධ්‍යයනාංශයේ නව අධ්‍යයනාංශ ප්‍රධානී ලෙස 2019 අගෝස්තු 06 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි පත් කර ඇත.
- කපිතාන් (ඉංජිනේරු) එම්.සී.පී. දිසානායක සමුද්‍රීය ඉංජිනේරු අධ්‍යයනාංශයේ නව අධ්‍යයනාංශ ප්‍රධානී ලෙස 2019 අගෝස්තු 04 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි පත්කර ඇත.
- ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය ආර්.පී. කුමානායක සිවිල් ඉංජිනේරු අධ්‍යයනාංශයේ අධ්‍යයනාංශ ප්‍රධානී ලෙස 2019 මැයි 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි පත්කර ඇත.
- ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය ආර්.පී. කුමානායක 2019 ජනවාරි–අප්‍රේල් කාලපරිච්ඡේදය සඳහා සහ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය ටී.ඩබ්ලියු.කේ.අයි.එම්. ඩයස් 2019 මැයි සිට ඉංජිනේරු පීඨයේ ගුණාත්මකතා සහතිකකරණ කෝෂයේ සභාපති ලෙස පත්කර ඇත.
- ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය ඩී.ඩී.ටී.කේ. කුලතුංග 2019 වර්ෂය සඳහා ඉංජිනේරු පීඨයේ පර්යේෂණ කෝෂයේ සභාපති ලෙස පත්කර ඇත.

<u>නව බඳවා ගැනීම් (හමුදා/අධ්‍යයන)</u>

නම	තනතුරු	රාජකාරි භාර ගත් දිනය
සමුද්‍රීය ඉංජිනේරු විද්‍යා අධ්‍යයනාංශය		
<u>හමුදා</u>		
ලුතිනන් කමාන්ඩර් එස්එස්යූකේ ප්‍රනාන්දු	කථිකාචාර්ය	2019.08.29
යාන්ත්‍රික ඉංජිනේරු අධ්‍යයනාංශය		
<u>හමුදා</u>		
කපිතාන් එස්ඒඒකේ අතුකෝරළ		2019.03.15

<u>යටිතල පහසුකම් සංවර්ධන - නව ව්‍යාපෘති</u>

ගගනයාත්‍රා ඉංජිනේරු අධ්‍යයනාංශය

- ගුවන් යානා අමතර කොටස් ප්‍රදර්ශන භාණ්ඩ සඳහා ආවරණ ස්ථානයක් ඉදිකිරීම

විදුලි, විද්‍යුත් හා විදුලිසංදේශ ඉංජිනේරු අධ්‍යයනාංශය

නව ඉංජිනේරු පීඨ ගොඩනැගිල්ලේ පහත සඳහන් පරීක්ෂණාගාර භාර දීම

- අංකිත පද්ධති නිර්මාණකරණ පරීක්ෂණාගාරය
- බල විද්‍යුත්පරීක්ෂණාගාරය
- සන්නිවේදන පරීක්ෂණාගාරය
- ජීව යාන්ත්‍ර විද්‍යා පරීක්ෂණාගාරය
- පටක ඉංජිනේරු විද්‍යා පරීක්ෂණාගාරය
- ජීව-වෛද්‍ය විද්‍යා උපකරණ පරීක්ෂණාගාරය

ඉංජිනේරු පීඨයේ එච්.වී. පරීක්ෂණාගාරය භාර දීම හා ප්‍රායෝගික අත්හදා-බැලීම් ඇරඹීම.

සමුද්‍රීය ඉංජිනේරු විද්‍යා අධ්‍යයනාංශය

ඉංජිනේරු පුහුණු වැඩමුළුව

ඉංජිනේරු පුහුණු වැඩහලෙහි පුහුණු පහසුකම් පහත පරිදි ඉඩකඩ අත්කර ගැනීම හා වැඩ අවකාශය යලි ව්‍යුහගත කිරීම මගින් වැඩිදියුණු කරන ලදී:-

- වැඩහල වර්ණාලේප කොට ආරක්ෂක පෝස්ටර්/ උපදෙස් පුවරු වැඩහල තුළ ප්‍රදර්ශනය කරන ලදී.
- සියලුම දැව භාණ්ඩ සහ දැව ලොකර අළුත්වැඩියා කර වර්ණාලේප කරන ලදී.
- සියලුම විදුලි බුබුලු වෙනුවට එල්.ඊ.ඩී. පහන් සවිකරන ලදී.
- පුහුණු කාර්ය සඳහා ආවුද ප්‍රදර්ශන පුවරුවක් තනන ලදී.
- ලොකර යතුරු එල්ලනු පිණිස පුවරුවක් පිළියෙළ කරන ලදී.
- වැඩහල බිමෙහි ආරක්ෂක ඉම් සලකුණු කිරීමේ රේඛා අඳින ලදී.
- වෙල්ඩිං කිරීමේ කුටියට ආවරණ තිර එක්කරන ලදී.
- ගිනි නිවීම් උපකරණය දැරීමට එල්ලනයක් තනන ලදී.
- වායුපීඩක යන්ත්‍රය අළුත්වැඩියා කර ක්‍රියා කරන තත්ත්වයට ගෙන එන ලදී.

<u>කාර්ය මණ්ඩල සංවර්ධන ක්‍රියාකාරකම්</u>

ගගනයාත්‍රා ඉංජිනේරු අධ්‍යයනාංශය

- ගෲප් කපිතාන් සී.ජේ. හෙට්ටිආරච්චි කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය විසින් මෙහෙයවන ලද උසස් අධ්‍යාපනය තුළ ඉගැන්වීම පිළිබඳ සහතික පත්‍ර (CTHE) වැඩසටහනට සහභාගි විය.

සිවිල් ඉංජිනේරු අධ්‍යයනාංශය

- මෙම අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් වන ආචාර්ය ඩී.ඩී.ටී.කේ. කුලතුංග, ආචාර්ය ටී.ඩබ්ලියු.කේ.අයි.එම්. ඛයස් හා බී.එච්.ජේ. පුෂ්පකුමාර මහතා උසස් අධ්‍යාපනය තුළ ඉගැන්වීම පිළිබඳ සහතික පත්‍ර (CTHE) වැඩසටහන සම්පූර්ණ කළහ.

විදුලි, විද්‍යුත් හා විදුලිසංදේශ ඉංජිනේරු අධ්‍යයනාංශය

- මෙම අධ්‍යයනාංශයේ කාර්ය මණ්ඩල සාමාජිකයෝ ඔරෙල් කෝපරේෂන් නමැති සමාගම විසින් මෙහෙයවන ලද එන්.අයි.-එල්විස් (නැෂනල් ඉන්ස්ට්‍රුමන්ට්ස් ඉංජිනේරු පරීක්ෂණාගාර තථ්‍යරූපී උපකරණාවලිය) පිළිබඳ වැඩමුළුවකට සහභාගි වූහ.
- මෙම අධ්‍යයනාංශයේ කාර්ය මණ්ඩල සාමාජිකයෝ ඔරෙල් කෝපරේෂන් නමැති සමාගම විසින් මෙහෙයවන ලද රොබෝ විද්‍යා පාලක පිළිබඳ වැඩමුළුවකට සහභාගි වූහ.

සමුද්‍රීය ඉංජිනේරු අධ්‍යයනාංශය

- කාර්ය මණ්ඩල සාමාජික සාමාජිකාවෝ උචිත පරිදි කලින් කලට පවත්වනු ලැබූ ආරාධිත දේශනවලට සහභාගි වූහ.

<u>පුහුණු කටයුතුවලට සම්බන්ධ වීම/ ජයග්‍රහණ</u>

ගගනයාත්‍රා ඉංජිනේරු අධ්‍යයනාංශය

- ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය එස්.එල්.එම්.ඩී. රංගජීව මහතා ශ්‍රී ලංකාවේ ඉංජිනේරුවරුන්ගේ ආයතනයේ 113 වන වාර්ෂික සැසිවාරයේදී 'අපසාරී තුඩුහිස තුළින් ප්‍රවාහය වීම විශ්ලේෂණය කිරීම් මෘදුකාංගය සංවර්ධනය කිරීම පිළිබඳ පත්‍රිකාවක් ඉදිරිපත් කළේය.

- උපදේශක ඩබ්ලිව්ඩීටී ප්‍රනාන්දු මහතා විසින් 2019 පෙබරවාරි 28 වන දින කොඅාවි හි පැවති ඉංජිනේරු පීඨ පර්යේෂණ සම්මන්ත්‍රණයේදී —කේඑෆ් ක්‍රියාත්මක කරන ලද ෆ්ලයින්ග් විත්ග් හි උසස් ආකෘති නිර්මාණය පිළිබඳ ලිපියක් ඉදිරිපත් කරන ලදී.

සිවිල් ඉංජිනේරු අධ්‍යයනාංශය

- සම සෞඛ්‍ය විද්‍යා පුස්තකාලයේ සහකාර පුස්තකාලයාධිපති යූ.ඩී.එච්. කාංචනා මහත්මිය 2019/2020 වර්ෂය සඳහා ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ තොරතුරු තාක්ෂණ කැඳවුම්කරු ලෙස පත් කර තිබේ.

- ප්‍රධාන පුස්තකාලයේ සහකාර පුස්තකාලයාධිපති වී අලගරත්නම් මහතා, ප්‍රධාන පුස්තකාලය, චෙඩිපාලයම්, මඩකලපුව විසින් ප්‍රකාශයට පත් කරන ලද පද්දරෙයි සඟරාවේ ප්‍රධාන කර්තෘ ලෙස පත් කරන ලදී.

<u>විශේෂ සිදුවීම්/උත්සව</u>

- **<u>ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල පුස්තකාලයාධිපතිවරුන්ගේ වාර්ෂික මහා සභා රැස්වීම</u>**

ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල පුස්තකාලයාධිපතිවරුන්ගේ සංගමයේ (යූඑල්ඒ) තිස් හත්වන මහා සභා රැස්වීම 2019 සැප්තැම්බර් 19 වන දින ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේදී මෙරට අධ්‍යාපන පුස්තකාලයාධිපතිවරුන් නියෝජනය කරන යූඑල්ඒ සාමාජිකයින්ගේ සහභාගීත්වයෙන් පවත්වන ලදි. 2018/2019 වර්ෂය සඳහා ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල පුස්තකාලයාධිපතිවරුන්ගේ සංගමයේ පාලක මණ්ඩලය ලෙස කොඅාවි පුස්තකාලය මෙම උත්සවය සංවිධානය කළේය. සම්මාන ප්‍රදානෝත්සවය සහ වාර්ෂික පර්යේෂණ සම්මාන වාර්ෂික මහා සභා රැස්වීමේ සමාරම්භක සැසියේ කැපී පෙනෙන සිදුවීම් විය.

<u>මූල්‍ය කරුණු</u>

පහත වගුව 2018 වර්ෂය තුළ කොඅාවි පුස්තකාල ජාලය මගින් උපයන ලද ආදායම පෙන්වයි.

ආදායම් ප්‍රවර්ගය	**ප්‍රධාන පුස්තකාලය (රු.)**	**FAHS පුස්තකාලය (රු.)**	**FOM පුස්තකාලය (රු.)**	**දක්ෂිණ පුස්තකාලය (රු.)**
නැවත භාරදීමට පමාවූ පොත් සඳහා දඩ	139,930.00	41,380.00	42,820.00	90.00
නැතිවූ පොත් සඳහා දඩ	5,536.00	-	-	-
නැතිවූ අවසර පත්‍ර සඳහා දඩ	9,650.00	600.00	2000.00	500.00
ඡායා පිටපත් ගාස්තු	19,037.00	19,906.00	12038.00	-
එකතුව	174,153.00	61,886.00	56,858.00	590.00
මුළු එකතුව	රුපි.293,487.00			

<u>පුස්තකාල සේවා</u>

<u>පාඨක සේවා</u>

පහත විස්තර කර ඇති පරිදි 2019 වර්ෂය තුළ ප්‍රධාන පුස්තකාලය, FOM පුස්තකාලය සහ FAHS පුස්තකාලය මගින් විවිධ පරිශීලක ප්‍රවර්ග සඳහා නව සාමාජිකත්ව නිකුත් කර ඇත.

පුස්තකාලය	**පරිශීලක ප්‍රවර්ගය**		**පරිශීලකයන් ගණන**
ප්‍රධාන පුස්තකාලය	උපාධි අපේක්ෂක	කෙඩෙට් නිලධාරීන් දිවා විද්‍යාර්ථීන්	161 422
	පශ්චාත් උපාධි සිසුන්	විද්‍යාපති ව්‍යාපාර පරිපාලනපති විද්‍යාවේදී නීතිපති	46 42 16 58
		ආචාර්ය උපාධිය	13
	අධ්‍යයන කාර්ය මණ්ඩලය	සිවිල් හමුදා	10 18
	අනධ්‍යයන කාර්ය මණ්ඩලය	සිවිල් හමුදා	06 03
	එකතුව		**795**

FAHS පුස්තකාලය	උපාධි අපේක්ෂක	දිවා විද්‍යාර්ථීන්	244
	සිවිල් කාර්ය මණ්ඩලය	අධ්‍යයන කාර්ය මණ්ඩලය පරිපාලන කාර්ය මණ්ඩලය වෙනත් කාර්ය මණ්ඩලය	08
	එකතුව		**252**
FOM පුස්තකාලය	උපාධි අපේක්ෂක	කෙඩෙට් නිලධාරින් දිවා විද්‍යාර්ථීන්	39 27
	සිවිල් කාර්ය මණ්ඩලය	අධ්‍යයන කාර්ය මණ්ඩලය වෙනත් කාර්ය මණ්ඩලය	01
	එකතුව		**67**
දක්ෂිණ මණ්ඩප පුස්තකාලය	උපාධි අපේක්ෂක	කෙඩෙට් නිලධාරින් දිවා විද්‍යාර්ථීන්	27 139
	සිවිල් කාර්ය මණ්ඩලය	අධ්‍යයන කාර්ය මණ්ඩලය අනධ්‍යයන කාර්ය මණ්ඩලය	12 05
	එකතුව		**183**

<u>අන්තර් පුස්තකාල ණය සේවාව</u>

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, මොරටුව විශ්වවිද්‍යාලය සහ සබරගමුව විශ්වවිද්‍යාලය වැනි විශ්වවිද්‍යාල පුස්තකාල සමඟ සහයෝගයෙන් අන්තර් පුස්තකාල ණය සේවාවක් ලබා දීමට කොඇවි පුස්තකාල ජාලයට හැකි විය.

<u>ලේඛන බෙදා හැරීමේ සේවාව</u>

පුස්තකාලය	**පර්යේෂණ ලිපි සහ ඊ පොත් ගණන**
ප්‍රධාන පුස්තකාලය	ලිපි 129, ඊ පොත් 37
FOM	ලිපි 91, ඊ පොත් 03
FAHS	ලිපි 20
දක්ෂිණ මණ්ඩපය	ලිපි 184, ඊ පොත් 52

<u>පිටපත් කිරීම පරීක්ෂා කිරීම</u>

පහත වගුවේ විවිධ පීඨවල විවිධ වර්ගයේ ලේඛන, පිටපත් කිරීම් සඳහා පරීක්ෂා කර ඇති සංඛ්‍යාව දැක්වේ.

පීඨය	**ලේඛනයේ වර්ගය**	**ලේඛන සංඛ්‍යාව**
FGS	නිබන්ධනය/ නිබන්ධන/ පැවරුම්	144
	පර්යේෂණ පත්‍රිකා	-
	වාර පත්‍ර සහ පෝට්ෆෝලියෝ	-
FOM	නිබන්ධනය/ නිබන්ධන/ පැවරුම්	-
	පර්යේෂණ පත්‍රිකා	-
	වාර පත්‍ර සහ පෝට්ෆෝලියෝ	04
FOE	නිබන්ධනය/ නිබන්ධන/ පැවරුම්	105
	පර්යේෂණ පත්‍රිකා	14
	වාර පත්‍ර සහ පෝට්ෆෝලියෝ	-
FOL	නිබන්ධනය/ නිබන්ධන/ පැවරුම්	106
	පර්යේෂණ පත්‍රිකා	-
	වාර පත්‍ර සහ පෝට්ෆෝලියෝ	17
FMSH	නිබන්ධනය/ නිබන්ධන/ පැවරුම්	19

	පර්යේෂණ පත්‍රිකා	-
	වාර පත්‍ර සහ පෝට්ෆෝලියෝ	-
FOM	නිබන්ධනය / නිබන්ධන / පැවරුම්	-
	පර්යේෂණ පත්‍රිකා	-
	වාර පත්‍ර සහ පෝට්ෆෝලියෝ	-
FAHS	නිබන්ධනය/ නිබන්ධන/ පැවරුම්	06
	පර්යේෂණ පත්‍රිකා	144
	වාර පත්‍ර සහ පෝට්ෆෝලියෝ	-
FBESS	නිබන්ධනය/ නිබන්ධන/ පැවරුම්	162
	පර්යේෂණ පත්‍රිකා	-
	වාර පත්‍ර සහ පෝට්ෆෝලියෝ	-

සංවර්ධනය සඳහා දායකවීම්

පොත්

කොආවි පුස්තකාල ජාලයට පොත් මිලදී ගැනීම සහ පරිත්‍යාග සමඟ එහි එකතුව ශක්තිමත් කිරීමට හැකි විය. පහත වගුවේ දැක්වෙන්නේ මිලදී ගැනීම් සහ පරිත්‍යාගවල වටිනාකම් සහ ප්‍රමාණයන්ය.

පුස්තකාලය	මිලදී ගත්		පරිත්‍යාග	
	පොත් සංඛ්‍යාව	අගය (රු.)	පොත් සංඛ්‍යාව	අගය (රු.)
ප්‍රධාන පුස්තකාලය	53	837,167.66	469	195,420.21
FAHS පුස්තකාලය	182	1,010,115.00	33	74,136.29
FOM පුස්තකාලය	121	569,166 .00	141	1,090,292.56
දක්ෂිණ මණ්ඩප පුස්තකාලය	-	-	83	1,141,302.00

මුද්‍රිත ජර්නල

පහත සඳහන් සහරාවල දායකත්වය 2019 වර්ෂය තුළ අලුත් කරන ලදී.

- Fortune
- Times
- Readers' Digest
- LMD
- National Geography

ඊ - සම්පත්

පහත වගුවේ 2019 වර්ෂයේ ඊ සම්පත් සඳහා යොදා ගත් අයවැය පිළිබඳ දැක්වේ.

	දත්ත සමුදායේ නම	මිල	කාලය
1	Lexis Nexis	ඩොලර් 4632.00	06.12.2018 – 05.12.2019
2	Turnitin	ඩොලර් 9384.00	31.12.2018 – 30.12.2019
3	Emerald	පවුම් 11,574.00	01.11.2018 – 31.10.2019
4	IEEE	ඩොලර් 8800	01.08.2019 – 31.07.2020

ආරාධිත දේශන

දිනය	නම	මාතෘකාව
21.02.2019	සමන් වික්‍රමාරච්චි මහතා බර්ට්‍රම් නිහාල් මහතා අශෝක හඳගම මහතා	නවකතාවෙන් සිනමාවට
09.10.2019	මේජර් මහින්ද අධිකාරි (විශ්‍රාමික)	ජීවිතය පිළිබඳ මූලික සංකල්ප සහ 'ස්වයං' ගවේෂණය

CSR ව්‍යාපෘති

පීවීආර්පී පෙරේරා මහතා ප්‍රධාන පුස්තකාලයේ කාර්යාල කම්කරුවකු වන අතර ඔහු වසර 24 කට වැඩි කාලයක් කොආවි හි සේවය කරයි. ඔහුට දියණියන් සිව්දෙනෙකු සිටින අතර ඔහුගේ බිරිඳ මීට වසර කිහිපයකට පෙර හදිසි අනතුරක් හේතුවෙන් අභාවප්‍රාප්ත විය.

එබැවින් කොඅාවි පුස්තකාලයට පරිත්‍යාගයක් ලෙස ලැබුණු ඉඩමක ඔවුන් සඳහා නිවසක් තැනීමට පටන් ගත්තේය. මෙම ආයතනික සමාජ වගකීම් ව්‍යාපෘතිය විශේෂයෙන් ආරම්භ කරනු ලැබුවේ පෙරේරා මහතාගේ දරුවන් සිව්දෙනාට වඩා හොඳ පරිසරයක් ලබා දීමේ අභිප්‍රායෙනි.
දැන් මෙම ව්‍යාපෘතිය අවසන් අදියරේ පවතින අතර අලුතින් ඉදිකරන ලද නිවස භාරදීම 2020 ජනවාරි මාසයේදී පැවැත්වීමට නියමිතය.

<u>වෙනත් තොරතුරු</u>

<u>පුහුණු හවුල්කාරිත්වය සඳහා උපහාර සම්මානය</u>
කැලණිය විශ්වවිද්‍යාලයේ පුස්තකාල හා තොරතුරු විද්‍යා අධ්‍යයනාංශයේ උපාධි අපේක්ෂකයින් සඳහා සීමාවාසික පුහුණුව ප්‍රවර්ධනය කිරීම සඳහා කරන ලද කැපී පෙනෙන දායකත්වය සහ හවුල්කාරිත්වය අගය කරමින් කොඅාවි පුස්තකාලයට කැලණිය විශ්වවිද්‍යාලය විසින් 2019 අගෝස්තු 30 වන දින වත්තල පෙගසස් රීෆ් හෝටලයේදී උපහාර දක්වන ලදී.

<u>කොඅාවි සහ කැලණිය විශ්වවිද්‍යාලය අතර අවබෝධතා ගිවිසුම</u>
කැලණිය විශ්වවිද්‍යාලය සහ ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය අතර ඉදිරි වසර කිහිපය සඳහා කැලණිය විශ්වවිද්‍යාලයේ පුස්තකාල හා තොරතුරු විද්‍යා අධ්‍යයනාංශයේ පුහුණු හවුල්කරුවෙකු/ඉගැන්වීම් පුස්තකාලයක් ලෙස අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදී.

04. ශිෂ්‍යාය තොරතුරු

4.1 මුළු ශිෂ්‍ය සංඛ්‍යාව – කෙඩෙට් නිලධාරීන් සහ දිවා විද්‍යාර්ථීන් (දේශීය)

කෙඩෙට් නිලධාරීන් බඳවා ගැනීම

අනු. අංකය	උපාධි වැඩසටහන	ඇතුළත් කර ගැනීම - 37 (2019)
1	වෛද්‍යවේදී සහ ශල්‍යවේදී (MBBS)	49
2	විද්‍යාවේදී ගෞරව ඉංජිනේරු	66
3	නීතිවේදී (LLB)	5
4	විද්‍යාවේදී කළමනාකරණ සහ තාක්ෂණික විද්‍යා	16
5	විද්‍යාවේදී කාර්ය සම්පාදන කළමනාකරණ	16
6	විද්‍යාවේදී සමාජ විද්‍යා	11
7	විද්‍යාවේදී ගෞරව පරිගණක විද්‍යා	13
8	විද්‍යාවේදී ගෞරව මෘදුකාංග ඉංජිනේරු	6
9	විද්‍යාවේදී ගෞරව පරිගණක ඉංජිනේරු	8
10	වාස්තු විද්‍යාවේදී (B Arch)	1
11	විද්‍යාවේදී ගෞරව නිර්මිත පරිසරය	0
12	විද්‍යාවේදී නිර්මිත පරිසරය	0
13	විද්‍යාවේදී ගෞරව ප්‍රමාණ සමීක්ෂණය	2
14	විද්‍යාවේදී ප්‍රමාණ සමීක්ෂණය	0
15	විද්‍යාවේදී ගෞරව මැනුම් විද්‍යා	2
16	විද්‍යාවේදී ගෞරව තොරතුරු තාක්ෂණය	7
17	විද්‍යාවේදී ගෞරව තොරතුරු පද්ධති	4
18	විද්‍යාවේදී ක්‍රමෝපාය අධ්‍යයන සහ ජාත්‍යන්තර සබඳතා	12
මුළු එකතුව		**218**

ගෙවීමේ පදනම මත වූ සිසුන් බඳවා ගැනීම

අනු. අංකය	උපාධි වැඩසටහන	ඇතුළත් කර ගැනීම - 37 (2019/2020) 1 කණ්ඩායම
01	විද්‍යාවේදී ගෞරව ඉංජිනේරු	35
02	නීතිවේදී (LLB)	35
03	විද්‍යාවේදී කළමනාකරණ සහ තාක්ෂණ විද්‍යා	9
04	විද්‍යාවේදී කාර්ය සම්පාදන කළමනාකරණ	23
05	විද්‍යාවේදී සමාජ විද්‍යා	09
06	විද්‍යාවේදී ගෞරව පරිගණක විද්‍යා	2
07	විද්‍යාවේදී ගෞරව පරිගණක ඉංජිනේරු	4
08	විද්‍යාවේදී ගෞරව මෘදුකාංග ඉංජිනේරු	06
09	වාස්තුවිද්‍යාවේදී (B Arch)	06
10	විද්‍යාවේදී ගෞරව ප්‍රමාණ සමීක්ෂණය	10
11	විද්‍යාවේදී ගෞරව මැනුම් විද්‍යා	1
12	විද්‍යාවේදී ගෞරව තොරතුරු තාක්ෂණය	17
13	විද්‍යාවේදී ගෞරව තොරතුරු පද්ධති	4
14	විද්‍යාවේදී ක්‍රමෝපාය අධ්‍යයන සහ ජාත්‍යන්තර සබඳතා	10
මුළු එකතුව		**171**

සමසෙෞඛ්‍ය විද්‍යා පීඨයට බඳවා ගැනීම සහ පසුප්‍රවේශ සිසුන්

අනු. අංකය	උපාධි වැඩසටහන	ඇතුළත් කර ගැනීම - 37 (2019/2020) 1 කණ්ඩායම
01	විද්‍යාවේදී ගෞරව වෛද්‍ය රසායනාගාර වි (නොගෙවීම් පදනම)	0
	විද්‍යාවේදී ගෞරව වෛද්‍ය රසායනාගාර වි (ගෙවීම් පදනම)	8
02	විද්‍යාවේදී ගෞරව විකිරණවේදය (නොගෙවීම් පදනම)	0
	විද්‍යාවේදී ගෞරව විකිරණවේදය (ගෙවීම් පදනම)	7
03	විද්‍යාවේදී ගෞරව විකිරණ චිකිත්සාව(නොගෙවීම් පදනම)	0
	විද්‍යාවේදී ගෞරව විකිරණ චිකිත්සාව (ගෙවීම් පදනම)	4
04	විද්‍යාවේදී ඖෂධවේදී (නොගෙවීම් පදනම)	0
	විද්‍යාවේදී ඖෂධවේදී (ගෙවීම් පදනම)	11
05	විද්‍යාවේදී ගෞරව භෞතචිකිත්සාව (නොගෙවීම් පදනම)	0
	විද්‍යාවේදී ගෞරව භෞතචිකිත්සාව (ගෙවීම් පදනම)	14
06	විද්‍යාවේදී ගෞරව හෙද (නොගෙවීම් පදනම)	0
	විද්‍යාවේදී ගෞරව හෙද (ගෙවීම් පදනම)	16
මුළු එකතුව		**60**

4.2 මුළු ශිෂ්‍ය සංඛ්‍යාව – විදේශීය

විදේශීය සුදුසුකම් සහිත සිසුන්

උපාධි වැඩසටහන	ඇතුළත් කර ගැනීම - 36 2019
වෛද්‍යවේදී හා ශල්‍යවේදී	27
ඉංජිනේරු විද්‍යා	1
වෛද්‍ය රසායනාගාර විද්‍යා	1
මුළු එකතුව	29

විදේශීය නිලධාරීන් ශිෂ්‍ය භටයින්

උපාධි වැඩසටහන	ඇතුළත් කර ගැනීම - 36 2019
ඉංජිනේරු	9
නීතිවේදී	1
කළමණාකරණ හා තාක්ෂණ විද්‍යා	1
පරිගණක විද්‍යා	1
කාර්ය සම්පාදන කළමනාකරණ	1
මුළු එකතුව	13

හමුදා සේවයෙහි නියුතු නිලධාරීන් සඳහා ගෙවීම් පදනම මත උපාධි වැඩසටහන

උපාධි වැඩසටහන	ඇතුළත් කර ගැනීම - 36 2019
නීතිවේදී	1
වාස්තු විද්‍යාව	3
මුළු එකතුව	4

<u>පශ්චාත් උපාධි පාඨමාලාවල මුළු ශිෂ්‍ය සංඛ්‍යාව</u>

අනු. අංකය	වැඩසටහන	ශිෂ්‍ය සංඛ්‍යාව
01	දර්ශනපති /දර්ශනශූරි	18
02	කළමනාකරණය පිළිබඳ විද්‍යාපති	15
03	කාර්ය සම්පාදන කළමනාකරණය පිළිබඳ ව්‍යාපාර පරිපාලනපති	52
04	නීතිපති	58
05	ආරක්ෂක උපක්‍රමික අධ්‍යයන පිළිබඳ විද්‍යාපති	13
06	සිවිල් හා ව්‍යුහාත්මක ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාපති	09
07	ආපදා අවදානම් අවම කිරීමේ සංවර්ධනය පිළිබඳ විද්‍යාපති	12
08	කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී	21
එකතුව		198

05. විභාග දත්ත

5.1 විශ්වවිද්‍යාලයීය උපාධිලාභී සිසුන් සංඛ්‍යාව

උපාධිය	පළමු පන්තිය	දෙවන පන්තිය	දෙවන පහළ පෙළ	සමත්	සුදුසුකම් නොලද	මුළු එකතුව
විද්‍යාවේදී ඉංජිනේරු (ගෞරව)	22	41	34	97	42	**236**
නීතිවේදී	0	6	16	76	12	**110**
විද්‍යාවේදී (ගෞරව) තොරතුරු තාක්ෂණය	4	5	14	44	5	**72**
විද්‍යාවේදී (ගෞරව) පරිගණක විද්‍යාව	6	9	2	8	1	**26**
විද්‍යාවේදී (ගෞරව) තොරතුරු පද්ධති	0	1	5	5	0	**11**
විද්‍යාවේදී කළමනාකරණ සහ තාක්ෂණික විද්‍යා	2	6	8	33	7	**56**
විද්‍යාවේදී සමාජ විද්‍යා	1	6	6	17	5	**35**
විද්‍යාවේදී කාර්ය සම්පාදන කළමනාකරණ	7	23	24	23	5	**82**
වෛද්‍යවේදී සහ ශල්‍යවේදී	2	17	47	55	119	**240**
විද්‍යාවේදී (ගෞරව) වෛද්‍ය රසායනාගාර විද්‍යා	0	9	7	14	2	**32**
විද්‍යාවේදී (ගෞරව) භෞතචිකිත්සාව සහ වෘත්තීය චිකිත්සාව	0	6	13	11	0	**30**
විද්‍යාවේදී (ගෞරව) හෙද	1	5	16	27	2	**51**
ඖෂධවේදී (ගෞරව)	2	7	7	7	1	**24**
විද්‍යාවේදී (ගෞරව) විකිරණවේදය	0	7	6	0	0	**13**
විද්‍යාවේදී (ගෞරව) මැනුම් විද්‍යා	1	4	5	3	-	**13**
විද්‍යාවේදී (ගෞරව) ප්‍රමාණ සමීක්ෂණය	1	5	12	7	-	**25**
විද්‍යාවේදී නිර්මිත පරිසරය	-	2	-	-	-	**02**
මුළු එකතුව	49	159	222	427	201	**1058**

5.2 විශ්වවිද්‍යාලයීය පශ්චාත් උපාධිලාභී සිසුන් සංඛ්‍යාව

උපාධිය	කුසලතා සාමාර්ථ	පළමු පන්තිය	දෙවන පෙළ ඉහළ	දෙවන පෙළ පහළ	සමත්	සුදුසුකම් නොලද	මුළු එකතුව
විද්‍යාපති කළමනාකරණ	1	-	-	-	16	**7**	**24**
ව්‍යාපාර පරිපාලනපති කාර්ය සම්පාදන කළමනාකරන	3	-	-	-	13	**5**	**21**
ව්‍යාපාර පරිපාලනපති ඊ-පාලනය	1				4	**2**	**7**
නීතිපති	-	-	-	-	24	**2**	**26**
විද්‍යාපති ආරක්ෂක සහ ක්‍රමෝපාය අධ්‍යයන	-	-	-	-	11	-	**11**
විද්‍යාපති විද්‍යුත් සහ විදුලිසන්නිවේදන ඉංජිනේරු	-	-	-	-	1	-	**1**
විද්‍යාපති සිවිල් සහ ව්‍යුහ ඉංජිනේරු	-	-	-	-	**1**	-	**1**
පශ්චාත් උපාධි ඩිප්ලෝමා	-	-	-	-	4	-	**4**
විද්‍යාවේදී කළමනාකරණය	0	-	2	1	14	**4**	**21**
මුළු එකතුව	5	0	2	1	88	**20**	**116**

5.3 උපාධිලාභී සහ පශ්චාත් උපාධිලාභී සිසුන් සංඛ්‍යාව - ප්‍රතීතන ප්‍රදානය ලද හමුදා අභ්‍යාස විද්‍යාල

උපාධිය	පළමු පන්තිය	දෙවන පන්තිය	තෙවන පන්තිය	සමත්	මුළු එකතුව
විද්‍යාපති ආරක්ෂක සහ ක්‍රමෝපාය අධ්‍යයන (DSCSC)				108	**108**
ව්‍යාපාර පරිපාලනපති කාර්ය සම්පාදන කළමනාකරණ (ASL)				20	**20**
ව්‍යාපාර පරිපාලනපති කාර්ය සම්පාදන කළමනාකරණ (NMA)				8	**8**
පශ්චාත් උපාධි ඩිප්ලෝමා කාර්ය සම්පාදන කළමනාකරණ (ASL)				4	**4**
පශ්චාත් උපාධි ඩිප්ලෝමා ආරක්ෂක කළමනාකරණ (NMA)				5	**5**
පශ්චාත් උපාධි ඩිප්ලෝමා ආරක්ෂක කළමනාකරණ (SLAFA)				5	**5**
විද්‍යාවේදී හමුදා අධ්‍යයන (SLMA)	3	17	13	75	**108**
විද්‍යාවේදී නාවික සහ සමුද්‍රීය අධ්‍යයන (NMA)		4	8	1	**13**
විද්‍යාවේදී නාවික කාර්ය සම්පාදන කළමනාකරණ (NMA)		2	10	7	**19**
විද්‍යාවේදී නාවික අධ්‍යයන (NMA)		4	2	2	**8**
විද්‍යාවේදී ගුවන් අධ්‍යයන (SLAFA)			1	31	**32**
මුළු එකතුව	3	27	34	266	**330**

6. මානව සම්පත්

6.1 අනුමත සේවක සංඛ්‍යාව සහ සමාලෝචිත වර්ෂයේදී සේවයේ නියුක්ත කාර්ය මණ්ඩලය

සේවක සංඛ්‍යා විස්තර **31.12.2019** දිනට						
ප්‍රවර්ගය	කොඅාවි		දක්ෂිණ මණ්ඩපය		**(FOM) SAITM**	
	අනුමත	සිටින	අනුමත	සිටින	අනුමත	සිටින
ඉගැන්වීමේ කාර්ය මණ්ඩලය (අධ්‍යයන)	232	185	124	33	52	03
තාවකාලික කාර්ය මණ්ඩලය (අධ්‍යයන සහායක)	49	27	-	-	-	-
සහායක කාර්ය මණ්ඩලය (අධ්‍යයන සහායක)	43	22	26	06	24	01
පරිපාලන කාර්ය මණ්ඩලය	25	18	10	05	02	02
ලිපිකරු සහ සමාන්තර ශ්‍රේණි කාර්ය මණ්ඩලය	188	153	99	17	31	00
සුළු ශ්‍රේණි කාර්ය මණ්ඩලය	385	343	252	73	29	00
පුස්තකාල කාර්ය මණ්ඩලය	21	19	14	01	01	-
තාවකාලික ලිපිකරු සුහ සුළු සේවක කාර්ය මණ්ඩලය	-	32	-	04	-	-
මුළු එකතුව	**943**	**799**	**525**	**39**	**139**	**06**

සිවිල් සේවක සංඛ්‍යාවෙහි සාරාංශය **31.12.2019** දිනට							
අනු අංකය	ප්‍රවර්ගය	පත් කිරීම්	විශ්‍රාම ගැනීම්	ඉල්ලා අස්වීම්	තනතුර හැර යාම්	උසස්වීම්	කොන්ත්‍රත් අවසන් වීම කාලය
01	අධ්‍යයන කාර්ය මණ්ඩලය	11	01	09	00	13	04
02	පරිපාලන කාර්ය මණ්ඩලය	01	00	01	00	00	01
03	පරිපාලන සහායක කාර්ය මණ්ඩලය	35	00	22	00	01	06
04	ලිපිකරු සහ සමාන්තර ශ්‍රේණි කාර්ය මණ්ඩලය	03	05	01	00	09	00
05	සුළු ශ්‍රේණි කාර්ය මණ්ඩලය	43	08	00	00	09	00
මුළු එකතුව		**93**	**14**	**33**	**02**	**32**	**11**

07. කොආවි රෝහල (UHKDU)

හැඳින්වීම

කොආවි වෛද්‍ය හා සම සෞඛ්‍ය විද්‍යා පීඨ සිසුන්ට සායනික හා වෙනත් පුහුණුවීම් සඳහා පහසුකම් සැලසීම සඳහා ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ රෝහල මෑතකදී ආරම්භ කරන ලදී. එය නවීන තාක්ෂණිකව දියුණු රෝග විනිශ්චය පහසුකම් සහ ප්‍රතිකාර ක්‍රම සමඟ ක්‍රියාත්මක වන අතර සාමාන්‍ය ජනතාවට, ත්‍රිවිධ සේවා නිලධාරීන්ට සහ ඔවුන්ගේ ඥාතීන්ට සේවය සපයයි. UHKDU හි ප්‍රධාන නඩත්තු ඉංජිනේරු දෙපාර්තමේන්තුව සිවිල්, යාන්ත්‍රික, විදුලි ඉංජිනේරු සහ ජලනල (MEP) ආශ්‍රිත පද්ධතිවලට අදාළ සේවා හා නඩත්තු කටයුතුවල වෘත්තීය කාර්යභාරයක් ඉටු කරයි. ඉහත සඳහන් MEP අංශවල මෙහෙයුම් තත්ත්වයන් පවත්වාගෙන යාමේ වෘත්තීය දායකත්වය සහ වගකීම රෝහල් කළමනාකරණ පද්ධතිවල සුමට ක්‍රියාකාරිත්වයට සෘජුවම බලපායි.

කොන්ත්‍රාත්කරු පොලි ටෙක්නොලොජී ඉන්කෝපරේෂන් විසින් ඉදිකිරීම් කටයුතු අවසන් කර UHKDU ව්‍යාපෘතිය 2018 ජනවාරි 01 දින කොආවි වෙත භාර දී ඇත. UHKDU සහ පොලි ටෙක්නොලොජී ඉන්කෝපරේෂන් අතර ඇති කර ගත් කොන්ත්‍රාත්තුවේ කොන්දේසි අනුව, ව්‍යාපෘතියේ අඩුපාඩු වගකීම් කාල සීමාව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් විය. කෙසේ වෙතත්, පොලි ටෙක්නොලොජී ඉන්කෝපරේෂන් අඩුපාඩු නිවැරදි කිරීම සඳහා කාල දීර්ඝ කිරීමක් ඉල්ලා සිටි අතර, ඒ අනුව කළමනාකරණ මණ්ඩලය විසින් දෝෂ නිවැරදි කිරීම / වෙනස් කිරීමේ කාලය 2019 ජූලි 31 දක්වා දීර්ඝ කිරීමට අනුමැතිය ලබා දෙන ලදී.

මුළු රඳවා ගැනීමේ මුදල ඇමරිකානු ඩොලර් 7,960,803.65 කි. මුළු ව්‍යාපෘති පිරිවැය ඇ.ඩො. 159,216,073.07කින් 5% ක් ලෙස රඳවා ගෙන ඇත. කොන්ත්‍රාත්කරු විසින් සම්පූර්ණ කරන ලද අඩුපාඩු අවසන් කිරීම සඳහා 'රඳවා තබා ගැනීම නිදහස් කිරීම' පිළිබඳ මණ්ඩල ක්‍රියාපටිපාටිය නම් කර ඇති අතර සම්පූර්ණ කළ දෝෂ කොන්ත්‍රාත්කරු විසින් අවසන් කිරීමට සිදු කර ඇති අතර ඒ අනුව ඒවා මුදා හැරීම නිර්දේශ කර ඇත. කොන්ත්‍රාත්කරු පොලි ටෙක්නොලොජීස් ඉන්කෝපරේෂන් වෙත නිකුත් කරන ලද රඳවා ගැනීමේ ගෙවීම්වල සාරාංශය පහත පරිදි වේ.

• 2018 වසර තුළ නිදහස් කළ රඳවා ගැනීම	ඇ.ඩො. 976,873.00
• ජන- 2019 බිල	ඇ.ඩො.5,550,311.57
• මාර්තු - 2019 බිල	ඇ.ඩො. 254,599.42
• ජූලි - 2019 බිල	ඇ.ඩො. 656,966.90
	ඇ.ඩො.7,438,750.89

2019 දෙසැම්බර් 31 දක්වා වගකීම් යටතේ පවතින පද්ධති 08 ක් සහ කොන්ත්‍රාත්කරුගේ අසම්පූර්ණ අඩුපාඩු ද ඇතුළුව මේ දක්වා රඳවාගෙන ඇති මුළු රඳවා ගැනීමේ ප්‍රමාණයෙහි සාරාංශය පහත පරිදි වේ.

සිවිල් ඉංජිනේරු

• හයිබ්‍රිඩ් ඔපරේෂන් තියටර්	ඇ.ඩො. 833.33
• ICU සේදුම් බේසම් ස්ථාපනය කිරීම (10)	ඇ.ඩො. 1640.00
• උණු වතුර ටැංකියක ජලය කාන්දු වීම	ඇ.ඩො. 138.89
• උණු වතුර ටැංකියට හානි වීම	ඇ.ඩො.3,551.58
• බාහිර වැඩ	ඇ.ඩො. 278.00
• 6.5 නානකාමර වෙන් කිරීම් දෝෂ	ඇ.ඩො.2,362.00
• 6.3 ප්‍රධාන දොර රාමු අඩුපාඩු	ඇ.ඩො. 297.22
මුළු රඳවා ගත් මුදල (සිවිල් ඉංජිනේරු)	ඇ.ඩො.9,101.02

යාන්ත්‍රික ඉංජිනේරු

• LPG ගෑස් පද්ධතිය	ඇ.ඩො. 6,655.24

<u>පෙව වෛද්‍ය</u>

- මීට්කටර් යන්ත්‍ර ප්‍රතිස්ථාපනය කිරීම ඇ.ඩො. 1,500.00

<u>පරිපාලනය</u>

- ලී බඩු රඳවා ගැනීම ඇ.ඩො. 48,568.54

<u>අවුරුදු 2ක පද්ධති වගකීම (2019 දෙසැම්බර් 31 දක්වා)</u>

- විලර්ස් ඇ.ඩො. 10,000.00
- ට්‍රාන්ස්ෆෝමර්ස් ඇ.ඩො. 40,668.00
- ජෙනරේටර්ස් ඇ.ඩො 137,334.00
- ලිෆ්ට් (ඉලවේටර්ස් සහ එස්කලේටර්ස්) ඇ.ඩො. 82,726.00
- ඔපරේෂන් තියටර්ස් ඇ.ඩො. 1,232.39
- නියුමැටික් සිස්ටම් ඇ.ඩො. 29,370.51
- සෙන්ට්‍රල් ස්ටෙරිල් සප්ලයර් (CSSD) ඇ.ඩො. 65,000.00
- මලාපවහනය ඇ.ඩො. 27,045.34
- මලාපවහන හා වෛද්‍ය පවිත්‍රාගාරය ඇ.ඩො. 62,849.00

  වසර 02 පද්ධති වගකීම ඇ.ඩො. 456,227.96

මුළු එකතුව රඳවා ගත් මුදල ඇ.ඩො. 522,052.76

<u>ප්‍රධාන නඩත්තු ඉංජිනේරු කාර්යාලයේ ප්‍රධාන පත්වීම්වල වෙනස්කම්</u>

නම	තනතුර	රාජකාරි භාර ගත් දිනය
ලුති.කමා. (CE) එස්ඒඑම්පී සුරවීර	ව්‍යාපෘති නිලධාරී / ප්‍රධාන නඩත්තු ඉංජිනේරු	29 මාර්තු 2016 සිට 20 මැයි 2019
කමා. (CE) එම්.ඒ. වාහලතන්ත්‍රි	UHKDU ප්‍රධාන නඩත්තු ඉංජිනේරු	19 මැයි 2019 සිට අද දක්වා
ලුති.කමා. (L) එච්.ආර්. තුෂාර	ජ්‍යෙෂ්ඨ විදුලි ඉංජිනේරු UHKDU	26 සැප් 2017 සිට 28 මාර්තු 2019
ලුති.කමා. (L) එස්.ඒ.එස්.එම්. සමරකෝන්	ජ්‍යෙෂ්ඨ විදුලි ඉංජිනේරු UHKDU	18 මාර්තු 2019 සිට අද දක්වා
ලුති.කමා. (E) ඩීඑම්සී ඩයස්	ජ්‍යෙෂ්ඨ නාවික ඉංජිනේරු UHKDU	29 ජූලි 2016 සිට 16 මැයි 2019
ලුති.කමා. (E) කේඑම්සී ලාල්	ජ්‍යෙෂ්ඨ යාන්ත්‍රික ඉංජිනේරු UHKDU	15 මැයි 2019 28 සැප් 2019
ලුති(E) ඒ.එල්.ඒ දිසානායක	යාන්ත්‍රික ඉංජිනේරු UHKDU	28 සැප් 2019 සිට අද දක්වා
ලුති (CE) එච්.එම්.සී.ජේ ධනවර්ධන	සිවිල් ඉංජිනේරු (නඩත්තු) UHKDU	03 දෙසැ 2018 සිට අද දක්වා

<u>පුහුණු කටයුතුවල නිරත වීම</u>

සිවිල් ඉංජිනේරු		
07.01.2019	UHKDU රෝහල් ගොඩනැගිල්ලේ උණු වතුර බෙදා හැරීමේ පද්ධතිය ඉුරු වීම පිළිබඳ පුහුණුව	ප්‍රධාන නඩත්තු ඉංජිනේරු දෙපාර්තමේන්තුව (සිවිල් ඉංජිනේරු අංශය) විසින් සංවිධානය කරනු ලැබේ
12.02.2019	ගොඩනැගිලි 6.8,6.3,6.5 සහ 3.3 හි ජල පොම්පය නඩත්තු කිරීමේ ක්‍රියා පටිපාටි පිළිබඳ පුහුණුව	
20.02.2019	ජල පවිත්‍රාගාරයේ නඩත්තු ක්‍රියා පටිපාටිය පිළිබඳ පුහුණුව	
06.03.2019	කළු ජලය සහ අළු ජලය බැහැර කිරීමේ පද්ධතිය පිළිබඳ පුහුණුව	
13.03.2019	නැවුම් ජලය බෙදා හැරීමේ පද්ධතිය පිළිබඳ පුහුණුව	
20.06.2019	UHKDU හි සෙප්ටික් ටැංකිය සහ පෙඟවීම් වළ පිළිබඳ පුහුණුව	
15.10.2019	ජල පොම්ප නඩත්තු කිරීම පිළිබඳ පුහුණුව	
03.11.2019	නාන කාමර සවිකිරීම් අලුත්වැඩියා කිරීම පිළිබඳ පුහුණුව	
28.12.2019	නැවුම් ජලය බෙදා හැරීමේ පද්ධතිය හා ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමේ පද්ධතිය ඉුරු කිරීම	
විදුලි ඉංජිනේරු		
03.01.2019	පොරොත්තු බල සැපයුම් පද්ධතිය පිළිබඳ පුහුණුව (ජනක යන්ත්‍ර / උත්පාදක බ්‍රේකර් පැනල්)	ප්‍රධාන නඩත්තු ඉංජිනේරු දෙපාර්තමේන්තුව (විදුලි ඉංජිනේරු අංශය) විසින් සංවිධානය කරන ලදී
22.01.2019	අඛණ්ඩ බල සැපයුම් පද්ධතිය පිළිබඳ පුහුණුව (UPS).	
31.01.2019	ප්‍රධාන බල සැපයුම් පද්ධතිය පිළිබඳ පුහුණුව	
07.02.2019	LV බල බෙදාහැරීමේ පද්ධතිය පිළිබඳ පුහුණුව	
05.03.2019	ගොඩනැගිලි කළමනාකරණ පද්ධතිය පිළිබඳ පුහුණුව	
12.03.2019	සහාය පද්ධති බල සැපයුම් සැකැස්ම පිළිබඳ පුහුණුව. සෝපානය, චිලර්, එෆ්සීයූ, ඒඑච්යූ සහ සිසිලන කුළුණ ආදිය. සියලුම පොම්ප (නැවුම් ජලය, ගිනි, ගිල්විය හැකි යනාදිය)	
03.04.2019	පොරොත්තු බල සැපයුම් පද්ධතිය පිළිබඳ පුහුණුව (ජනක යන්ත්‍ර / උත්පාදක බ්‍රේකර් පැනල්)	
02.05.2019	ප්‍රධාන බල සැපයුම් පද්ධතිය පිළිබඳ පුහුණුව - සැසිය (II)	
16.05.2019	LV බල බෙදා හැරීමේ පද්ධතිය පිළිබඳ පුහුණුව - සැසිය (II)	
20.06.2019	සහායක පද්ධති බල සැපයුම් සැකැස්ම පිළිබඳ පුහුණුව. සෝපානය, චිලර්, එෆ්සීයූ, ඒඑච්යූ සහ	

	සිසිලන කුළුණ ආදිය. සියලුම පොම්ප (නැවුම් ජලය, ගිනි, ගිල්විය හැකි යනාදිය)	
04.07.2019	පොරොත්තු බල සැපයුම් පද්ධතිය පිළිබඳ පුහුණුව (ජනක යන්ත්‍ර / උත්පාදක බ්‍රේකර් පැනල්)	
13.08.2019	LV බල බෙදා හැරීමේ පද්ධතිය පිළිබඳ පුහුණුව	
04.09.2019	සහායක පද්ධති බල සැපයුම් සැකැස්ම පිළිබඳ පුහුණුව (සැසිය II) බ්ලොවර්ස් වාතාශ්‍ර පංකා, මුළුතැන්ගෙය ලොන්ඩ්‍රිය, දහන යන්ත්‍ර, ජල පවිත්‍රාගාරය ආදිය. (සැසිය II)	ප්‍රධාන නඩත්තු ඉංජිනේරු දෙපාර්තමේන්තුව (විදුලි ඉංජිනේරු අංශය) විසින් සංවිධානය කරන ලදි
17.10.2019	ප්‍රධාන බල සැපයුම් පද්ධතිය පිළිබඳ පුහුණුව - සැසිය (I)	
14.11.2019	LV බල බෙදා හැරීමේ පද්ධතිය පිළිබඳ පුහුණුව - සැසිය II	
05.12.2019	ගොඩනැගිලි කළමනාකරණ පද්ධතිය පිළිබඳ පුහුණුව	
වායු සමීකරණය කිරීම		
24.01.2019	BMS පාලන පද්ධතිය පිළිබඳ පුහුණුව	ප්‍රධාන නඩත්තු ඉංජිනේරු දෙපාර්තමේන්තුව (යාන්ත්‍රික ඉංජිනේරු අංශය) විසින් සංවිධානය කරන ලදි
07.02.2019	අබාන්ස් “වීආර්එෆ්” A/C පද්ධතිය පිළිබඳ පුහුණුව (මූලික නඩත්තුව)	
24.04.2019	AHU සහ විලර්ස් සේවා කිරීම පිළිබඳ පුහුණුව	
23.05.2019	ඔපරේෂන් තියටර් BMS පද්ධතිය පිළිබඳ පුහුණුව	
06.06.2019	වීඑස්ඩී විලර් ප්ලාන්ට් සහ වීඑස්ඩී නොවන විලර් ප්ලාන්ට් පිළිබඳ පුහුණුව	
22.08.2019	පෙළගැස්වීමේ රබර් බුරුසුව සම්බන්ධ කරන කන්ඩෙන්සර් පොම්පය වෙනස් කිරීම පිළිබඳ පුහුණුව	
22.10.2019	සිසිලන කුළුණ ජල මට්ටම සමතුලිත කිරීම සහ බයිපාස් කපාට ක්‍රියාකාරිත්වය පාලනය කිරීම පිළිබඳ පුහුණුව	
යාන්ත්‍රික ඉංජිනේරු		
03.01.2019	2000KVA කමින්ස් ජනක යන්ත්‍ර පිළිබඳ පුහුණුව	ප්‍රධාන නඩත්තු ඉංජිනේරු දෙපාර්තමේන්තුව (යාන්ත්‍රික ඉංජිනේරු අංශය) විසින් සංවිධානය කරන ලදි
30.01.2019	පොම්ප නඩත්තුව පිළිබඳ පුහුණුව	
05.03.2019	2000 KVA ජෙනරේටර් නඩත්තුව පිළිබඳ පුහුණුව (I කොටස)	
02.04.2019	ජෙනරේටර් පිළිබඳ පුහුණුව මාස 6 ක විධිමත්	
21.05.2019	2000 KVA ජෙනරේටර් නඩත්තුව පිළිබඳ පුහුණුව මාස 6 ක විධිමත්. (II කොටස)	
12.06.2019	රෝහල් ප්‍රදේශයේ පොම්පාගාරය පිළිබඳ පුහුණුව	
17.07.2019	2000 KVA කමින්ස් ජෙනරේටර් ඔටෝ සහ මැනුවල් ආරම්භය පිළිබඳ පුහුණුව	
05.08.2019	2000 KVA කමින්ස් ජෙනරේටර් මූලික හැඳින්වීම පිළිබඳ පුහුණුව (කොටස I)	
19.08.2019	2000 KVA කමින්ස් ජෙනරේටර් මූලික හැඳින්වීම පිළිබඳ පුහුණුව (කොටස II)	

02.10.2019	2000 KVA කමින්ස් ජෙනරේටර් දෛනික චර්යාව පිළිබඳ පුහුණුව (කොටස I)	
16.10.2019	2000 KVA කමින්ස් ජෙනරේටර් දෛනික චර්යා මූලික හැඳින්වීම පිළිබඳ පුහුණුව (කොටස II)	
17.12.2019	රෝහල් පරිශ්‍රයේ පිහිටා ඇති 2000KVA ජෙනරේටරය හඳුන්වාදීම	

<u>ඇතු</u>

<u>ළු වීම සහ පදිංචිය පිළිබඳ වීසා බලපත්‍ර ලබා දීම</u>

- චීන සේවකයින්ගේ නේවාසික වීසා බලපත්‍රය දීර්ඝ කිරීම සඳහා පොලි ටෙක්නොලොජීස් සමාගම විසින් ඉදිරිපත් කරන ලද අයදුම්පත ඉදිරි ක්‍රියාමාර්ග සඳහා කොඅවි හි උපකුලපති වෙත යොමු කරන ලදී.

<u>වෙනත් වැදගත් කරුණු</u>

බදු සංශෝධනය

- UHKDU හි වාණිජ කාණ්ඩයේ සිට රජයේ රෝහල් කාණ්ඩයට සංශෝධනය කරන ලද විදුලි හා ජල ගාස්තු අනුපාතය පහත පරිදි වේ.

බිල් වර්ගය	**පෙර අනුපාතය (රු/ඒකකය)**	**වර්තමාන අනුපාතය**
ජලය	75.00	53.00
විදුලිය	**කාර්ය බහුල** -25.50 **කාර්ය බහුල නොවන** -14.35 දින -20.70	14.35

MEP අංශය විසින් සිදු කරනු ලබන සාමාන්‍ය නඩත්තු, කොන්ත්‍රාත් හා සුළු වැඩ සහ ජල හා විදුලි බිල්පත් පිළිබඳ සංඛ්‍යාලේඛන ඇමුණුමක් ලෙස අමුණා ඇත.

<u>පවතින අඩුපාඩු (යාන්ත්‍රික/වායු සමීකරණ අංශය)</u>

- ජෙනරේටර අංක 01 (අනු අංක 33207448) දෝෂ සහිත වූ අතර වගකීම් අළුත්වැඩියා කිරීම සඳහා දේශීය නියෝජිත ට්‍රේඩ් ප්‍රමෝටර්ස් (පුද්ගලික) සමාගම මේ දක්වා සහභාගී වී ඇත. කොන්ත්‍රාත්කරු වන පොලි ටෙක්නොලොජීස් ඉන්කෝපරේෂන් වෙත ද එය දැනුම් දී ඇති අතර රඳවා ගැනීමේ මුදල් දැනටමත් රඳවාගෙන ඇත.
- විලර් ප්ලින්ථ අංක 03 (අනු අංක W16110804) දෝෂ සහිත වූ අතර දේශීය නියෝජිත KASE ට්‍රේඩිනිග් (පුද්) සමාගම අළුත්වැඩියා කටයුතු පිළිබඳ විමර්ශනයට සහභාගී වේ. කොන්ත්‍රාත්කරු වන පොලි ටෙක්නොලොජීස් ඉන්කෝපරේෂන් වෙත ද එය දැනුම් දී ඇති අතර රඳවා ගැනීමේ මුදල් දැනටමත් රඳවාගෙන ඇත.

<u>සේවා හා නඩත්තු ගිවිසුම් (විදුලි / යාන්ත්‍රික අංශය)</u>

2020 වර්ෂය සඳහා පහත සඳහන් හදිසි පද්ධති/උපකරණ සඳහා සේවා හා නඩත්තු ගිවිසුම් ආරම්භ කර ඇත.

- අඛණ්ඩ බල සැපයුම් (UPS) පද්ධතිය
- විදුලි සෝපාන සහ එස්කැලේටර්
- මධ්‍යම සහ අඩු වෝල්ටීයතා ස්විච් ගියර්
- බෙදීම්/පැකේජ/VRV වායු සමීකරණ පිරියත

08. ශ්‍රී ලංකාවේ තිරසර සංවර්ධන අභිමතාර්ථ (SDG) සපුරාලීම සඳහා විශ්වවිද්‍යාලය විසින් ගනු ලබන ක්‍රියාමාර්ග

වසර 2030 වනවිට අප රට විසින් සමස්තයක් ලෙස ළඟාකරගත යුතු තිරසාර සංවර්ධන අභිමතාර්ථ (SDG) 17ක් ඇත. මෙම අභිමතාර්ථයන් අතරින්, කොඅාවිට වත්මන් තත්වයන්ට යථානුරූපිවන ලෙස වාර්ෂිකව සංශෝදනය කරනු ලබන සංයුක්ත සැලැස්මෙහි ඇතුලත් එහි උපායමාර්ග මගින් පහත දැක්වෙන විශේෂිත ඉලක්ක සඳහා දායකවීමට හැකිවී තිබේ.

අභිමතාර්ථ 01: සියලු ආකාරයේ දිළිඳුබව, සියලු තන්හිම දුරුකිරීම.

- 2019 වසර තුළ කොඅාවි සඳහා බඳවාගනු ලැබූ සිසුන් ප්‍රමාණය වැඩිකරන ලදී. වඩාත් හොඳ අධ්‍යාපනයක් ලබාදීම තුළින් කොඅාවි ප්‍රජාවේ දිළිඳුබව පිටුදැකීම සඳහා දායකවිය.
- අධ්‍යාපනික, පරිපාලන, අධ්‍යාපනික සහායක, ලිපිකරු හා ඒ හා සමාන ශ්‍රේණි සහ සුළු ශ්‍රේණිවල සේවකයින් බඳවා ගැනීම මගින් කොඅාවි නව රැකියා අවස්ථාවන් බිහිකරන ලදී.
- කොඅාවි සිය සියලු කාර්යමණ්ඩලය සඳහා ආපදා ණය සහ සුභසාධක ණය පහසුකම් මෙන්ම කාර්යමණ්ඩල සුභසාධක සංගමය මගින් ලබාදෙන වෙනත් සුභසාධක පහසුකම් සපයන ලදී.

අභිමතාර්ථ 03: සෑම වයසකම සියලු දෙනාටම සෞඛ්‍ය සම්පන්න දිවියක් තහවුරු කරන අතර යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීම.

- කොඅාවියේ විශ්ව විද්‍යාලිය රෝහල මගින් සාමාන්‍ය මහජනතාවට මෙන්ම ආයතනයේ සේවකයින් සඳහා නොමිලේ අත්‍යාවශ්‍ය සෞඛ්‍ය පහසුකම් සපයනු ලැබීය. කොඅාවි මගින් පවත්වාගෙන යනු ලබන ඇවිදින මංතීරුව, පිහිනුම් තටාකය, ඉහළට නගින බිත්තිය එහි සේවකයින්ගේ යහපැවැත්ම ප්‍රවර්ධනය සඳහා ඉවහල්වේ.

අභිමතාර්ථ 04: සියල්ලන් සඳහා පරිපූර්ණ හා සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් හා දිවිය පුරාම ඉගෙනුම් අවස්ථා සහතික කිරීම

- සාමාන්‍ය උපාධි වැඩසටහන් වලට අමතරව ජීවිතකාලය පුරා ඉගෙනීමේ අවස්ථාවන් සළසාදීම සඳහා කොඅාවි මගින් ආචාර්ය උපාධි, දර්ශනපති, පශ්චාද් උපාධි සහ පශ්චාද් උපාධි ඩිප්ලෝමා වැඩසටහන් පිරිනමනු ලැබීය. එසේම කොඅාවි අනුබද්ධිත හමුදා ආයතන හරහා ද ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථාවන් සලසාදීමට දායකවිය.
- කොඅාවි රටේ විවිධ ප්‍රදේශයන්හි වෙසෙන සිසුන් බඳවාගනු ලැබූ අතර එය සිසුන් සඳහා එක හා සමානව උසස් අධ්‍යාපනය ලබාදීම පිලිබඳ සළකුණකි.

අභිමතාර්ථ 07: සැමටම ලබාගතහැකි, විශ්වාසනිය, තිරසර සහ නවීන බලශක්ති ප්‍රවේශය තහවුරු කිරීම

- කොඅාවියේ උපාධි අධ්‍යයන පීඨයේ, විශ්වවිද්‍යාල රෝහලේ සහ දක්ෂිණ මණ්ඩපයේ සූර්යබලය උපයෝජනය ආරම්භකර ඇත.

අභිමතාර්ථ 10: රටවල් ඇතුළත හා රටවල් අතර අසමානතාව අඩු කිරීම.

- කොඅාවි බහුවාර්ගික, බහුආගමික පසුබිමක් තුළින් පැමිණෙන විවිධාකාර සිසුන් සඳහා අධ්‍යාපන අවස්ථාවන් සළසනු ලැබීය. එම සිසුන්ට අදාල අගමික කටයුතු සඳහා කොඅාවි තුළ බෞද්ධ, කතෝලික, මුස්ලිම් සහ හින්දු ආගමික මධ්‍යස්ථාන 04ක් ස්ථාපනයකර ඇත.

අභිමතාර්ථ 16: තිරසර සංවර්ධනයක් සඳහා සියළුම දෙනා අයත්වන සාමකාමී සමාජයක් ප්‍රවර්ධනය කිරීම, සියලු දෙනාටම යුක්තිය සඳහා ප්‍රවේශයක් සැලසීම සහ ඵලදායි සහ වගකීමක් සහිත හා පූර්ණ ආයතන සියලු මට්ටම් සඳහා ඇති කිරීම.

- කොආවි තුළ ඉතා ශික්ෂිත පරිසරයක් පවත්වාගැනීම මගින් සාමකාමිත්වය සහ සමානාත්මතාවය ප්‍රවර්ධනය කෙරේ. නවක වදය සහ හිරිහැර කිරීම් වෙනුවට, නායකත්වය සහ කණ්ඩායම් හැඟීම් ඇතිකරන ඉගෙනුම් ක්‍රියාකාරකම් මගින් කොආවියේ සියලු සිසුන් අතර සමානාත්මතාවය ඇතිකෙරේ.

09. මූල්‍ය කාර්ය සාධන විශ්ලේෂණය

9.1 මූල්‍ය කාර්යසාධන විශ්ලේෂණය

මූල්‍ය කාර්ය සාධන විශ්ලේෂණය සහ 2019 වර්ෂය සඳහා මුළු ආදායම (පුනරාවර්තන හා ප්‍රග්ධනය) පිළිබඳ විස්තර

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයට අනුව, 2018 හා සසඳන විට 2019 දී සමස්ත වත්කම්වල වටිනාකම 4% කින් අඩු විය. වත්කම්වල වටිනාකමේ සාරාංශය සහ පසුගිය වසර පහක කාලය සඳහා වූ ප්‍රවණතා විශ්ලේෂණය පහත සඳහන් වගුවේ සහ ප්‍රස්තාරයේ දී ඇත.

කොආවි හි වත්කම් (රුපියල් මිලියන)

වසර	ජංගම වත්කම්	ස්ථාවර වත්කම්	මුළු වත්කම්
2015	7,180	19,477	26,657
2016	6,466	27,492	33,958
2017	9,443	36,283	45,726
2018	8,340	40,809	49,149
2019	6,626	41,012	47,638



2019 දී වත්කම් අඩුවීමට ප්‍රධාන හේතුව වන්නේ පෙර වර්ෂයට සාපේක්ෂව වර්ෂය තුළ ජංගම නොවන වත්කම් මිලදී ගැනීම අඩු වීමයි.

මූල්‍ය වියදම් අය කිරීමට පෙර, 2018 සහ 2019 වර්ෂය සඳහා කොආවි හි මෙහෙයුම් ලාභය පිළිවෙලින් රුපියල් 1,816,554,178/- සහ රුපියල් 4,328,752,021/- වේ. ඒ අනුව, මූල්‍ය වියදම්වලට පෙර මෙහෙයුම් ලාභය 2019 දී 138% කින් පමණ ඉහළ ගොස් තිබේ.

මූල්‍ය වියදම්වලට පෙර මෙහෙයුම් ලාභය ඉහළ යාමට හේතු පහත දක්වා ඇත;

- "විශ්වවිද්‍යාල රෝහල-කොආවි" ඉදි කිරීම සහ අනෙකුත් පුනරාවර්තන වියදම් සඳහා ලබා ගත් ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ණය සඳහා පොළිය ගෙවීම සඳහා 2019 වර්ෂයේ දී පුනරාවර්තන ප්‍රදානය 72%කින් වැඩි වී ඇති අතර එය රුපියල් 2,599,436,378/- කි.

- 2019 වර්ෂය සඳහා පාඨමාලා ගාස්තු ආදායම රුපියල් 1,579,902,637/- කි. කෙසේ වෙතත්, 2018 වර්ෂය සඳහා පාඨමාලා ගාස්තු ආදායම රුපියල් 1,292,971,301/- කි. ඒ අනුව, 2019 දී පාඨමාලා ගාස්තු මත පදනම් වූ ආදායම 22% කින් ඉහළ ගොස් තිබේ.

- අනෙකුත් විවිධ ආදායම් රුපියල් 52,260,535/- ක වර්ධනයක් පෙන්නුම් කර ඇති අතර එය 2019 දී එය 14% කින් වර්ධනය වී තිබේ.

- මූල්‍ය වියදම්වලට පෙර මෙහෙයුම් ලාභයේ වැඩිවීමට සමගාමීව, 2018 වර්ෂය සඳහා වූ ශුද්ධ හිඟය රුපියල් 2,079,806,546ට සාපේක්ෂව 2019 වර්ෂය සඳහා මුළු හිඟය රුපියල් 203,713,984 දක්වා අඩු වී තිබේ.

- එපමණක් නොව, 2019 ආදායම් ප්‍රකාශයේ විශ්ලේෂණයට අනුව (මූල්‍ය ප්‍රකාශනවල පිටුව 2), ස්වයං උත්පාදක ක්‍රියාකාරකම්, උපාධි අධ්‍යයන පීඨය සහ අවශෝෂණය කරන ලද ශිෂ්‍ය අරමුදල පිළිවෙලින් රුපියල් 680,918,426/-, රුපියල් 44,451,596/- සහ රුපියල් 556,727,694/- අතිරික්තයකට දායක කරයි. පාඨමාලා ගාස්තු වැඩිවීම සහ ආයෝජන සඳහා පොළී ආදායම වැනි වෙනත් ආදායම් 2019 හි අතිරික්තයට ප්‍රධාන හේතු වේ.

9.2 2020.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන

ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය					
සංක්ෂිප්ත මූල්‍ය තත්ව ප්‍රකාශනය					
(සියලු අගයන් ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත)					
දෙසැම්බර් 31 දිනට			2019		2018
					(පුන ප්‍රකාශිත)
වත්කම්	සටහන				
ජංගම වත්කම්					
මුදල් හා මුදලට සමාන දෑ	02	5,243,179,028		7,175,654,343	
ණයගැතියන්	03	116,109,667		109,470,958	
තොග	04	81,383,013		35,849,670	
පූර්ව ගෙවීම්/ලැබිය යුතු මුදල්	05	1,128,198,233		988,955,645	
කැන්පතු හා අත්තිකාරම්	06	56,773,921		48,673,120	
මුළු ජංගම වත්කම්			6,625,643,861		8,358,603,737
ආයෝජන	07		3,317,922,206		2,585,480,726
ජංගම නොවන වත්කම්					
ස්පෘශ්‍ය වත්කම්	08	37,072,467,327		37,999,937,529	
අස්පෘශ්‍ය වත්කම්	09	3,076,432		4,568,479	
ප්‍රාග්ධන නොනිමි වැඩ	10	618,749,142		587,388,425	
මුළු ජංගම නොවන වත්කම්			37,694,292,902		38,591,894,432
මුළු වත්කම්			**47,637,858,968**		**49,535,978,896**
නිමිකම් සහ වගකීම්					
ජංගම වගකීම්					
ණයහිමියෝ	11	39,752,784		38,714,238	
උපචිත වියදම්	12	1,344,612,771		1,220,993,535	
වෙනත් ණයහිමියෝ	13	1,056,927,821		3,033,879,312	
බැංකු ණය	15	68,172,000		68,172,000	
ජංගම වගකීම් එකතුව			2,509,465,376		4,361,759,085
ජංගම නොවන වගකීම්					
බැංකු ණය	15	35,192,568,364		35,042,787,494	
විශ්‍රාම පාරිතෝෂික ගෙවීම්	14	267,516,099		139,824,254	
මුළු ජංගම නොවන වගකීම්			35,460,084,464		35,182,611,748
නිමිකම්					
රජයේ ප්‍රාග්ධන ප්‍රදාන	16	11,157,107,431		11,271,527,884	
රජයේ වෙනත් ප්‍රදාන	17	705,493,342		705,493,342	
ප්‍රාග්ධන සංචිත	18	325,125,146		330,289,643	
සමුච්චිත (හිඟය)/අතිරික්තය	19	(2,519,416,791)		(2,315,702,807)	
මුළු නිමිකම්			9,668,309,128		9,991,608,062
මුළු නිමිකම් හා වගකීම්			**47,637,858,968**		**49,535,978,896**
විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශනවල සංකලිත කොටසක් වන අදාල සටහන් සමගින් මෙම මූල්‍ය ප්‍රකාශන කියවිය යුතුය .					
මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම හා ඉදිරිපත් කිරීම කළමනාකරණ මණ්ඩලයේ වගකීමක් වේ . මෙම මූල්‍ය ප්‍රකාශන කළමනාකරණ මණ්ඩලය මගින් අනුමත කරන ලද අතර ඒ වෙනුවෙන් පහත පරිදි අත්සන් තැබේ .					
මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ ආදායම් , වියදම්, ප්‍රාග්ධන, වගකීම් හා වත්කම් වල සත්‍ය ගිණුම් ඇතුලත් බවට අපි තරයේ විශ්වාස කරන බව සහතික කර සිටිමු .					
අත්.කළේ :		අත්.කළේ :		අත්.කළේ :	
මේජර් ජනරාල් (විශ්‍රාමික)කමල් ගුණරත්න		**එම්පී පීරිස් RWP RSP VSV USP**		**ඒ කේ එස් ආරියපාල**	
WWV RWP RSP USP ndc psc Mphill		මේජර් ජෙනරාල්		ACA,ACMA,APFA,B.Sc (Acc)Sp	
මේජර් ජනරාල් (විශ්‍රාමික)		උප කුලපති		වැඩබලන මූල්‍යාධිකාරි	
ආරක්ෂක ලේකම්		කොඅාවි		කොඅාවි	

ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය				
සංක්ෂිප්ත විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය				
(සියලු අගයන් ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත)				
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වසර සඳහා			**2019**	**2018**
				(පුන ප්‍රකාශිත)
	සටහන			
ස්වභාවය අනුව ආදායම්				
රජයේ දායක මුදල් පුනරාවර්තන	20		6,215,586,705	3,616,150,327
පාඨමාලා ගාස්තු	21		1,579,902,637	1,292,971,301
රෝහල් ආදායම	22		6,901,809	-
වෙනත් විවිධ ආදායම්	23		413,411,373	361,150,837
මුළු ආදායම්			**8,215,802,523**	**5,270,272,465**
වියදම් ස්වභාවය				
වැටුප් හා දීමනා	24		1,711,700,682	1,270,666,849
ප්‍රවාහන	25		8,093,412	13,948,426
සැපයුම් හා සේවා	26		116,771,548	150,662,258
නඩත්තු	27		93,244,763	81,917,793
ගිවිසුම්ගත සේවා	28		432,587,155	416,065,594
වෙනත් පුනරාවර්තන වියදම්	29		242,264,162	271,816,150
ක්ෂය වීම්	30		1,280,596,735	1,246,691,675
ක්‍රමක්ෂය	31		1,792,047	1,949,542
මෙහෙයුම් වියදම් එකතුව			**3,887,050,502**	**3,453,718,287**
මූල්‍ය පිරිවැයට පෙර මෙහෙයුම් ක්‍රියාකාරකම් මගින් අතිරික්තය /(ඌණතාවය)			**4,328,752,021**	**1,816,554,178**
මූල්‍ය (ආදායම)/වියදම්	31		4,532,466,004	3,896,360,724
කාලපරිච්ඡේදය සඳහා ශුද්ධ අතිරික්තය /(ඌණතාවය)			**(203,713,984)**	**(2,079,806,546)**
විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශනවල සංකලිත කොටසක් වන අදාල සටහන් සමගින්				
මෙම මූල්‍ය ප්‍රකාශන කියවිය යුතුය .				

ආදායම් ප්‍රකාශය විශ්ලේෂණය

	භාණ්ඩාගාර ප්‍රදානයන්		ස්වයං ප්‍රදාන ක්‍රියාකාරකම්				
	විශ්වවිද්‍යාලය	විශ්වවිද්‍යාල රෝහල-කොඅාවි	පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය	ස්වයං මූල්‍ය අරමුදල	දක්ෂිණ මණ්ඩපය	අන්තර්ගුහණය කරන ලද ශිෂ්‍ය අරමුදල	එකතුව
ආදායම (ශ්‍රීලරු)							
රජයේ දායක මුදල් පුනරාවර්තන	1,550,692,453	4,664,894,252	-	-	-	-	6,215,586,705
පාඨමාලා ගාස්තු	-	-	54,783,975	857,965,612	98,615,605	568,537,445	1,579,902,637
රෝහල් ආදායම	-	6,901,809	-	-	-	-	6,901,809
වෙනත් ආදායම්	61,773,055	2,492,759	16,993,056	285,541,049	909,476	45,701,978	413,411,373
එකතුව	**1,612,465,508**	**4,674,288,820**	**71,777,031**	**1,143,506,661**	**99,525,081**	**614,239,423**	**8,215,802,523**
(-) වියදම් (ශ්‍රීලරු)							
වැටුප් හා දීමනා	1,385,701,430	290,658,851	13,976,500	16,632,564	174,170	4,557,167	1,711,700,682
ප්‍රවාහන	5,735,753	636,319	-	1,230,861	486,529	3,950	8,093,412
සැපයුම් හා සේවා	55,152,511	21,932,712	838,366	23,368,935	9,131,438	6,347,585	116,771,548
නඩත්තු	21,404,280	5,263,929	1,001,080	51,553,852	14,013,802	7,820	93,244,763
ගිවිසුම්ගත සේවාවන්	91,386,718	186,163,623	7,308,539	108,656,708	24,810,821	14,260,745	432,587,155
වෙනත් පුනරාවර්තන වියදම්	41,712,951	11,677,288	3,188,615	142,378,479	11,579,845	31,726,984	242,264,162
ක්ෂය වීම	147,213,320	1,016,797,519	1,000,824	76,136,100	38,865,493	583,478	1,280,596,735
ක්‍රමක්ෂය	1,075,727	-	-	185,842	530,478	-	1,792,047
එකතුව	**1,749,382,690**	**1,533,130,241**	**27,313,925**	**420,143,341**	**99,592,577**	**57,487,729**	**3,887,050,502**
මෙහෙයුම් ක්‍රියාකාරකම් මගින් කාලසීමාව සඳහා අතිරික්තය /(ඌණතාවය)	**(136,917,182)**	**3,141,158,578**	**44,463,106**	**723,363,320**	**(67,496)**	**556,751,694**	**4,328,752,021**
මූල්‍ය වියදම්	80,796	4,489,904,804	11,510	42,444,894	-	24,000	4,532,466,004
කාලසීමාව සඳහා ශුද්ධ අතිරික්තය /(ඌණතාවය)	**(136,997,977)**	**(1,348,746,226)**	**44,451,596**	**680,918,426**	**(67,496)**	**556,727,694**	**(203,713,984)**

ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය

අරමුදල් හා සංචිත වෙනස්වීම පිළිබඳ සංක්ෂිප්ත ප්‍රකාශනය

2019 දෙසැම්බර් **31** දිනට අරමුදල් සහ සංචිත වෙනස්වීමේ ප්‍රකාශය

(සියලු අගයන් ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත)

විස්තරය	රජයේ ප්‍රාග්ධන ප්‍රදාන	රජයේ වෙනත් ප්‍රදාන	ප්‍රාග්ධන සංචිත	සමුච්චිත අතිරික්තය / ඌණතාවය	නිමිකම් එකතුව
2019.01.01 දිනට ශේෂය	11,271,527,884	705,493,342	330,289,643	(2,337,055,614)	9,970,255,255
ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්කම් හා වැරදි	-	-	-	21,352,807	21,352,807
2019.01.01 දිනට ශේෂය (සුන ප්‍රකාශිත)	**11,271,527,884**	**705,493,342**	**330,289,643**	**(2,315,702,807)**	**9,991,608,062**
ගැලපීම්					
රජයේ ප්‍රාග්ධන ප්‍රදාන	27,000,000	-	-	-	27,000,000
වසර තුල ආදායම් ප්‍රකාශන සඳහා ප්‍රාග්ධන මාරුකිරීම්	(141,420,453)	-	-	-	(141,420,453)
රන් පදක්කම් පරිත්‍යාග අරමුදල	-	-	96,717	-	96,717
පුස්තකාල පොත් පරිත්‍යාග අරමුදල	-	-	1,564,346	-	1,564,346
වාහන පරිත්‍යාග අරමුදල	-	-	(683,836)	-	(683,836)
විදුලි ආලෝක පරිත්‍යාග අරමුදල	-	-	(30,686)	-	(30,686)
ඔරු පැදීමේ උපකරණ පරිත්‍යාග අරමුදල			(160,000)		(160,000)
විලම්භිත ආදායම - රජයේ ප්‍රදාන ශ්‍රම සම්පත්	-	-	(5,951,038)	-	(5,951,038)
කාලපරිච්ඡේදය සඳහා අතිරික්තය / හිඟය	-	-	-	(203,713,984)	(203,713,984)
2019.12.31 දිනට ශේෂය	**11,157,107,431**	**705,493,342**	**325,125,146**	**(2,519,416,791)**	**9,668,309,128**

ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය					
මුදල් ප්‍රවාහ ප්‍රකාශය					
(සියලු අගයන් ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත)					
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වසර සඳහා		**2019**		**2018**	
				(පුන ප්‍රකාශිත)	
	සටහන				
මෙහෙයුම් ක්‍රියාකාරකම් මගින් මුදල් ප්‍රවාහය					
වසර සඳහා අතිරික්තය /(ඌණතාවය)	20	(203,713,984)		(2,079,806,546)	
ගැලපුම් කිරීම් :					
ස්ථාවර වත්කම් ක්ෂය කිරීම	30	1,280,596,735		1,246,691,675	
අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය	31	1,792,047		1,949,542	
විදේශ මුදල් හුවමාරු පාඩුව /(ලාභය)	32.03.01/ 32.04.01	210,325,927		84,577,667	
විශ්‍රාම පාරිතෝෂික ගෙවීම් සඳහා ප්‍රතිපාදන	14	144,726,082		31,342,932	
දේපළ, පිරියත හා උපකරණ අපහරණය මත පාඩුව	29.01.01	1,193,977		590,970	
නැවත පොත්වලට ගත් ණයගිමියන්	23	(10,052,580)		(8,275,205)	
නැවත පොත්වලට ගත් නොගෙවූ ගෙවීම්	23	(335,736)		(2,334,387)	
කපාහරින ලද ප්‍රාග්ධන නොනිමි වැඩ	10			13,847,542	
ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය	17	(141,420,453)		(137,130,547)	
වාහන පරිත්‍යාග ආදායම	23.01	(683,836)		(4,536,548)	
රජයේ ප්‍රදාන ශ්‍රම සම්පත් ආදායම	23.01	(5,951,038)		(5,951,038)	
විදුලි ආලෝක පරිත්‍යාග ආදායම	23.01	(30,686)		(30,686)	
උපකරණ පරිත්‍යාග ආදායම	23.01	(160,000)		(492,274)	
කල්බදු පොලී වියදම්	16.01	-		28,821	
ණය පොලී වියදම්	31	4,319,300,546		3,808,891,056	
පොලී ආදායම්	23	(213,663,704)		(159,616,735)	
කාරක ප්‍රාග්ධනයේ වෙනස්වීමට පෙර අතිරික්තය /(ඌණතාවය)		**5,381,923,297**		**2,789,746,239**	
තොග (වැඩිවීම)/ අඩුවීම		(45,533,343)		(4,719,417)	
ණයගැති සහ වෙනත් ලැබීම් (වැඩිවීම)/අඩුවීම		(156,865,854)		1,936,902,853	
වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ වල වැඩිවීම /(අඩුවීම)		(1,823,478,883)		702,427,564	
මෙහෙයුම් කටයුතු මගින් ජනිත වූ මුදල් ප්‍රවාහය		3,356,045,216		5,424,357,238	
පාරිතෝෂික සඳහා ගෙවීම්	14.01	(17,034,237)		(5,452,153)	
ගෙවූ ණය පොළී	31	(4,319,300,546)		(3,090,967,694)	
මෙහෙයුම් කටයුතු වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය			**(980,289,566)**		**2,327,937,391**
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය					
ස්පෘශ්‍ය වත්කම් අත්පත්කර ගැනීම	08	(315,325,863)		(3,890,340,589)	
අස්පෘශ්‍ය වත්කම් අත්පත්කර ගැනීම	09	(300,000)		(3,998,415)	
ප්‍රාග්ධන නොනිමි වැඩ	10	(68,966,082)		(71,318,848)	
දේපළ, පිරියත හා උපකරණ අපහරණය මගින් ලද මුදල්	29.01.01	175,064		38,300	
ආයෝජන ස්ථාවර තැන්පතු	07	(600,000,000)		(1,908,079,000)	
පොළී ආදායම්	23	103,896,024		96,291,690	
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය			**(880,520,858)**		**(5,777,406,862)**
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය					
රජයේ ප්‍රාග්ධන දායකත්වය	17	27,000,000		1,235,857,014	
ප්‍රාග්ධන සංචිතය	19	96,717		91,931	
ණය ආපසුගෙවීම	15	(68,172,000)		(68,172,000)	
කල්බදු ආපසුගෙවීම	16	-		(3,500,676)	
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහ			(41,075,283)		1,164,276,269
මුදල් හා මුදලට සමාන දෑවල ශුද්ධ වැඩිවීම /(අඩුවීම)			**(1,901,885,708)**		**(2,285,193,202)**
වසර ආරම්භයේ මුදල් හා මුදලට සමාන දෑ	02		7,175,654,343		8,181,941,373
වසර අවසානයේ මුදල් හා මුදලට සමාන දෑ			**5,273,768,635**		**5,896,748,171**
මුදල් හා මුදලට සමාන දෑ					
බැංකුවේ ඇති මුදල්	02.01		5,243,179,028		7,175,654,343
හුවමාරු (පාඩුව)/ලාභය	33		30,589,608		(1,278,906,171)
වසර අවසානයේ මුදල් හා මුදලට සමාන දෑ			**5,273,768,635**		**5,896,748,171**
විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශනවල සංකලිත කොටසක් වන අදාල සටහන් සමගින් මෙම මූල්‍ය ප්‍රකාශන කියවිය යුතුය .					

1. සුවිශේෂී ගිණුම්කරණ ප්‍රතිපත්ති

1.1 පොදු ප්‍රතිපත්ති

1.1.1 වාර්තාකරණ අස්තිත්වය

ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය (මින්මතු කොආවි ලෙස හැඳින්වෙන) 1981 අංක 68 දරන පාර්ලිමේන්තු පනත මගින් සංස්ථාපිත කරනලද අතර එය කඳවල වත්ත, රත්මලාන, ශ්‍රී ලංකාව යන ස්ථානයේ පිහිටා ඇත.

කොආවි විශ්වවිද්‍යාල රෝහල වෙනම නෛතික අස්තිත්වයක් ලෙස ස්ථාපනය කරන තෙක් විශ්වවිද්‍යාලය යටතේ මෙහෙයුම් කරන ලද අතර එය යටතේ දක්වා ඇත.

1.1.2 මූල්‍ය වර්ෂය

සෑම වසරකම ජනවාරි 1වන දින සිට දෙසැම්බර් 31 වන දින සිට කාලය මූල්‍ය වර්ෂය වේ.

1.1.3 පිළියෙල කිරීමේ පදනම

අ. අනුකූලතා ප්‍රකාශනය
මූල්‍ය ප්‍රකාශනයන් මූල්‍ය තත්ව ප්‍රකාශනය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, අරමුදල් හා සංචිත වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන සඳහා වන සටහන් වලින් සමන්විත වේ. මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLPSAs) අනුකූලව පිළියෙල කර ඇත.

ආ. මැනීමේ පදනම
අදාළ සටහන් යටතේ සාධාරණ වටිනාකම සම්බන්ධයෙන් සුදුසු හෙළිදරව් කිරීම් සිදු කරනු ලැබුවහොත් හැර මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය පදනම මත සකස් කර ඇත.

ඇ. සංසන්දනාත්මක තොරතුරු
වර්තමාන කාලසීමාව සඳහා වන මූල්‍ය ප්‍රකාශන පිළිබඳ වැඩිදියුණු කිරීම හා අන්තර් කාලීන තුලනාත්මකභාවය වැඩිදියුණු කිරීම සඳහා පසුගිය කාලසීමාව සඳහා වන සෑම අගයක් සඳහාම ප්‍රමාණාත්මක, පැහැදිලිකිරීම් හා විස්තරාත්මක තොරතුරු ඇතුලත් සංසන්දනාත්මක තොරතුරු මූල්‍ය ප්‍රකාශනයන්හි වාර්තා කර ඇත.

වෙනත් ආකාරයකින් දක්වා නොමැත්තේ නම්, මෙම මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර ඇති සෑම කාලසීමාවක් සඳහාම සෑමවිටම පහත දක්වා ඇති ගිණුම්කරණ ප්‍රමිතීන් අදාල කරගෙන ඇත.

2018 වසරේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වසර සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදි සිදුවූ පහත සඳහන් වැරදි හා මගහැරීම් හේතුවෙන් ආදායම්, වියදම්, වත්කම් හා වගකීම් එක්කරමින් වාර්තා කරනු ලබනු කාලය තුලදී අගයන් නැවත ප්‍රකාශ කරනු ලැබීය. නැවත ප්‍රකාශ කිරීමේ සම්පූර්ණ බලපෑම පහත දක්වා ඇත.

- ආනයන ණයහිමියන්ගේ ශේෂය පරිවර්තනය කිරීමේදී සිදුවූ දෝෂයක් හේතුවෙන් හුවමාරු පාඩුව රු.12,445,594/-ක් වැඩියෙන් හඳුනාගනු ලැබීය. මෙහි ප්‍රතිඵලයක් ලෙස 2018 වසරේදී වෙනත් ණයහිමියන්ගේ ශේෂය හා විනිමය පාඩුව යන දෙකම එකම ප්‍රමාණයකින් වැඩියෙන් දක්වා ඇත.

- රු. 29,201,912/- ක්වූ LC ආන්තික අගයන් වැරදීමකින් LC ගාස්තු යටතේ වියදමක් ලෙස හඳුනාගනු ලැබීය. මෙහි ප්‍රතිඵලයක් ලෙස 2018 වසරේදී LC ආන්තික ශේෂය එම අගයෙන් අඩුවෙන් දක්වා ඇති අතර LC ගාස්තු ශේෂය එම ප්‍රමාණයෙන්ම වැඩියෙන් දක්වා ඇත.

- 2019 වසර තුල ප්‍රාග්ධනිත කරන ලද ගොඩනැගිලි, ගෘහභාණ්ඩ හා සවිකිරීම්, වෛද්‍ය උපකරණ, උපකරණ, ජල සම්පාදන හා ජලාපවාහන පද්ධතිය, තොරතුරු තාක්ෂණ විද්‍යාගාරය, පරිගණක උපාංග, වාහන, බැරුක්ක අයිතම හා සංග්‍රාම උපකරණවල පෙර වසරට අදාල ක්ෂය කිරීම් වියදම් එක්කරමින් ක්ෂයකිරීම් වියදම්වල සන්සන්දනාත්මක අගයන් රු 19,227,352/-ක් මගින් නැවත ප්‍රකාශ කරනු ලැබීය.

- ක්ෂයකිරීම් ගැලපුම් කිරීමට අනුව, රු. 387,631,530/-ක අගයක් වන මුළු පිරිවැය වෛද්‍ය උපකරණ, ගෘහභාණ්ඩ හා සවිකිරීම්, වාහන, පරිගණක උපාංග, උපකරණ, ගොඩනැගිලි, බැරුක්ක අයිතම හා සංග්‍රාම උපකරණ වල සන්සන්දනාත්මක අගයන් සඳහා එකතුකරනු ලැබීය. වත්කම් එකතුකිරීමට සමගාමීව, වත්කම් එම ප්‍රමාණයෙන්ම සංසන්දනාත්මක අගයන් තුල හඳුනාගනු ලැබීය.

- වර්ගීකරණ දෝෂයක් හේතුවෙන් 2018 වසරේදි ගිවිසුම් කඩකිරීමේ ආදායම හා ලැබිය යුතු ගිවිසුම් කඩකිරීමේ ආදායම රු. 1,050,000/- ක් වැඩියෙන් දක්වා ඇත.

- වර්ගීකරණ දෝෂයක් හේතුවෙන් 2018 වසරේදි විදුලිය වියදම් අඩුවෙන් දක්වා ඇති අතර ලංකා විදුලිබල මණ්ඩලය සඳහා වන තැන්පතු රු.17,347/- ක් වැඩියෙන් දක්වා ඇත.

	2018 වසරේ බලපෑම රු.
ආදායම අඩුවීම	1,050,000/-
වියදම අඩුවීම	22,402,807/-
සමුච්චිත හිඟයේ අඩුවීම	21,352,807/-
වෙනත් ණයහිමියන්ගේ වැඩිවීම	365,228,093/-
ස්පෘශ්‍ය වත්කම්වල වැඩිවීම	368,404,177/-
පෙර ගෙවීම් හා ලැබිය යුතු දෑ වල වැඩිවීම	18,194,069/-
තැන්පතු හා අත්තිකාරම් වල අඩුවීම	17,347/-

ඈ. ව්‍යවහාර හා ඉදිරිපත් කරන මුදල් වර්ගය

මූල්‍ය ප්‍රකාශන, විශ්වවිද්‍යාලයේ ව්‍යවහාර හා ඉදිරිපත් කරනු ලබන මුදල් වර්ගය වන ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කරනු ලැබේ.

ඉ. මුඛ්‍ය ඇස්තමේන්තු හා විචාරාත්මක විනිශ්චයන් භාවිතය

ශ්‍රී ලංකා රාජ්‍ය සේවා ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLPSASS) අනුකූලව මූල්‍ය ප්‍රකාශයන් පිළියෙල කිරීම සඳහා කළමණාකාරීත්වයට වෙනත් මූලාශ්‍ර වෙතින් සෘජුවම දෘශ්‍ය නොවන වත්කම් හා වගකීම්වල ධාරණ මුදල් ප්‍රමාණයන් පිළිබඳව විනිශ්චයන්, ඇස්තමේන්තු හා උපකල්පනයන් කිරීමට සිදු වේ. ඇස්තමේන්තුගත අනුමානයන් අදාළ අවස්ථාව සම්බන්ධයෙන් සාධාරණ වනු ඇතැයි විශ්වාස කෙරෙන ඓතිහාසික අත්දැකීම් හා වෙනත් විවිධ සාධකයක් පදනම් කර ගනු ලබන අතර, විනිශ්චයන් සිදු කිරීමේ පදනම සෑදෙනුයේ එහි ප්‍රතිඵල වලිනි. තථ්‍ය ප්‍රතිඵල ඇස්තමේන්තු කෙරෙන් වෙනස් වීමට ඉඩ තිබේ.

ඇස්තමේන්තු හා ඒවාට පාදක වන උපකල්පනයන් අඛණ්ඩ පදනමින් සමාලෝචනය කෙරේ. ගිණුම්කරණ ඇස්තමේන්තු වලට කෙරෙන ප්‍රතිශෝධනය අදාළ ප්‍රතිශෝධනය එම කාලපරිච්ඡේදය සඳහා පමණක් බලපානුයේ නම් එම කාලපරිච්ඡේදය තුළදීද, එසේ නැතහොත් අදාළ ප්‍රතිශෝදනය වත්මන් හා අනාගත යන කාලපරිච්ඡේද දෙකටම බලපානුයේ නම් අනාගත කාලපරිච්ඡේදය තුළදී ද හඳුනා ගැනේ.

1.2 වත්කම් හා ඒවා තක්සේරු කිරීමේ පදනම

1.2.1 ස්පෘෂ්‍ය වත්කම්

අ. හඳුනාගැනීම හා මැනීම
දේපළ, පිරියත හා උපකරණ අයිතම, සමුච්චිත ක්ෂය කිරීම් හා අපහායනය වීම් අඩුකර පිරිවැයට දක්වනු ලැබේ.

සියළු දේපළ, පිරියත හා උපකරණ අයිතම, මූලිකව සමුච්චිත ක්ෂයකිරීම් හා අපහායනය වීම් අඩුකර පිරිවැයට සටහන් කරනු ලැබේ. වත්කමක වැදගත් උපාංග වෙන්ව හඳුනාගැනීම හා ක්ෂයකිරීම කරනු ලැබේ. දේපළ, පිරියත හා උපකරණයක වැදගත් කොටස් කලින් කලට ප්‍රතිස්ථාපනය කළයුතු වන්නේ නම් අස්තිත්වය විසින් ප්‍රතිස්ථාපනය කරන ලද කොටස හඳුනාගනු ලබන අතර නව කොටස එයට සම්බන්ධ එහි ප්‍රයෝජනවත් ආයු කාලය හා ක්ෂයකිරීම් සමගින් හඳුනාගැනේ. අන් සියලු පිළිසකර හා නඩත්තු පිරිවැය ඒ සඳහා වියදම් දරන පරිදි ‘‘විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ’’ දැක්වේ.

ආ. පිරිවැය

දේපළ, පිරියත හා උපකරණයක පිරිවැය එය මිලදී ගැනීමේ පිරිවැය හා එම වත්කම් ඒවා පිහිටි ස්ථානයට ගෙන ඒමට හා කළමනාකරණය අපේක්ෂා කරන ආකාරයට ක්‍රියාත්මක කිරීමට සුදුසු පරිදි අවශ්‍ය තත්වයට ගෙන ඒමට සෘජුවම දායකවක පිරිවැයවේ.

කොආවි ඉගෙනීමේ ධාරිතාව පවත්වාගෙන යාමට හෝ වර්ධනය කිරීම සඳහා වත්කම් අත්පත්කර ගැනීම, හෝ වත්කම් වලට ස්ථීර ආකාරයේ වැඩිදියුණු කිරීම් සිදු කිරීමේදී දරන ලද සියලු වියදම් ප්‍රාග්ධන වියදම් ලෙස සලකා ඇත.

ඇ. ක්ෂය වීම්

එකී වත්කම් පිරිවැය ඒවායේ ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයු කාලය මත කපා හැරීම සඳහා පහත දැක්වෙන පරිදි වසරක් සඳහා වන අනුපාත වලින් සෘජු රේඛා පදනමින් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ ඇතුලත් කරනු ලැබේ

වත්කම් කාණ්ඩය	ප්‍රතිශතය (%)	වත්කම් කාණ්ඩය	ප්‍රතිශතය (%)
පිහිනුම් තටාකය	2.5	විදුලිය බල රැහැන්	10
ගොඩනැගිලි	2.5	ගබඩා හා බැරැක්ක	10
ක්‍රීඩා සංකීර්ණය	2.5	බෝධි ප්‍රාකාරය	2.5
මායිම් තාප්පය	2.5	දුරකථන භුවමාරුව	10
වාහන	20	ගිණුම් පැකේජය	25
ගෘහභාණ්ඩ හා උපාංග	10	උපකරණ	10
පුස්තකාල පොත්	10	සෝපානය	10
ඉංජිනේරු මාදුකාංග	25	සංගාම උපකරණ	10
විද්‍යාගාර උපකරණ	10	බල උපකරණ	10
පරිගණක	25	මෘදුකාංග	25
පිරියත හා යන්ත්‍ර	10	පරිගණක ජාල පද්ධති	10
පර්යේෂණ විද්‍යාගාර	5	දුරකථන ජාල පද්ධති	10
වායූ උමඟ	4	වායු සමීකරණ හා සංවාතන පද්ධති	5
කොම්පෝස්ට් අංගනය	2.5	මහාමාර්ග හා වැටවල්	2.5
තොරතුරු තාක්ෂණ විද්‍යාගාරය	5	බැරැක්ක අයිතම	10
නාම පුවරුව	2.5	ඉන්ධන ටැංකි	2.5
ජල සම්පාදන හා ජලාපවාහන පද්ධතිය	10		

දේපළ, පිරියත හෝ උපකරණයක අයිතමයක් භාවිතයට ගනු ලබන දින සිට එහි ක්ෂය වීම් ආරම්භවේ.

ඈ. ශේෂ පත්‍රයෙන් කපාහැරීම

දේපළ, පිරියත හා උපකරණවල සියලු අයිතමයන් අපහරණය හෝ ඒවායේ භාවිතය මගින් අනාගත ආර්ථික ප්‍රතිලාභයක් අපේක්ෂා නොකරන විට ශේෂ පත්‍රයෙන් කපා හැරේ. වත්කම් ශේෂ පත්‍රයෙන් කපා හැරීම නිසා සිදුවන කිසියම් ලාභයක් හෝ පාඩුවක් වේනම් එය එම වත්කම ශේෂ පත්‍රයෙන් කපාහරින ලද වසරේදි විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ ඇතුලත් කෙරේ.

1.2.2 ප්‍රාග්ධන නොනිම් වැඩ

සිදුකෙරෙමින් පවතින ප්‍රාග්ධන කාර්යයන් පිරිවැයට දක්වනු ලැබේ. ගොඩනැගිලි ඉදිකිරීමේදී සෘජුවම වියදම් දරන ප්‍රාග්ධන ස්වභාවයේ වියදම් වලදී ප්‍රාග්ධනීකරණය බලාපොරොත්තුවේ. ප්‍රාග්ධන නොනිම් වැඩ, එය භාවිතයට යෙදවිය හැකිවූ විට දේපළ, පිරියත හා උපකරණ වල අදාල වත්කම් කාණ්ඩයට මාරුකල හැකිවේ. උදා:- එය කොආවි අපේක්ෂා කළ අයුරින් මෙහෙයුම් කිරීම සඳහා සුදුසු තත්වයට ගෙනඒමට අවශ්‍ය පිහිටීමේ හා තත්වයේ ඇති විට. ප්‍රාග්ධන නොනිම් වැඩ, යම් සමුච්චිත අපචයවීමේ පාඩු අඩුකර පිරිවැයට දක්වනු ලැබේ.

1.2.3 අස්පෘෂ්‍ය වත්කම්

වෙන් වෙන්ව අත්පත් කරගනු ලැබූ අස්පෘශ්‍ය වත්කම් මූලික හඳුනා ගැනීමේදී පිරිවැයට මනිනු ලැබේ. මූලික හඳුනා ගැනීමට පසුව, පිරිවැය මොඩලයක් අදාල කරගනු ලබන විට, යම් සමුච්චිත ක්‍රමක්ෂය හා අපහායනය වීම් අඩුකර වත්කම් පිරිවැයට ගෙන එනු ලැබේ.

සීමිත ආයුකාලයක් සහිත අස්පෘශ්‍ය වත්කම් ආර්ථික වශයෙන් ප්‍රයෝජනවත් ආයුකාලය මත ක්‍රමක්ෂය කරනු ලබන අතර අස්පෘෂ්‍ය වත්කම අපහායනය වියහැකි බවට හැඟවීමක් ඇතිනම් අපහායනය තක්සේරු කෙරේ.

අස්පෘශ්‍ය වක්කමක් ශේෂ පත්‍රයෙන් කපාහැරීම මගින් ඇතිවන වාසි හා පාඩු, අපහරණයෙන් ලද ශුද්ධ මුදල් හා වත්කමෙහි ඉදිරියට ගෙනයන වටිනාකම අතර වෙනස අනුව මනිනු ලබන අතර වත්කම ශේෂ පත්‍රයෙන් කපාහරින විට විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ හඳුනා ගැනේ.

සියලු අස්පෘශ්‍ය වත්කම් වසර හතරක කාලසීමාවක් තුල ක්‍රමක්ෂය කරනු ලැබේ.

1.2.4 **තොග**

තොග පිරිවැයට හා ශුද්ධ මුදලට පරිවර්තනය කළහැකි වටිනාකමට දක්වනු ලැබේ. ශුද්ධ මුදලට පරිවර්තනය කළහැකි වටිනාකම යනු සාමාන්‍ය ව්‍යාපාරික කාර්යයකදී ඇස්තමේන්තුගත නිමකිරීමේ හා විකිණීමේ වියදම් අඩුකර ඇස්තමේන්තුගත විකුණුම් මිලවේ. වට්ටෝරු භාණ්ඩ පිරිවැය පළමුව ලැබෙන පළමුව පිටවන ක්‍රමය මත පදනම්වේ. තොග අත්පත් කරගැනීමේදී හා ඒවා පිහිටි ස්ථානයට හා එම තත්වයට ගෙනඒම සඳහා දරන ලද වියදම් පිරිවැයට ඇතුලත්වේ.

1.2.5 වෙනත් වත්කම්

ශ්‍රීමත් ජෝන් කොතලාවල අනුස්මරණ කෞතුකාගාරයේ ඇති වටිනා වත්කම් කෞතුක භාණ්ඩ ලෙස හඳුනාගනු ලබන අතර වෙනත් වත්කම් ලෙස කාණ්ඩ කරනු ලැබේ. මෙම වත්කම් සඳහා ක්ෂය කිරීම් සිදුකරනු නොලැබේ.

1.2.6 ලැබිය යුතු දෑ

ලැබිය යුතු දෑ යම් එකතුකළ නොහැකි අගයක් සඳහා යම් දීමනාවක් අඩුකර මුළු ඉන්වොයිසි අගයට හඳුනා ගැනීම හා ඉදිරියට ගෙනයාම සිදුකෙරේ. අවිනිශ්චිත ණය සඳහා ණයකරුවන්ගෙන් 0.5% ක සාමාන්‍ය ප්‍රතිපාදනයක් වෙන්කරනු ලැබේ.

1.2.7 මුදල් හා මුදලට සමාන දෑ

'වක්‍ර ක්‍රමයක්' භාවිතකර පිළියෙලකර ඇති මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ අරමුණ සඳහා, මුදල් හා මුදලට සමාන දෑ අත ඇති මුදල් හා බැංකුවේ තැන්පතුවල ඇති මුදල් වලින් සමන්විත වේ.

1.3 වගකීම් හා ප්‍රතිපාදන

අවශ්‍යතාවය මත හෝ වාර්තාකරනු ලබන දින සිට වසරක් ඇතුලත ගෙවිය යුතු වගකීම්, මූල්‍ය තත්ව ප්‍රකාශයේ ජංගම වගකීම් ලෙස වර්ගීකරණය කරනු ලැබේ. වාර්තාකරනු ලබන දින සිට වසරකට පසුව ගෙවිය යුතු ශේෂයන් ජංගම නොවන වගකීම් වේ.

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදි දන්නා සියලු වගකීම් සලකා බලා ඇත. පෙර සිද්ධියක ප්‍රතිඵලයක් ලෙස කොඅාවි නෛතික හෝ අර්ථකාරී වගකීම් ඇතිවිට ප්‍රතිපාදන හා වගකීම් හඳුනාගනු ලබන අතර වගකීම පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභයක් පිටතට ගලායාමේ සම්භාවිතාවක් ඇත

1.3.1 දිගුකාලීන ණයගැනීම්

2019.12.31 දිනට ගෙවීමට ඉතිරිව ඇති දිගුකාලීන ණය පිළිබඳ විස්තර පහත දක්වා ඇත.

අ) දිගු කාලීන ණය

ණය	ලබාදුන් ණය ප්‍රමාණය	2019.12.31 දිනට උපයෝජිත ණය ප්‍රමාණය	2019.12.31 දිනට ගෙවීමට ඉතිරිව ඇති ණය ප්‍රමාණය	මූලික මුදල ආපසු ගෙවීමේ කාලසීමාව
සාජන්ට් භෝජනාගාර ණය	85,000,000/=	85,000,000/=	40,112,500/=	වසර 15 2012 පෙබරවාරි - 2027 ජනවාරි
පශ්චාත් උපාධි අධ්‍යයන පීඨ (FGS) ණය	750,000,000/=	605,051,283/=	370,668,783/=	වසර 12 2016 මාර්තු- 2028 පෙබරවාරි
කොඅාවි විශ්වවිද්‍යාල රෝහල ඇ.ඩො.ණය	ඇ.ඩො. 95,000,000	ඇ.ඩො. 95,000,000	ඇ.ඩො. 52,500,000	වසර 3 2018 සැප්තැම්බර් 17 දින සිට පරිවර්තන උපලේඛණය අනුව කාර්තුමය වශයෙන්
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර විශ්වවිද්‍යාලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර ඇතිබා කර නොමැති බව.

(අ) 2017 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා මිලදී ගත් වටිනාකම රු. 13,252,217 ක්, ඇ.ඒ.ජ. ඩොලර් 58,120 ක්, බ්‍රිතාන්‍ය පවුම් 9,456 ක් හා යුරෝ 4,212 ක් වූ වෛද්‍ය උපකරණ වර්ග 70 කට අදාලව ඒකක 1,386 ක් අදාල මධ්‍යස්ථාන හෝ ඒකක වෙත නිකුත් කිරීමකින් තොරව 2020 ජූලි 03 දින වන විටත් රෝහලේ වෛද්‍ය උපකරණ ගබඩාව තුල පැවතුණි. ඉන් අයිතම 16 කට අදාල ඒකක 159 ක් හා වටිනාකම රු. 8,898,139 වූ වෛද්‍ය උපකරණවල වගකීම් කාලය ඉකුත් වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ කෙරිගෙන යන වැඩ යටතේ දක්වා තිබූ එකතුව රු. 243,404,558 කට අදාල විශ්වවිද්‍යාල වෛද්‍ය පීඨ ගොඩනැගිල්ල සහ විවාහක නිලධාරී නිවස්නයේ ඉදිකිරීම් කටයුතු පිළිවෙලින් 2014 සහ 2015 වර්ෂ වලදී ආරම්භ කර තිබුණ ද සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වාම ඉදිකිරීම් නිම කිරීමට අපොහොසත් වී තිබුණි.

(ඇ) ඇමරිකන් එක්සත් ජනපද ඩොලර් මිලියන 177.329 ක් සහ රු. මිලියන 3,165.821 ක වූ ණයක් ජාතික ඉතිරි කිරීමේ බැංකුවෙන් ලබා ගෙන ඉදිකර තිබුණු රෝහල 2017 මැයි මාසයේදී නිල වශයෙන් විවෘත කර රෝහල් මෙහෙයුම් කටයුතු 2017 දෙසැම්බර් මාසයේදී ආරම්භ කර තිබුණි. විශ්වවිද්‍යාලීය ශික්ෂණ රෝහල තුල ස්ථාපිත ඒකක 05 ක සහ පස්වන මහලේ වෛද්‍ය වාට්ටු 2019 දෙසැම්බර් 31 දින දක්වාම ආරම්භ කර නොතිබුණි. 2019 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය 1,876 ක් වුවද පුරප්පාඩු 1,417 ක් පැවති අතර තනතුරු නාම 08 ක් සඳහා පමණක් බඳවා ගැනීමේ පටිපාටි අනුමත කර තිබීම එම ඒකක විවෘත නොකිරීම සඳහා හේතුවී තිබූ බව විගණනයේ දී නිරීක්ෂණය විය.

03. අනෙකුත් විගණන නිරීක්ෂණ

(අ) උපචිත වියදම් යටතේ වර්ෂ 01ත් වර්ෂ 03ත් අතර රු. 6,857,090 ක් සහ අනෙකුත් ණය නිමියන් යටතේ වර්ෂ 01ත් වර්ෂ 05 ත් අතර රු. 45,076,279 ක් නිරවුල් නොකර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වාම පැවතුණි.

(ආ) දක්ෂිණ මණ්ඩපය සහ විශ්වවිද්‍යාලීය ශික්ෂණ රෝහල යටතේ ඉඩම් සංවර්ධනය වෙනුවෙන් එකතුව රු. 1,245,694,203 ක් සහ දක්ෂිණ මණ්ඩපයේ නේවාසිකාගාර ඉදිකිරීම වෙනුවෙන් රු. 399,195,246 ක් වැය කර තිබුණද ඊට අදාල ඉඩම්වල නීත්‍යානුකූල අයිතිය පවරා ගෙන නොතිබුණි.

(ඇ) 2019 දෙසැම්බර් 31 දිනට විශ්වවිද්‍යාලයේ අනුමත කාර්ය මණ්ඩලය 903 න් 149 ක පුරප්පාඩුද, දක්ෂිණ මණ්ඩපයේ අනුමත කාර්ය මණ්ඩලය 530 න් 374 ක පුරප්පාඩු ද පැවතුණි.

(ඇ) ඖෂධවේදී උපාධි පාඨමාලාව හැදෑරීම සඳහා බඳවා ගන්නා ශිෂ්‍යයින් සමඟ ඇති කර ගන්නා ගිවිසුමේ 07(ඒ) වගන්තිය අනුව උපාධිය සම්පූර්ණ කල පසු වසර 05 ක් විශ්වවිද්‍යාලයේ ශික්ෂණ රෝහලට සේවය සපයන බවට හා නොඑසේනම් බැඳුම්කර වටිනාකම ලෙස රු.1,050,000 ක මුදලක් ගෙවන බවට ගිවිසුම් ගතවී තිබුණි. එසේ වුවත් 2017 දෙසැම්බර් මාසයේ දී පාඨමාලාව සම්පූර්ණ කල ශිෂ්‍යයින් 20 දෙනෙකු සේවය ලබා නොදී පිටව ගොස් ඇතත් ගිවිසුම් ප්‍රකාරව අයවිය යුතු එකතුව රු. 21,500,000 ක් අය කර ගැනීමට වාර්තාවේ දිනය දක්වාම කටයුතු කර නොතිබුණි.

(ඉ) විශ්වවිද්‍යාලය සහ එහි අධ්‍යයන කටයුතු සිදුකරනු ලබන විදේශීය සිසුන් සමඟ ඇති කර ගන්නා ගිවිසුමේ 3(ජී) වගන්තිය අනුව සිසුන්ගේ ආහාර හා නවාතැන් පහසුකම් සඳහා සිසුන් විසින් ගෙවීම් සිදුකිරීම සෑම මාසයක් අවසානයේදීම සිදු කල යුතු බවට දක්වා ඇතත් අධ්‍යයන කණ්ඩායම් අංක 30 සිට 36 දක්වා සිසුන් 76 දෙනෙකු 2014 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා රු. 7,248,556 ක මුදලක් ගෙවා නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

ජේනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය
ஜெனரல் சேர் ஜோன் கொத்தலாவல பாதுகாப்புப் பல்கலைக்கழகம்
General Sir John Kotelawala Defence University

රත්මලාන 10390, ශ්‍රී ලංකා. இரத்மலானை 10390, இலங்கை. Ratmalana 10390, Sri Lanka.

දුරකථන / தொலைபேசி / Telephone: +94-112632028, +94-112638656, +94-112622995
ෆැක්ස් / பெக்ஸ் / Fax: +94-112605160
Web : www.kdu.ac.lk
E-mail : kdudefence@kdu.ac.lk

කොආවි/අවිආ/විවි/01/2020( )

විගණන අධිකාරි
ජාතික විගණන කාර්යාලය
අංක 306/72
පොල්දූව පාර
බත්තරමුල්ල.

2020 අගෝස්තු මස 14 වන දින

ජේනරල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව (කෙටුම්පත)

යොමුව: DEF/A/KDU/1/2019/11 හා 2020 අගෝස්තු මස 14 දිනැති ජාතික විගණන කාර්යාල විගණන විමසුම.

1. යොමුගත විගණන විමසුමෙන් නිරීක්ෂණය කරන ලද කරුණු සම්බන්ධයෙන් ඊට අදාළ අංශ වෙතින් තොරතුරු විමසීමක් සිදුකරන ලද අතර ඊට අදාළ පිළිතුරු වාර්තාව මේ සමග කාරුණිකව ඉදිරිපත් කරනු ලැබේ.

විගණන නිරීක්ෂණ අංක 1.2 – මතය සඳහා පදනම

විගණන ඡේද (අ)

නිවැරදි කිරීමට කටයුතු කෙරේ.

විගණන ඡේද (ආ)

නිවැරදි කිරීමට කටයුතු කෙරේ.

විගණන ඡේද (ඇ)

සමාජශාලා ආදායම දැනට විශ්වවිද්‍යාලයේ ආදායමක් ලෙස හඳුනා නොගන්නා අතර අයවිය යුතු ආදායමෙන් කොටසක් ඉදිරියේ ස්වයං මූල්‍ය අරමුදල වෙත ලබා ගැනීමට කටයුතු කෙරේ.

බේකිරියේ ආදායම දැනට විශ්වවිද්‍යාලයේ ආදායමක් ලෙස හඳුනා නොගන්නා අතර අයවිය යුතු ආදායමෙන් කොටසක් ඉදිරියේ ස්වයං මූල්‍ය අරමුදල වෙත ලබා ගැනීමට කටයුතු කෙරේ.

ජන අවන්හල් ආදායම දැනට විශ්වවිද්‍යාලයේ ආදායමක් ලෙස හඳුනා නොගන්නා අතර අයවිය යුතු ආදායමෙන් කොටසක් ඉදිරියේ ස්වයං මූල්‍ය අරමුදල වෙත ලබා ගැනීමට කටයුතු කෙරේ .

කෙඩෙට් නිලධාරී අවන්හලෙහි මෙහෙයුම් වලින් ලබාගන්නා ලාභයෙන් කොටසක් සහ බිම් කුලී ආදායම ද ඉදිරියේ දී විශ්වවිද්‍යාල ගිණුමට ලබා ගැනීමට කටයුතු කෙරේ.

<u>විගණන ඡේද (ඈ)</u>
ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කෙරේ.

<u>විගණන ඡේද (ඉ)</u>
මු. රෙ 571 (3) යටතේ 2020.03.31 දින ආදායමක් ලෙස හඳුනාගෙන ඇත.

<u>විගණන ඡේද (ඊ)</u>
මෙහි විශ්වවිද්‍යාල ගිණුමෙහි ලැබිය යුතු වටිනාකම ලෙස දැක්වෙන රු. 26,250/- 2020.06.10 දින ලදුපත් අංක 435 යටතේ නිරවුල් වී ඇති අතර, ස්වයං මූල්‍ය අරමුදල යටතේ අනෙකුත් ණය හිමියන් ලෙස දැක්වෙන රු. 500,060/- ක ණය මුදල 2020.03.31 දින ජර්නල් අංක 13 යටතේ ආදායමක් ලෙස හඳුනාගෙන ඇත.

<u>විගණන ඡේද (උ)</u>
2019.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ගිණුම් පිළියෙල කිරීමේදී ගිණුම් අංශය වෙත එම තොරතුරු ලැබී නොතිබුණි බැවින් 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුලත් කර නොමැත. ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කෙරේ.

<u>විගණන නිරීක්ෂණ අංක 2</u>

<u>විගණන ඡේද (අ)</u>
ඉහත සඳහන් නිරවුල් නොවූ අත්තිකාරම් මුදල් වලට අදාල කාල විශ්ලේෂණය පහත පරිදි වේ.

	University	FGS	Self-Finance	Southern Campuses	Total
Purchasing Advance					
2013	164,458.10				164,458.10
2015		47,678.00	-	382,321.30	429,999.30
2016				147,400.00	147,400.00
Petty Cash Advance					
2019	25,000.00				25,000.00
Other Advance					
2014			22,500.00		22,500.00
Total	**189,458.10**	**47,678.00**	**22,500.00**	**529,721.30**	**789,357.40**

<u>විගණන ඡේද (ආ)</u>
කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ සම සෞඛ්‍ය වෛද්‍ය පීඨයේ උපාධි පාඨමාලාව හැදෑරීම සඳහා බැදුම්කරයකට යටත්ව බඳවාගන්නා ලද ශිෂ්‍යයන් අතුරින් මේ වන විට විශ්වවිද්‍යාලයේ සේවයේ නියුතු නොවන පුද්ගලයින්ට අදාලව නීතිමය කරුණු පිළිබඳ තොරතුරු විමසා ඇත.

එයට අදාලව 2020 ජූලි මස 20 වන දින වන විට 43 දෙනෙකු සේවය හැර ගොස් ඇති අතර ඔවුන්ට අදාලව සේවය අවසන් කිරීමේ ලිපි විශ්වවිද්‍යාල රෝහලේ මානව සම්පත් අංශය මගින් නිකුත් කර ඇත.

තවද මේ වන විට එයට අදාලව ශිෂ්‍යයන් 23 දෙනෙකුට එරෙහිව නීතිපති දෙපාර්තමේන්තුව හරහා නඩු පැවැරීමට ඇවැසි කටයුතු සිදුකර ඇති අතර ඉතිරි නීතිමය පියවරයන්හි මූලික අදියර සිදුකර ඇති අතර, ඉතිරි ශිෂ්‍යයන්ට අදාලව නීතිමය පියවරයන්හි මූලික අදියර වශයෙන් ඔවුන්ට හා ඔවුන්ගේ ඇපකරුවන්ට එම බැදුම්කර ගෙවීමට දැනුම්දීමේ ලිපි යැවීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවති.

<u>විගණන ඡේද (ඇ)</u>

2018 වර්ෂය දක්වා විදේශීය සිසුන්ගෙන් ආහාර හා නවාතැන් පහසුකම් වෙනුවෙන් අයකිරීම් උපකුලපති සුභසාධක අරමුදල මගින් සිදුකර ඇති අතර 2018.12.31 දින උපකුලපති සුභසාධක අරමුදල මගින් ලැබිය යුතු ආහාර හා නවාතැන් පහසුකම් ගාස්තු ලෙස ඇමෙරිකානු ඩොලර් 43,902 වටිනාකමක් ස්වයං මූල්‍ය අරමුදල වෙත මාරුකර ඇත. ඒ අනුව රුපියල් 8,021,334.42 ක වටිනාකමක් ලැබිය යුතු ලෙස ගිණුම්ගත කර ඇත.

නමුත් ඒ වන විටත් ස්වයං මූල්‍ය අරමුදල වෙත ගෙවා තිබූ රු. 2,268,040.50 සහ ඇමෙරිකානු ඩොලර් 5,645 මුදල ඉහත ලැබිය යුතු වටිනාකම ගණනය කිරීමේදී සලකා නොමැත. එම ලැබීම් වටිනාකම් දෙක ලෙජරයේ ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

මීට අමතරව ඉහත ලැබිය යුතු ඇමෙරිකානු ඩොලර් 43,902 ගණනය කිරීමේදී සිසුන් නිවාඩු ගිය කාලපරිච්ඡේදයන් සඳහා අඩුවිය යුතු වටිනාකම වන ඇමෙරිකානු ඩොලර් 3,969.75 මුදල අඩුකර නොතිබුණි.

ඒ අනුව 2019.12.31 දිනට නිවැරදිව ලැබිය යුතු වටිනාකම වන්නේ (2019 වර්ෂයේ ලැබුණු මුදල් අඩුකල පසු) රුපියල් 3,943,096.58 (USD 21,725.05 x 181.50) ක මුදලක් පමණි.

එබැවින් දැනට ලෙජරයේ දැක්වෙන වටිනාකම වන රු. 11,191,653.00 (USD 61,662 x 181.50) සහ නිවැරදි වටිනාකම වන රු 3,943,096.58 (USD 21,725.05 x 181.50) අතර වෙනස වන රු.7, 248,556.42 (USD 39,936.95 x 181.50) ක මුදල ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කෙරේ.

- 613 වන කළමනාකරණ මණ්ඩල තීරණ වලට අනුව කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල පනත් කෙටුම්පත ඒ ආකාරයෙන්ම පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර ඒ අනුව ඉදිරි කටයුතු සිදුකළ යුතු බව දන්වා ඇත. ඊට අදාල කළමනාකරණ මණ්ඩල තීරණ **ඇමුණුම 1** යටතේ දක්වා ඇත.

තවද මෙම කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල පනත් කෙටුම්පත පාර්ලිමේනතුවට යොමු කිරීමට අවශ්‍ය ඉදිරි කටයුතු සලසා දෙනමෙන් KDU/L/27 ( ) 15 May 2020 දරණ ලිපිය මගින් ආරක්ෂක අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත. ඊට අදාල ලිපිය **ඇමුණුම 2** ලෙස දක්වා ඇත.

<u>විගණන ඡේද (ඈ)</u>
රෝහල් වෛද්‍ය උපකරණ ගබඩාව පිළිබඳ අපේක්ෂිත විස්තර වාර්තාව මෙයට **ඇමුණුම 3** වශයෙන් ඉදිරිපත් කරන බැව් දන්වා සිටිමි.

තවද මෙම වාර්තාව සම්බන්ධයෙන් ගත් ක්‍රියාමාර්ග ඇතුලත්ව ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් තුමා වෙත 2020 අගොස්තු මස 20 වන දිනැති ලිපිය **ඇමුණුම 4** මගින් දැක්වේ.

<u>විගණන ඡේද (ආ)</u>
2020 වර්ෂයේ ස්වයං මූල්‍ය අරමුදල යටතේ වැඩ ආරම්භ කර ඇත.

<u>විගණන ඡේද (ඇ)</u>
2020 වර්ෂයේ ස්වයං මූල්‍ය අරමුදල යටතේ වැඩ ආරම්භ කර ඇත.

<u>විගණන ඡේද (ඈ)</u>
යොමුගත ලිපියට අනුව රෝහල තුළ ස්ථාපිත ඒකකයන් දැනට මෙහෙයුම් කටයුතු ආරම්භ නොකිරීමට හේතුව වශයෙන් සරිලන පරිදි කාර්යමණ්ඩලය හා වෛද්‍ය උපකරණ නොමැති බව පෙන්වා දෙන අතර 2019 වර්ෂයට අදාලව ඉහත සඳහන් කරන ලද අංශයන් අතරින් දන්ත වෛද්‍ය ඒකකය (Dental Unit) ආරම්භ කිරීම සඳහා ස්ථීර වෛද්‍යවරයෙකු බඳවාගෙන ඇති අතර අදාල වෛද්‍ය උපකරණ ප්‍රතිසම්පාදන ක්‍රියාවලියේ පවතිනු ලබන බව පෙන්වා දෙමි. තවද මෙම අංශයන් අතින් (Dialysis Unit) රුධිර

කාන්දුකරන ඒකකයේ මෙහෙයුම් කටයුතු 2020 අගෝස්තු මස අවසානයේ ආරම්භ කිරීමට කටයුතු සිදු කර ඇති බව දන්වා සිටිමි.

03 අනෙකුත් විගණන නිරීක්ෂණ

විගණන ඡේද (අ) i
සමාලෝචිත වර්ෂයේදී ඌණතාවය අඩුවීමට රජයේ පුනරාවර්තන ලැබීම් වැඩි වීම සහ පාඨමාලා ගාස්තු ආදායම වැඩිවීම හේතු වී ඇත.

විගණන ඡේද (අ) ii
විශ්වවිද්‍යාල රෝහල සඳහා ජාතික ඉතුරු කිරීමේ තැන්පතුවෙන් ලබාගත් ණය මුදල සඳහා ගෙවූ පොළිය වියදමට සාපේක්ෂව රජයෙන් ලැබුණු පුනරාවර්තන ආදායම් වැඩිවීම ප්‍රධාන වශයෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම ඉහල යාමට හේතු වී ඇත.

විගණන ඡේද (අ) iii
2018 වර්ෂයේදී දකුණු ආසියානු වෛද්‍ය හා තාක්ෂණික ආයතනයෙන් අනුයුක්ත සිසුන්ගේ පාඨමාලා ගාස්තු ආදායම් අවසන් මාස 04 සඳහා පමණක් අදාල වූ අතර සමාලෝචිත වර්ෂයේ මුලු වසර සඳහාම ආදායම් හඳුනාගැනීම පාඨමාලා ගාස්තු වැඩිවීමට හේතු විය.

විගණන ඡේද (අ) iv
විශ්වවිද්‍යාල රෝහල සඳහා ලබාගත් ණය පිරිවැය ඉහල යාම වියදම් වැඩිවීමට බලපා ඇත.

විගණන ඡේද (අ) v
2019 වර්ෂයේ ණය ප්‍රාග්ධනය 35,260,740,364.00 ලෙස නිවැරදි විය යුතු අතර ඒ අනුව තෝලන අනුපාතය 3.65 : 1 ක් වේ. විශ්වවිද්‍යාල රෝහල සඳහා ලබාගෙන ඇති ණය ප්‍රාග්ධන අධි තෝලන තත්වයන් පැවතීමට හේතු වී ඇත.

විගණන ඡේද (අ) vi
ජංගම වත්කම් අඩු වීමට වඩා වැඩි ප්‍රතිශතයකින් ජංගම වගකීම් අඩුවීම ජංගම අනුපාතය වැඩි වීමට හේතු වී ඇත.

විගණන ඡේද (අ) vii
සමාලෝචිත වර්ෂයේ ශුද්ධ ඌනතාවය පෙර වසරට සාපේක්ෂව අඩුවීම මෙයට හේතු වී ඇත.

විගණන ඡේද (අ) viii
සමාලෝචිත වර්ෂයේ ශුද්ධ ඌනතාවය පෙර වසරට සාපේක්ෂව අඩුවීම මෙයට හේතු වී ඇත.

විගණන ඡේද (අ) ix
2019 වර්ෂයේ අයවැය සකස් කිරීම භාණ්ඩාගාරයෙන් ලද මුදල් මත පමණක් සිදු කර ඇත. මෙහිදි සත්‍ය වියදම ස්වයං මූල්‍ය අරමුදලින් කරන ලද වියදම ද ඇතුළත්ව ඇත .

විගණන ඡේද (ආ)
මු. රෙ 571 (3) යටතේ 2020.03.31 දින ආදායමක් ලෙස හඳුනාගෙන ඇත.

විගණන ඡේද (ඇ)
ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කෙරේ.

විගණන ඡේද (ඈ)
මෙම විශ්වවිද්‍යාලය තුළ පුහුණුව ලබන කෙඩෙට් නිලධාරීන් / නිලධාරිනියන්ගේ ආහාර මුදල් එක් එක් මාසයන්ට අදාලව ත්‍රිවිධ හමුදාවන් වෙතින් මෙම ලබන කෙඩෙට් නිලධාරි නිවස්න ගිණුම වෙත ඉදුරාම ලැබෙන අතර එම මුදල් ලබන කෙඩෙට් නිලධාරීන්ගේ සුභසාධක කටයුතු වෙනුවෙන් කෙඩෙට් නිලධාරි නිවස්න ගිණුම නමින් මහජන බැංකුව රත්මලාන ශාඛාවේ ගිණුම් අංක 080100171101250 දරණ ජංගම ගිණුම තුල මේ දක්වා පවත්වාගෙන යන බව දන්වමි.

ඉහත ජංගම ගිණුම තුලින් මුදල් පොලී ප්‍රතිශතයන් නොලැබීම හේතුවෙන් බැංකු තුළ මුදල් ආයෝජනය කර ලැබෙන පොලී ප්‍රතිශත මුදලින් කෙඩෙට් නිලධාරින්/ නිලධාරිනියන්ගේ සියලු සුභසාධන කටයුතු ඉහල නැංවීම සඳහා මහජන බැංකුව රත්මලාන ශාඛාවේ ගිණුම් අංක 0806001000073779 දරණ ගිණුම තුළ 2013 සැප්තැම්බර් මස 04 වන දින රු. 2,000,000.00 ක මුදලක් වශයෙන් හා ජාතික ඉතිරි කිරීමේ බැංකුව මොරටුව ශාඛාවේ ගිණුම් අංක 200201168495 දරණ ගිණුම තුළ 2002 සැප්තැම්බර් මස 14 වන දින රු. 394,100.00ක මුදලක් වශයෙන්ද ආයෝජනය කර ඇති බැව් දන්වා සිටිමි.

තවද 2019 ජුනි 02 දිනට ඉහත සඳහන් ආයෝජන ගිණුම් තුළ රු .5, 416, 880.78 ක මුදලක් ඇති අතර ඒ සබැඳිව එම බැංකු ශාඛා වෙතින් ලබාගෙන ඇති ආයෝජන වාර්තාවන්හි පිටපත් 01 බැගින් **ඇමුණුම 5** ලෙස ඔබ කාර්යාලයේ ඉදිරි කටයුතු සඳහා මේ සමග ඉදිරිපත් කර ඇති බව කාරුණිකව දන්වා සිටිමි.

<u>විගණන ඡේද (ඉ)</u>

කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ 2019 දෙසැම්බර් 31 දිනට කාර්ය මණ්ඩලය පහත පරිදි වේ.

කාර්ය මණ්ඩලය	තනතුරු නාම සංඛ්‍යාව	අනුමත කාර්ය මණ්ඩලය	තත්‍ය කාර්ය මණ්ඩලය	පුරප්පාඩු
අධ්‍යයන කාර්ය මණ්ඩලය	05	223	183	40
සහකාර (අධ්‍යයන සහකාර) කාර්ය මණ්ඩලය	06	43	22	21
තාවකාලික (අධ්‍යයන සහකාර) කාර්ය මණ්ඩලය	02	49	27	32
පරිපාලන කාර්ය මණ්ඩලය	19	26	20	06
පුස්ථකාල කාර්ය මණ්ඩලය	05	21	19	02
ලිපිකරු හා සමාන්තර කාර්ය මණ්ඩලය	11	174	147	27
සුළු සේවක කාර්ය මණ්ඩලය	24	367	336	29
එකතුව		**903**	**743**	**169**

කෙසේ වුවද 2020.08.19 වන විට ඉහත තනතුරු වල තත්‍ය සංඛ්‍යාවන් පහත පරිදි වෙනස් වී තිබේ.

කාර්ය මණ්ඩලය	තනතුරු නාම සංඛ්‍යාව	අනුමත කාර්ය මණ්ඩලය	තත්‍ය කාර්ය මණ්ඩලය	පුරප්පාඩු
අධ්‍යයන කාර්ය මණ්ඩලය	05	223	179	44
සහකාර (අධ්‍යයන සහකාර) කාර්ය මණ්ඩලය	06	43	23	20
තාවකාලික (අධ්‍යයන සහකාර) කාර්ය මණ්ඩලය	02	49	29	29
පරිපාලන කාර්ය මණ්ඩලය	19	26	22	04
පුස්තකාල කාර්ය මණ්ඩලය	05	21	19	02
ලිපිකරු හා සමාන්තර කාර්ය මණ්ඩලය	11	177	149	28
සුළු සේවක කාර්ය මණ්ඩලය	24	367	335	32
එකතුව		**903**	**743**	**169**

<u>අධ්‍යයන කාර්ය මණ්ඩලය</u>

01. අධ්‍යයන කාර්ය මණ්ඩලයේ දැනට පුරප්පාඩුව පවතින තනතුරු සංඛ්‍යාව වන 44 න් 31 ක්ම මහාචාර්ය තනතුරු වන අතර, එම තනතුරට බඳවා ගැනීමට අවුරුදු පතා පුවත්පත් දැන්වීම් පළ කලද සුදුසුකම් සහිත අයදුම්පත් ලැබීමේ හිඟ කමක් පවතී. 2019 වර්ෂයන්හි පළකල පුවත්පත් දැන්වීම් වලට අනුව අයදුම් කළ අයදුම්කරුවන්ගේ ඇගයීම් කටයුතු අතර (Professor evaluation – UGC Circular No. 916 & 04/2010) එක් අයදුම්කරුවකුගේ ඇගයීම් කටයුතු පමණක් මේ වන විට ක්‍රියා කෙරෙන අතර, කුසලතා උසස්වීම් (on merit promotion) පදනම මත මහාචාර්ය තනතුර සඳහා ඇගයීම් කටයුතු කෙරෙන අයදුම්පත් සංඛ්‍යාවද 02 කි.

02. තවද, අධ්‍යයන කාර්ය මණ්ඩලයේ මේ වන විට පවතින තනතුරු පුරප්පාඩු සඳහා 2020.08.16 දින පුවත්පත් දැන්වීමක් පළ කරන ලද අතර, ඉදුරාම මහාචාර්ය තනතුර සඳහාද තවත් පුවත්පත් දැන්වීමක් පළකිරීමටද මේ වන විට කටයුතු කරමින් සිටී.

සහකාර (අධ්‍යයන සහකාර) කාර්ය මණ්ඩලය

01. අනෙකුත් අධ්‍යයන සහකාර පුරප්පාඩු වී ඇති තනතුරු සඳහා 2019 වසරේ පළකරන ලද පුවත්පත් දැන්වීමට අනුව 2020.08.17 දින ජාල පරිපාලක, මෘදුකාංග ඉංජිනේරු සහ පරිගණක වැඩසටහන්/පද්ධති විශ්ලේෂක යන තනතුරු සඳහා බඳවා ගැනීමේ සම්මුඛ පරීක්ෂණ සිදු කරන ලද අතර, කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමට යටත්ව එම තනතුරු පුරප්පාඩුව පිරවීම සඳහා තෝරා ගැනීම් සිදු කර ඇත.

තාවකාලික (අධ්‍යයන සහකාර) කාර්ය මණ්ඩලය

01. තාවකාලික (අධ්‍යයන සහකාර) කාර්ය මණ්ඩලයේ තනතුරු වලින් තාවකාලික ප්‍රදර්ශක (Temporary Demonstrator) තනතුර මූලිකවම එක් අවුරුදු කොන්ත්‍රාත් කාලයකට යටත්ව ලබා දෙන්නකි. තවද, වෛද්‍ය පීඨයේ තාවකාලික ප්‍රදර්ශක තනතුර සඳහා බඳවා ගන්නා කාර්ය මණ්ඩලයේ වෛද්‍ය උපාධිදරයන් ඔවුන්ගේ සීමාවාසික පුහුණුව ආරම්භ වූ විගසම මෙම විශ්වවිද්‍යාලයේ ඔවුන් දරණ තනතුරෙන් ඉවත් වේ.

02. කෙසේ වෙතත්, 2020.08.13 වන දින තාවකාලික ප්‍රදර්ශක තනතුර සඳහා සම්මුඛ පරීක්ෂණයක් සිදු කර ඇති අතර, අවසාන තේරීම් කටයුතු මේ වන විටත් සිදු කරමින් පවතී.

පරිපාලන කාර්ය මණ්ඩලය

01. රටේ පැවැති අයහපත් වසංගත තත්ත්වය සහ මහ මැතිවරණ කාල සීමාව හේතුවෙන් 2020 වසර සඳහා බඳවා ගැනීම් කටයුතු මේ වන තෙක් සිදු කිරීමට නොහැකි වූ අතර, 2020.08.16 වන දින මූල්‍යාධිකාරී සහ විශ්වවිද්‍යාල වෛද්‍ය නිලධාරී යන තනතුරු සඳහා බඳවා ගැනීම වෙනුවෙන් පුවත්පත් දැන්වීම් පළ කිරීමට කටයුතු කරන ලදී. මේ වන විට පරිපාලන කාර්ය මණ්ඩලයේ අනෙකුත් තනතුරු පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට පුවත්පත් දැන්වීම් සකස් කරමින් සිටී.

පුස්තකාල කාර්ය මණ්ඩලය

01. පුස්තකාලයාධිපති තනතුරට බඳවා ගැනීම සඳහා ඇගයීමේ කටයුතු සිදු කරගෙන යාමේදී එම අයදුම්කරුවන් 2020.07.14 වන දින පැවැති ඇගයීම් ක්‍රියාවලියේදී (Librarian evaluation – UGC Circular No. 921) අසමත් වීම මත, 2020.08.16 වන දින නැවත වරක් පුස්තකාලයාධිපති තනතුර සඳහා බඳවා ගැනීමට සලකා බැලීමට අයදුම්පත් කැඳවීමට පුවත්පත් දැන්වීමක් පළකිරීමට කටයුතු කරන ලදී.

02. පුස්තකාල තොරතුරු සහකාර තනතුරු පුරප්පාඩුව සඳහාද 2020.08.09 වන දින පුවත්පත් දැන්වීමක් පළකර ඇත.

ලිපිකරු හා සමාන්තර ශ්‍රේණි කාර්ය මණ්ඩලය

01. පුරප්පාඩු වී ඇති තනතුරු පුරප්පාඩු සඳහා බඳවා ගැනීම් සිදු කිරීමට 2020.08.09 වන දින පුවත්පත් දැන්වීමක් පළකර ඇත.

සුළු ශ්‍රේණි කාර්ය මණ්ඩලය

01. රජයේ ප්‍රතිපත්ති අනුව මෙම විශ්වවිද්‍යාලයේ දැනට පුරප්පාඩු 32 ක්ව පවතින සුළු ශ්‍රේණි කාර්ය මණ්ඩලය සඳවා නව බඳවා ගැනීම් සිදු කිරීම තාවකාලිකව නතර කොට ඇත.

කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයට අනුබද්ධිත දකුණු ආසියානු වෛද්‍ය හා තාක්ෂණික ආයතනයේ 2019 දෙසැම්බර් 31 දිනට කාර්ය මණ්ඩලය පහත පරිදි වේ.

කාර්ය මණ්ඩලය	තනතුරු නාම සංඛ්‍යාව	අනුමත කාර්ය මණ්ඩලය	තත්‍ය කාර්ය මණ්ඩලය	පුරප්පාඩු
අධ්‍යයන කාර්ය මණ්ඩලය	05	52	03	49
තාවකාලික (අධ්‍යයන සහකාර) කාර්ය මණ්ඩලය	01	24	01	23
පරිපාලන කාර්ය මණ්ඩලය	08	12	09	03

පුස්ථකාල කාර්ය මණ්ඩලය	01	01	00	01
ලිපිකරු හා සමාන්තර කාර්ය මණ්ඩලය	02	31	00	31
සුළු සේවක කාර්ය මණ්ඩලය	03	29	00	29
එකතුව		**149**	**13**	**136**

කෙසේ වුවද 2020.08.19 වන විට ඉහත තනතුරු වල තත්‍ය සංඛ්‍යාවන් පහත පරිදි වෙනස් වී තිබේ.

කාර්ය මණ්ඩලය	**තනතුරු නාම සංඛ්‍යාව**	**අනුමත කාර්ය මණ්ඩලය**	**තත්‍ය කාර්ය මණ්ඩලය**	**පුරප්පාඩු**
අධ්‍යයන කාර්ය මණ්ඩලය	05	52	03	49
තාවකාලික (අධ්‍යයන සහකාර) කාර්ය මණ්ඩලය	01	24	01	23
පරිපාලන කාර්ය මණ්ඩලය	08	12	08	04
පුස්තකාල කාර්ය මණ්ඩලය	01	01	00	01
ලිපිකරු හා සමාන්තර ශ්‍රේණි කාර්ය මණ්ඩලය	02	31	12	19
සුළු සේවක කාර්ය මණ්ඩලය	03	29	00	29
එකතුව		**149**	**13**	**125**

01. මෙම විශ්වවිද්‍යාලයට අනුබද්ධිත දකුණු ආසියානු වෛද්‍ය හා තාක්ෂණික ආයතනයේ තනතුරු සියල්ලම අනුමත වී ඇත්තේ කොන්ත්‍රාත් පදනම මතය. තවද, එම තනතුරු සඳහා එක් එක් කාණ්ඩයට අනුමත වී ඇති වැටුප් ප්‍රමාණයන් විශ්වවිද්‍යාලයේ ස්ථිර කාර්ය මණ්ඩලයේ එක් එක් තනතුරු සඳහා අනුමත වැටුප් පරිමාණයන්ට වඩා අඩු අගයක් ගනී. එසේ හෙයින්, තනතුරු පුරප්පාඩු සඳහා පුවත්පත් දැන්වීම් පළ කලද, සංසන්දනාත්මක අඩු වැටුප් අගයන් මත සියළුම තනතුරු සඳහා අපේක්ෂිත අයදුම්පත් සංඛ්‍යාවක් නොලැබීමේ ප්‍රවණතාවයක් ඇත

02. තවද, ලැබෙන අයදුම්පත් හරහා බඳවා ගැනීම් සිදු කලද, රාජකාරී ස්වභාවය මත වැටුප යන කාරණය සංසන්දනය වීම හරහා විශේෂයෙන්ම අධ්‍යයන හා පරිපාලන කාර්ය මණ්ඩල තනතුරු වලට බඳවා ගන්නා අයදුම්කරුවන් සේවයෙන් ඉවත් වී යාමේ ප්‍රවණතාවයක්ද පවතී.

03. අධ්‍යයන, තාවකාලික (අධ්‍යයන සහකාර) සහ පරිපාලන කාර්ය මණ්ඩල තනතුරු පුරප්පාඩු සඳහා 2020 පෙබරවාරි මස පුවත්පත් දැන්වීම් පල කරන ලද අතර, එම පුවත්පත් දැන්වීම්හි අයදුම්පත් භාරගන්නා අවසන් දිනය 2020.03.16 දින විය.

04. නමුත් ඒ සමඟම රටෙහි පැවැති අයහපත් වසංගත තත්ත්වය හේතුවෙන් අයදුම් පත් ලැබීම සහ ඉදිරි කටයුතු අඩාල විය. මෙම වසරේ මැයි මස සිට නැවත එම කාර්යයන්හි ඉදිරි කටයුතු ආරම්භ කලද මහ මැතිවරණ කාල සීමාව හේතුවෙන් නැවත එම කටයුතු සිදු කිරීම තාවකාලිකව නතර කල අතර මේ වන විට සම්මුඛ පරීක්ෂණ කටයුතු සිදු කිරීමට අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කරමින් පවතී.

05. පරිපාලන කාර්ය මණ්ඩලයේ සහකාර ලේඛකාධිකාරී ලෙස සේවය කරන ලද නිලධාරිනිගේ ඉල්ලා අස්වීම මත එම තනතුර පුරප්පාඩු වී ඇති අතර (නව බඳවා ගැනීම සඳහා සම්මුඛ පරීක්ෂණ කටයුතු සිදු කරමින් පවතී), අනෙකුත් පුරප්පාඩු වී ඇති පරිපාලන තනතුරු හමුදාවන් මඟින් අනුයුක්ත කිරීමට අනුමැතිය ලද ඒවාය.

06. ලිපිකරු හා සමාන්තර ශ්‍රේණි කාර්ය මණ්ඩලය සඳහා බඳවා ගැනීම් සිදුකර ඇත. ලිපිකරු හා සමාන්තර ශ්‍රේණි කාර්ය මණ්ඩල තනතුරක් වන කාර්මික නිලධාරී තනතුර සඳහා බඳවා ගැනීම් සිදු කිරීම වෛද්‍ය පීඨ අවශ්‍යතාවය පදනම් කරගෙන සිදු කරනු ලබයි. මේ වනවිට එම තනතුරු පුරප්පාඩු සියල්ල එකවර පිරවීමේ අවශ්‍යතාවයක් නොමැති හෙයින් එම තනතුරු පුරප්පාඩු ප්‍රමාණය පිරවීමට දැනට කටයුතු කර නොමැත.

07. රජයේ ප්‍රතිපත්ති අනුව මෙම විශ්වවිද්‍යාලවට අනුබද්ධිත දකුණු ආසියානු වෛද්‍ය හා තාක්ෂණික ආයතනයේ දැනට පුරප්පාඩු 29 ක්ව පවතින සුළු ශ්‍රේණි කාර්ය මණ්ඩලය සඳවා නව බඳවා ගැනීම් සිදු කිරීම තාවකාලිකව නතර කොට ඇත.

විගණන ඡේද : ඊ

කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය වෙත විදේශීය සුදුසුකම් මත සිසුන් බඳවා ගැනීම සඳහා අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා ක්‍රම්වේදයක් කළමනාකරණ මණ්ඩල 569:26 මගින් අනුමැතිය ලබා දී ඇත. **(ඇමුණුම "6")**

2016 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා විදේශීය සුදුසුකම් මත සිසුන් බඳවා ගැනීම සඳහා පැවැති ක්‍රමවේදය විටින් විට වෙනස් වී ඇත. එයට හේතුව වශයෙන් දැක්වීමට හැකි වනුයේ බොහොමයක් සිසුන් නිරන්තරයෙන් විභාග අසමත් වීම හා උපාධි පාඨමාලාව සම්පූර්ණ කර ගැනීමට නොහැකිව අතරමගදී විශ්වවිද්‍යාලය හැර යෑමයි. කරුණු එසේ හෙයින් 2016 වසරේ සිට ඉදිරි වසරවලදි විදේශීය සුදුසුකම් මත සිසුන් ඇතුළත් කර ගැනීමේදී ඉහලම සුදුසුකම් සපුරාලන ලද සිසුන් පමණක් ඇතුළත් කර ගැනීමට සිසුන් බඳවා ගැනීමේ කමිටුව උත්සුක වී ඇත.

සෑම වසරකම විදේශීය සුදුසුකම් මත සිසුන් බඳවා ගැනීමට ප්‍රථම ඒ සම්බන්ධයෙන් ලිපියක් ආරක්ෂක අමාත්‍යාංශය වෙත යොමුකර ඒ මගින් විදේශ සම්බන්ධතා අමාත්‍යාංශය හරහා ආසියානු, යුරෝපා, ඕස්ට්‍රේලියා හා අප්‍රිකානු රටවල ඇති මහාකොමසාරිස් කාර්යාල දැනුවත් කර ඒ මාර්ගයෙන් සිසුන් ඇතුලත් කර ගැනීම සඳහා අයදුම්පත් ගෙන්වා ගනු ලබයි. මෙම ක්‍රමවේදය 2013 වසරේ සිට සෑම වසරකම විදේශීය සුදුසුකම් මත සිසුන් ඇතුළත් කර ගැනීමේදී සිදු කරනු ලබයි. එමඟින් සෑම වසරකම අයදුම්පත් 50ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් මෙම විශ්වවිද්‍යාලය වෙත ලැබෙනු ඇත. එනමුත් 2018 සහ 2019 වසරවලදි ලැබී ඇති අයදුම්පත් බොහොමයක් අධ්‍යාපන සුදුසුකම් පරීක්ෂා කර බැලීමේදී එම සිසුන්හට මෙම විශ්ව විද්‍යාලයේ ඉල්ලුම් කර ඇති උපාධි පාඨමාලා හැදෑරීම සඳහා අවශ්‍ය මූලික සුදුසුකම් සපුරා නොමැති බව නිරීක්ෂණය විය.

තවද 2016 වර්ෂයේ සිට 2019 වර්ෂය වන විට විදේශීය සුදුසුකම් මත බඳවා ගනු ලබන සිසුන්ගේ පාඨමාලා ගාස්තු ක්‍රමයෙන් ඉහල නංවා ඇත.එයට මෙම විශ්වවිද්‍යාලයේ කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය හා උපදෙස් අනුව ශ්‍රී ලංකාව තුල පවත්නා අනෙකුත් රාජ්‍ය විශ්ව විද්‍යාල හා සමගාමීව විදේශීය සුදුසුකම් මත සිසුන් බඳවා ගැනීමේදී පාඨමාලා ගාස්තු සමාන හෝ අනුරූප අගයක් විය යුතු බව නිගමනය විය. කරුණු එසේ හෙයින් වෛද්‍ය උපාධිය සඳහා 2016 වසරේ පැවැති වාර්ෂික පාඨමාලා ගාස්තුව වූ 6000 (USD) 2019 වසර වන විට එය 9000 (USD) දක්වාද 2020 වර්ෂය වන විට එය 12500 (USD) දක්වා වැඩි විය.එම හේතූන් මත රට තුල පවත්නා සෑම රාජ්‍ය විශ්ව විද්‍යාලයකම පාඨමාලා ගාස්තු එක හා සමාන බැවින් විදේශීය සිසුන් මෙම විශ්වවිද්‍යාලයට පමණක් නොව අනෙකුත් රාජ්‍ය විශ්ව විද්‍යාල වෙතද එක හා සමානව අයදුම්පත් යොමු කරයි.

කරුණු එසේ හෙයින් ඉහත කරුණු පිලිබඳ විශේෂ අවධානය යොමු කර 2020 වර්ෂය සඳහා විදේශීය සුදුසුකම් මත සිසුන් ඇතුලත් කර ගැනීමේදී උපාධි පාඨමාලාවන් හැදෑරීම සඳහා අවශ්‍යවන මූලික අධ්‍යාපන සුදුසුකම්වල යම් ලිහිල් වීමකට භාජනය කර ඇති බැවින් එමගින් ඉදිරි වර්ෂ සඳහා විදේශීය සුදුසුකම් මත සිසුන් බඳවා ගැනීමේ ප්‍රගතියක් අපේක්ෂා කල හැකිය. තවද වර්තමානයේ මහජනයා අතර ප්‍රචලිතව පවතින සමාජ මාධ්‍ය හරහාද මෙම විශ්වවිද්‍යාලය වෙත විදේශීය සුදුසුකම මත සිසුන් ඇතුලත් කර ගැනීම සම්බන්ධයෙන් ප්‍රචාරණය සඳහා අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී.

විගණන ඡේද : උ

දක්ෂිණ මණ්ඩපයේ කාර්ය මණ්ඩලයට වැටුප් ගෙවීමෙන් ද විශ්ව විද්‍යාලයට ලැබෙන භාණ්ඩාගාර ප්‍රතිපාදන මගින් සිදු කරනු ලබන බැවින් විශ්වවිද්‍යාලය යටතේ ගිණුම් ගත කර ඇත. ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.

විගණන ඡේද : ඌ

විශ්වවිද්‍යාලයිය දක්ෂිණ මණ්ඩපයේ පරිහරණ භූමි ප්‍රමාණය හෙක්ටෙයාර් 70.0863 (අ .173 රූ. 0 පර්. 18.09) පමණ වේ. 2017 වසරේ දී මිනින්දෝරු දෙපාර්තමේන්තුව සිදු කරන ලද මැනුම් අනුව පරිහරණ ඉඩම් ප්‍රමාණයෙන් හෙක්ටෙයාර 8.3500 (අ.2 රූ.2 පර්.25.6) ක ප්‍රමාණයක් ශ්‍රීලංකා ආයෝජන මණ්ඩලය වෙත වෙන්කල ඉඩම බවද ඉතිරි කොටස වන හෙක්ටෙයාර් 61.7363 (අ. 152 රූ.1 පර් 38.18) පමණ ඉඩම වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයිති වී තිබුණි.

එසේ වෙතත් වන සංරක්ෂණ ජනරාල්තුමන්ගේ අංක EMDL/03/02/14/464 2013 හා 2017.12.14 දිනැති ලිපිය අනුව නිදහස් කිරීමට අනුමත කලයුතු ඉඩම් ප්‍රමාණය ලෙස පරිහරණය කමිටුව අන්තර් අමාත්‍යාංශ කමිටුව හා වන සංරක්ෂක ජෙනරාල් විසින් අනුමත කර ඇත්තේ හෙක්ටෙයාර් 56.6 (අ 139. රූ 03. පර් 18. 32) කි ඒ අනුව හෙක්ටෙයාර් .56.6 (අ 139. රූ 03. පර් 18. 32) ක කොටසW.L.S.P 42 දරණ පිඹුරේ

අංක 1830 බිම කැබැල්ල 2020.03.06 දින මෙම විශ්වවිද්‍යාලය වෙත පවරණ ලදී.රජයේ දෙපාර්තමේන්තුවලට ඉඩම් ලබාදීම පිළිබඳ සහතිකය (ඇමුණුම 7) ලෙස දක්වා ඇත. ඉතිරි හෙක්ටයාර් 5. 1363 (අ .12. රූ .02. පර් 30.8) ක භූමි ප්‍රමාණය මෙම විශ්වවිද්‍යාලයේ සංවර්ධන කටයුතු සඳහා අත්‍යාවශ්‍යම කොටසක් වන බැවින් මෙම ඉඩම් කොටස දිසාපති වෙතින් පවරා (මොණරාගල) ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කෙරෙමින් පවතී. ඊට අදාල ලිපිය (ඇමුණුම 8) ලෙස දක්වා ඇත .

තව හෙක්ටෙයාර 8. 3500 (අ .2. රූ 2. පර් 25. 6) ක ඉඩම් ප්‍රමාණය ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය වෙත වෙන්කල ඉඩම ප්‍රමාණයක් වන අතර එම ඉඩම කොටස මෙම විශ්ව විද්‍යාලයට පවරා ගැනීමට අවශ්‍ය කටයුතු මේ වන විට සිදු කරමින් පවතී. ඊට අදාල ලිපිය (ඇමුණුම 9) ලෙස දක්වා ඇත.

කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල රෝහලට අයත් අංක CO/KSB/2018/489 දරණ පැහැදිලි කිරීමේ අනුරේඛනයේ කැබලි අංක 5 හා 6 න් දැක්වෙන හෙක්ටෙයාර් 19.6681ක් ඉඩම් කොටස ආරක්ෂක අමාත්‍යාංශය අත්කර ගැනීම සඳහා වූ නව අත්පත් යෝජනා 2019.12.05 දින ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත.තවද මෙම ඉඩම සෘජුවම ආරක්ෂක අමාත්‍යාංශය වෙත අත් කර ගැනීම සුදුසු බව නිරීක්ෂණය කර ඇත. ඊට අදාල MOD/PAC/05/CAB – OB දරණ ආරක්ෂක අමාත්‍යාංශ ලිපිය **(ඇමුණුම 10)** ලෙස දක්වා ඇත.

තවද කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල රෝහල පිහිටි ඉඩම පවරා ගැනීමට අදාලව ඉදිරි කටයුතු සැලසුම් කිරීම සඳහා ආරක්ෂක අමාත්‍යාංශය අතිරේක ලේකම් ආර්එම්පිඑස් රත්නායක මහතාගේ ප්‍රධානත්වයෙන් යුතුව යුධ හමුදා වෛද්‍ය බලකා නිලධාරින් සහ කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ නිලධාරින් විශේෂ ක්ෂේත්‍ර පරීක්ෂණයක් 2020.08.14 වන දින පවත්වන ලදී. එහිදී මෙම මුළු ඉඩම සෘජුවම ආරක්ෂක අමාත්‍යාංශය වෙත පවරා ගැනීමට කටයුතු කරන බවත් ඉන් පසු ශ්‍රී ලංකා යුධ හමුදා වෛද්‍ය බලකාය සහ කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල රෝහල අතර, මෙම ඉඩම බෙදා ගැනීම පිළිබඳ ඉදිරි කටයුතු සාකච්ඡා කර ඇත.

<u>විගණන ඡේද : (එ) i</u>

අධ්‍යයන කාර්ය මණ්ඩල : පරිසණක දෙපාර්තමේන්තුව, වාස්තු විද්‍යා දෙපාර්තමේන්තුව ප්‍රමාණ සමීක්ෂණ අධ්‍යයන අංශය සඳහා 2020 වර්ෂයට වෙන් වෙන්ව පහත සඳහන් පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීම සඳහා දැන්වීම් පළකර ඇත.

මහාචාර්ය, සහකාර මහාචාර්ය i ශ්‍රේණිය, ii ශ්‍රේණිය
කථිකාචාර්ය (පරිවාස), කථිකාචාර්ය (ස්ථිර නොවන), උපදේශක ii ශ්‍රේණිය

මැනුම් විද්‍යා දෙපාර්තමේන්තුව සඳහා 2020 වර්ෂයට වෙන් වෙන් පහත සඳහන් පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීම සඳහා දැන්වීම් පල කර ඇත.

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය i ශ්‍රේණිය, ii ශ්‍රේණිය, උපදේශක ii ශ්‍රේණිය

<u>විගණන ඡේද : (එ) ii</u>

අනධ්‍යන කාර්ය මණ්ඩලය : දැනට අනුමත වී ඇති අනධ්‍යන කාර්ය මණ්ඩලය නාමයන් 13ක් සඳහා බඳවා ගැනීම් සිදු කොට ඇති අතර, එහි සම්පූර්ණ අනධ්‍යන සේවකයින් ප්‍රමාණය 100 කි. ඉදිරියේදී අවශ්‍යතාවය මත අනධ්‍යන තනතුරු නාම වලට අනුමත සම්පූර්ණ සේවක සංඛ්‍යාව බඳවා ගැනීමට කටයුතු සිදු කරනු ඇත.තවද පහත දැක්වෙන තනතුරු නාම යටතේ 2020 වර්ෂය සඳහා අලුතින් බඳවා ගැනීම් සිදු කිරීමට දැනටමත් අයදුම්පත් කැඳවා ඇත.

(අ) කළමනාකරණ සහකාර (III ශ්‍රේණිය)
කළමනාකරණ සහකාර (ලිපිකරු සේවා) III ශ්‍රේණිය
කළමනාකරණ සහකාර (පුස්තකාල තොරතුරු සහකාර) III ශ්‍රේණිය

(ආ) තාක්ෂණ නිලධාරි III ශ්‍රේණිය
තාක්ෂණ නිලධාරි (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ) III ශ්‍රේණිය
තාක්ෂණ නිලධාරි (සිවිල්) III ශ්‍රේණිය

(ඇ) පරිපාලන (නඩත්තු) III ශ්‍රේණි

විගණන ඡේද : (ඒ) iii

පුස්තකාල සේවා සැපයිම, පුස්තකාල ගොඩනැගිලි ඉදිකිරීම් පරීක්ෂාව : 2022 වර්ෂයේදී සියළු පහසුකම් සහිත ස්ථිර පුස්තකාල ගොඩනැගිල්ලක් මණ්ඩපය තුල ඉදි කිරීමට සැලසුම්කර ඇත.තවද පවතින පුස්තකාල ගොඩනැගිල්ල තුල සිසුන් හට අන්තර්ජාල මගින් අධ්‍යයන කටයුතු සඳහා යොමු වීමට අවැසි පහසුකම් ඇති කිරීමට සැලසුම් කර ප්‍රසම්පාදන කටයුතු සිදු කර ඇත.

විගණන ඡේද : (ඒ) iv

නේවාසිකාගාර පහසුකම් : දක්ෂිණ මණ්ඩපයේ ශිෂ්‍ය නේවාසික පහසුකම් සඳහා ඇඳන් 600කින් සමන්විත නේවාසිකාගාර පහසුකම් පවතී. 2019 වසරේ මුල් මාස 06 ක කාලයක් තුල සිසුන් 512 ක් පමණ අධ්‍යාපනය ලැබූ අතර. 2019 ජූලි මස තොරතුරු තාක්ෂණ හා තොරතුරු පද්ධති උපාධි පාඨමාලා හදාරන උපාධි අපේක්ෂක සිසු සිසුවියන් කොආවි රත්මලාන වෙත අනුයුක්ත කිරීම හේතුවෙන් 2019 වසරේ දෙසැම්බර් මස 31 දිනට දක්ෂිණ මණ්ඩපයේ අධ්‍යාපනය හදාරනු ලබන සිසු සිසුවියන් 412 ක් දක්වා පහත වැටී ඇත. 2020 වසර තුල නේවාසිකගාර පහසුකම් දියුණුකර ඇති අතර නවක සිසු සිසුවියන් බඳවා ගැනීමට ද කටයුතු සිදු කර ඇත.

විගණන ඡේද : (ඒ) v

දක්ෂිණ මණ්ඩපය පිහිටි ඉඩම පවරා ගැනීම: මෙම විශ්වවිද්‍යාල ස්ථාපිත කර ඇති භූමි ප්‍රමාණය අතුරින් හෙක්ටෙයාර් 56.6 ක් පවරා ගෙන අවසන්ව ඇත. එමෙන්ම මෙම විශ්වවිද්‍යාල ශිෂ්‍ය නේවාසිකාගාර ඉදිකර ඇති ප්‍රදේශයේ හෙක්ටයාර් 7. 6836 ක භූමි ප්‍රමාණය ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට අයත් බව පසුව අනාවනය කර ගැනීමෙන් පසු ආරක්ෂක අමාත්‍යාංශය මැදිහත්වීම යටතේ නැවත විශ්වවිද්‍යාලය වෙත පවරා ගැනීමට අවැසි කටයුතු සිදු කර ඇත.
ක්‍රීඩා පිටිය සඳහා යෝජිත ප්‍රදේශය ලෙස මුලික සැලැස්මේ සඳහන් මේ වන විට විශ්වවිද්‍යාලය වෙත පවරාගෙන නොමැත. හෙක්ටයාර 5. 1363 ක භූමි ප්‍රමාණය ද ආරක්ෂක අමාත්‍යාංශය මැදිහත්වීම යටතේ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව මගින් අනුමැතිය ලබාගැනීමට කටයුතු කර ඇත. අදාල ලිපිය මෙයට (ඇමුණුම් 11) වශයෙන් ඇත.

විගණන ඡේද: ඒ (i)

ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල රෝහලේ වෛද්‍ය කාර්ය මණ්ඩලය සඳහා වූ තනතුරු නාම 60 ක් වෙනුවෙන් සිටිය යුතු අනුමත කාර්ය මණ්ඩලය 1375 ක් විය යුතු වුවත් ඉන් තනතුරු නාම 19 ක් සඳහා බඳවා ගෙන සිටි කාර්ය මණ්ඩලය 427 ක් පමණක් වූ අතර ඉතිරි තනතුරු නාම 41 සඳහා කිසිවෙකුත් බඳවා නොගැනීම සහ පරිපාලන කාර්ය මණ්ඩලය සඳහා වූ තනතුරු නාම 70 ක් වෙනුවෙන් සිටිය යුතු අනුමත කාර්ය මණ්ඩලය 501 ක් වුවත් 2019 දෙසැම්බර් 31 වන දිනට ඉන් තනතුරු නාම 06 ක් සඳහා බඳවා ගෙන සිටි කාර්ය මණ්ඩලය 32 ක් පමණක් වූ අතර ඉතිරි තනතුරු නාම සඳහා කිසිවෙකුත් බඳවා නොගැනීම යන විගණන නික්ෂණයන්ට හේතු පහත පරිදි වේ.

(අ) විශ්වවිද්‍යාල රෝහල සඳහා නවතමයෙන් කාර්ය මණ්ඩලය බඳවාගෙන රෝහල් පරිපාලන කටයුතු පවත්වාගෙන යාමට එම තනතුරු සඳහා අදාල වන බඳවා ගැනීමේ පරිපාටි අනුමත විය යුතු බැවින් රෝහලේ අනුමත වෛද්‍ය සහ පරිපාලන කාර්ය මණ්ඩල තනතුරු සඳහා අදාල බඳවා ගැනීමේ පරිපාටි සකස්කර ආරක්ෂක අමාත්‍යාංශය මගින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට කටයුතු සිදු කරන ලදී.

ඒ අනුව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් විශ්වවිද්‍යාල රෝහලේ විශේෂ වෛද්‍ය නිලධාරී, වෛද්‍ය නිලධාරී, දන්ත වෛද්‍ය නිලධාරී සහ ප්‍රාථමික ශිල්පිය නොවන සේවා ගණයේ තනතුරු සඳහා වන බඳවා ගැනීමේ පරිපාටි 2019.12.16 වන දින අනුමත කරන ලද අතර හෙද සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ පිපාටිය 2019.12.31 වන දින අනුමත කරන ලදි. මෙම අනුමත බඳවා ගැනීමේ පරිපාටිත්හි ඇතුළත් තනතුරු වලට අදාල කාර්යය මණ්ඩලය ස්ථිර ලෙස බඳවා ගැනීමට 2020 ජනවාරි මස පුවත්පත් දැන්වීම් පළ කරන ලද අතර 2020 මාර්තු මස සම්මුඛ පරීක්ෂණ පවත්වා කාර්යය මණ්ඩලය බඳවා ගත්තා ලදි.

ඒ අනුව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත අනුමැතිය සඳහා ඉදිපත් කර ඇති බඳවා ගැනීමේ පරිපාටිත් අනුමත වීමෙන් අනතුරුව අදාල වෛද්‍ය සහ පරිපාලන කාර්යය මණ්ඩලය බඳවා ගැනීමට කටයුතු සිදු කරන බැව් වැඩිනිරටත් පෙන්වා දෙනු ලැබේ.

විගණන ඡේදය (ඒ) iii

විශ්වවිද්‍යාල රෝහල තවතමයෙන් ආරම්භකර රෝගී ප්‍රතිකාර කටයුතු ආරම්භ කිරීමෙන් පසු කෝ [illegible]ත් පදනම මත කාර්යය මණ්ඩලය බඳවා ගෙන රෝහලෙහි ඉදිරි කටයුතු පවත්වාගෙන යාමට කටයුතු කරන ලදි මෙහිදී ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයට අයත් සම සෞඛ්‍ය විද්‍යා අධ්‍යයන පීඨයේ ගිවිසුම්ගත. විශ්වවිද්‍යාල රෝහලෙහි සේවයේ යෙදී සිටි අයවලුන්ගෙන් 27 දෙනෙකු ඇප බැඳුම්කරය ගෙවා නිමකර සේවයෙන් ඉවත්ව ගොස් ඇති අතර 30 දෙනෙකු සේවය අතහැර ගොස් ඇත. එලෙස ගිවිසුම කඩකර සේවයට වාර්තා නොකරන ලද අයවලුන් වෙත සේවය අතහැර යාමේ ලිපි නිකුත්කර ඒ පිළිබඳව ඉදිරි නීතීමය ක්‍රියාමාර්ග ගැනීම සඳහා නීති අංශය වෙත යොමු කර ඇත. එසේම 66 දෙනෙකු නුදෙක්ම ස්වකීය පෞද්ගලික හේතූන් මත තම කැමැත්තෙන් සේවයෙන් ඉල්ලා අස්වී ඇත.

විගණන ඡේදය (ඒ) iv

විශ්වවිද්‍යාල රෝහලේ අනුමත වෛද්‍ය සහ පරිපාලන කාර්යය මණ්ඩල තනතුරු 38 ක් සඳහා අදාල බඳවා ගැනීමේ පරිපාටි සකස් කර ආරක්ෂක අමාත්‍යාංශය මගින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිපත් කර ඇත. මේ වන විට එම බඳවා ගැනීමේ පරිපාටි අතුරින් බඳවා ගැනීමේ පරිපාටි 08 ක් අනුමත වී ඇත. එසේ තනතුරු 08 ක බඳවා ගැනීමේ පරිපාටි කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව හාරයේ පරීක්ෂා කිරීමේ මට්ටමේ පවතින බැවි දන්වා සිටිමි. තවද පරිපාලන කාර්යය මණ්ඩල තනතුරු 02 ක් සඳහා අදාල බඳවා ගැනීමේ පරිපාටි සකස් කර ආරක්ෂක අමාත්‍යාංශය වෙත යොමු කරන ලද අතර තවත් තනතුරු 10 ක් සඳහා වන අදාල බඳවා ගැනීමේ පරි පාටි සකස් කර ආරක්ෂක අමාත්‍යාංශය වෙත යොමු කිරීමට නියමිතව ඇත.

එම්පී පීරිස් ආර්ඩබ්පි ආර්එස්පි වීඑස්වී යූඑස්පි
මේජර් ජෙනරාල්
උපකුලපති

පිටපත :
ලේකම් - ආරක්ෂක අමාත්‍යාංශය

ඇමුණුම "අ"

(ii).

- නියෝජ්‍ය උපකුලපති (අධ්‍යයන) - 21.12.2015 සහ 04.03.2018 යන දිනයන්හි පුවත්පත් දැන්වීම් පළ කර ඇති අතර, එහිදී ලද ඉතාම සීමිත අයදුම්පත් ප්‍රමාණය සම්මුඛ පරීක්ෂණයකට කැඳවීමට තරම් ප්‍රමාණවත් නොවිණි. නැවත පුවත්පත් දැන්වීමක් පල කිරීම සඳහා කටයුතු සිදු කරමින් පවතී.

- පුස්ථකාලයාධිපති - 31.01.2016 දින පුවත්පත් දැන්වීමෙන් පසු ඉතාම දිගු බඳවා ගැනීමේ ක්‍රියාවලියකින් අනතුරුව එවකට විදෙස්ගතව සිටි ආචාර්ය සී.සී. ජයසුන්දර මහතා පුස්ථකාලයාධිපති තනතුරට තෝරා ගත් අතර 02.01.2018 දින එම තනතුරෙහි වැඩ භාර ගන්නා ලදී.

~~එම මහතාගේ පෞද්ගලික ඉල්ලීමක් පරිදි 20.11.2019 දින සිට සේවයෙන් ඉල්ලා අස් වී ඇති අතර, පුරප්පාඩු වූ තනතුර සඳහා නැවත 07.04.2019 දින පුවත්පත් දැන්වීමක් පලකර ඇත. ඇඟයීමේ කටයුතු සඳහා (Librarian evaluation – UGC Circular No. 921) අයදුම්පත් 02ක් කෙටි ලැයිස්තු ගත කර ඇත. ඒ අනුව, සැලකිය යුතු කාලයක් ගතවන්න එම ඇඟයීමේ ක්‍රියාවලිය ආරම්භ කර ඇති අතර, සුදුසු අයදුම්කරුවකු බඳවා ගන්නා තුරු, වැඩ ආවරණය කිරීම සඳහා දැනට ජ්‍යෙෂ්ඨ සහකාර පුස්ථකාලයාධිපති පත්කර ඇත.~~

- ලේඛකාධිකාරී - ~~27.04.2016~~ වන දින ~~පුරප්පාඩු වූ~~ තනතුර සඳහා ~~18.04.2016~~ දින පුවත්පත් දැන්වීමක් පල කර තිබූ අතර, සුදුසුකම් සහිත ප්‍රමාණවත් අයදුම්පත් සංඛ්‍යාවක් නොලැබීම මත ~~සම්මුඛ පරීක්ෂණය පවත්වා නොමැත.~~

04.03.2018 යන දිනද නැවත පුවත්පත් දැන්වීමක් පලකල අතර, කෙටි ලැයිස්තු ගත කල පසු සම්මුඛ පරීක්ෂණයක් පැවත්වීමට තරම් අයදුම්පත් සංඛ්‍යාවක් නොමැති වීම මත සම්මුඛ පරීක්ෂණයක් පවත්වා නොමැත.

නැවත පුවත්පත් දැන්වීමක් පල කිරීම සඳහා කටයුතු සිදු කරමින් පවතී.

- මූල්‍යාධිකාරී - 04.03.2018 යන දින පුවත්පත් දැන්වීමක් පල කර ඇති අතර, ඊට අදාල්වූ පැවැත්වූ සම්මුඛ පරීක්ෂණයේදී කිසිදු අයදුම්කරුවෙකු එහිදී මණ්ඩල නිර්දේශයෙන් 50%ක් (50% of Board Assessment) වත් ලබා නොගැනීම මත තේරී පත් නොවීය.

නැවත පුවත්පත් දැන්වීමක් පල කිරීම සඳහා කටයුතු සිදු කරමින් පවතී.

කාර්ය මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය තනතුරු වලට බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවා ඇති අතර, කෙටි ලැයිස්තු ගත කිරීම් හා සම්මුඛ පරීක්ෂණ කටයුතු මේ වන විට සිදු කෙරෙමින් පවතී.

4. සහකාර පුස්ථකාලයාධිපති තනතුරු 03න් එකක් ජ්‍යෙෂ්ඨ සහකාර පුස්ථකාලයාධිපති තනතුරක් ලෙස උසස්කර (upgrade) කර ඇත්තේ එම පුද්ගලයාට පමණක් සුවිශේෂී වන (personal to the holder basis) ආකාරයටය.

<u>අධ්‍යයන සහකාර කාර්ය මණ්ඩලය</u>

1. අධ්‍යයන සහකාර කාර්ය මණ්ඩලයේ තනතුරු වලින් තාවකාලික ප්‍රදර්ශක (Temporary Demonstrator) තනතුර මූලිකවම එක් අවුරුදු කොන්ත්‍රාත් කාලයකට යටත්ව ලබා දෙන්නකි. 2019 වසරේ ආරම්භයේ එම තනතුරට අළුතින් බඳවා ගැනීම් සිදු කල අතර, මේ වන විට එම තනතුරේ ඇත්තේ පුරප්පාඩු 10 ක් පමණි.
2. නැවත වරක් තාවකාලික ප්‍රදර්ශක (Temporary Demonstrator) තනතුර සඳහා බඳවා ගැනීම වෙනුවෙන් 2019.07.25 වන දින පුවත්පත් දැන්වීමක් පළ කර ඇත.
3. අනෙකුත් අධ්‍යයන සහකාර පුරප්පාඩු වී ඇති තනතුරු සඳහා 2019.04.07 වන දින පුවත්පත් දැන්වීම මඟින් බඳවා ගැනීමට අයදුම්පත් කැඳවා ඇත.

<u>පරිපාලන කාර්ය මණ්ඩලය</u>

1. ලේඛකාධිකාරී සහ මූල්‍යාධිකාරී තනතුරු සඳහා බඳවා ගැනීමට අවශ්‍ය කටයුතු මේ වන විට සිදු කෙරෙමින් පවතී.
2. ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී තනතුරක් නියෝජ්‍ය ලේඛකාධිකාරී තනතුරකටද, සහකාර ලේඛකාධිකාරී තනතුරු 02ක් ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී තනතුරු 02 කටද උසස් කර (upgrade) ඇත්තේ එම පුද්ගලයන්ට පමණක් සුවිශේෂී වන (Personal to the holder basis) ආකාරයටය.

තනතුරු නාමය	අනුමත සංඛ්‍යාව	තත්‍ය සංඛ්‍යාව	පුරප්පාඩු
නියෝජ්‍ය ලේඛකාධිකාරී	01	02	(-01)
ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී	02	03	(-01)
සහකාර ලේඛකාධිකාරී	08	06	02
එකතුව	**11**	**11**	**00**

3. කෙසේ වෙතත් මේ වන විට නියෝජ්‍ය ලේඛකාධිකාරී තනතුරෙහි සේවය කල අයෙක් සේවයෙන් ඉල්ලා අස්වීම මත එම තනතුරු පුරප්පාඩු වල වර්තමාන තත්ත්වය පහත පරිදි වේ.

තනතුරු නාමය	අනුමත සංඛ්‍යාව	තත්‍ය සංඛ්‍යාව	පුරප්පාඩු
නියෝජ්‍ය ලේඛකාධිකාරී	01	01	00
ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී	02	03	(-01)
සහකාර ලේඛකාධිකාරී	08	06	02
එකතුව	**11**	**10**	**01**

4. සහකාර මූල්‍යාධිකාරී තනතුරු 02ක් ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී තනතුරු 02ක් සඳහා උසස්කර (upgrade) ඇත්තේ එම පුද්ගලයන්ට පමණක් සුවිශේෂී වන (Personal to the holder basis) ආකාරයටය.

ඇමුණුම "ආ"

01. ජෙනරාල් ශ්‍රීමත් ජොන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ සහ ඊට අනුබද්ධිත ඒකකයන්හි ලබා ගත් කාර්ය මණ්ඩල අනුමැතියන් 2018.12.31 දිනට පහත පරිදිය.

	අනුමත කාර්ය මණ්ඩලය	තත්‍ය කාර්ය මණ්ඩලය	පුරප්පාඩු	අතිරික්ත
කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය	903	743	169	09
දක්ෂිණ මණ්ඩපය, කොඅාවි	527	118	409	--
SAITM, කොඅාවි	149	07	142	--
විශ්වවිද්‍යාලීය මුද්‍රණාලය, කොඅාවි	30	09	21	--
කර්මාන්ත පුහුණු ඒකකය, ඉංජිනේරු පීඨය, කොඅාවි	04	01	03	--
කේඩියු - කෙයා(ර්)	08	02	06	--

02. (අ) කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ 2018 දෙසැම්බර් 31 දිනට කාර්ය මණ්ඩලය පහත පරිදිය.

කාර්ය මණ්ඩලය	තනතුරු නාම සංඛ්‍යාව	අනුමත කාර්ය මණ්ඩලය	තත්‍ය කාර්ය මණ්ඩලය	පුරප්පාඩු	අතිරික්ත
අධ්‍යයන කාර්ය මණ්ඩලය	11	231	193	38	--
අධ්‍යයන සහකාර කාර්ය මණ්ඩලය	07	92	39	53	--
පරිපාලන කාර්ය මණ්ඩලය	15	23	19	04	--
ලිපිකරු හා සමාන්තර ශ්‍රේණි කාර්ය මණ්ඩලය	12	185	160	30	05
සුළු සේවක කාර්ය මණ්ඩලය	26	372	332	44	04
එකතුව		903	743	169	09

අධ්‍යයන කාර්ය මණ්ඩලය

1. අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පුරප්පාඩුව පවතින තනතුරු සංඛ්‍යාව වන 38 න් 24 ක්ම මහාචාර්ය තනතුරු වන අතර, එම තනතුරට බඳවා ගැනීමට අවුරුදු පතා පුවත්පත් දැන්වීම් පළ කලද සුදුසුකම් සහිත අයදුම්පත් ලැබීමේ හිඟ කමක් පැවතුණි. 2019.03.10 සහ 2019.04.07 දිනයන්හි පළකල පුවත්පත් දැන්වීම් වලට අනුව මේ වනවිට මහාචාර්ය තනතුර සඳහා සලකා බැලීමට (Professor evaluation – UGC Circular No. 916 & 04/2010) කෙටි ලැයිස්තු කල (shortlisted) අයදුම්පත් සංඛ්‍යාව 06 කි.
2. පුස්ථකාලයාධිපති තනතුරටද බඳවා ගැනීම සඳහා 2019.04.07 දින පුවත්පතෙහි අයදුම්පත් කැඳවා ඇති අතර, ඇගයීමේ කටයුතු සඳහා (Librarian evaluation – UGC Circular No. 921) අයදුම්පත් 03ක් කෙටි ලැයිස්තු ගත කර ඇත.
3. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් 2015 වසරේදී මෙම විශ්වවිද්‍යාලයට පැමිණ සිදු කරන ලද පීඨයන්හි කාර්ය මණ්ඩල සමාලෝචන වැඩ සටහනේදී, අධ්‍යයන කාර්ය මණ්ඩලයේ කථිකාචාර්ය (පරිවාස), කථිකාචාර්ය, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I සහ II ශ්‍රේණි තනතුරු ආයතනයේ අවශ්‍යතාවය පරිදි බඳවා ගැනීමට, උසස් කිරීමට හැකි වන සේ එකක් ලෙස සැළකීමට උපදෙස් දෙන ලදී. ඒ අනුව, 2019.03.10 සහ 2019.04.07 යන දිනයන්හි පළකල පුවත්පත් දැන්වීම් මඟින් අධ්‍යයන

තනතුරු නාමය	අනුමත සංඛ්‍යාව	තත්‍ය සංඛ්‍යාව	පුරප්පාඩු
ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී	--	02	(-02)
සහකාර මූල්‍යාධිකාරී	03	01	02
එකතුව	03	03	00

5. ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණක තනතුර නියෝජ්‍ය අභ්‍යන්තර විගණක තනතුරක් ලෙස උසස්කර (upgrade) ඇත්තේ එම පුද්ගලයන්ට පමණක් සුවිශේෂී වන (Personal to the holder basis) ආකාරයටය.

තනතුරු නාමය	අනුමත සංඛ්‍යාව	තත්‍ය සංඛ්‍යාව	පුරප්පාඩු
නියෝජ්‍ය අභ්‍යන්තර විගණක	--	01	(-01)
ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණක	01	--	01
එකතුව	01	01	00

<u>ලිපිකරු හා සමාන්තර ශ්‍රේණි කාර්ය මණ්ඩලය</u>

1. කළමනාකරණ මණ්ඩල 560:15 අනුව කාර්මික නිලධාරී තනතුරු 04 ක් යටපත් කර කළමනාකරණ සහකාර තනතුරු 04 ක් බඳවා ගැනීමට අනුමැතිය ලබා දී ඇත. ඊට අමතරව 2019 වර්ෂයේ කළමනාකරණ සහකාර තනතුරේ සේවයෙන් විශ්‍රාම යෑම 05 ක්ද සිදුවීමට නියමිතය. ඒ අනුව, මේ වන විට කළමනාකරණ සහකාර තනතුරේ අතිරික්තයක් නොමැත.
2. ඉහත කළමනාකරණ මණ්ඩල තීරණය අනුව, කාර්මික නිලධාරී තනතුරු පුරප්පාඩු වලින් බඳවා ගත හැකි සංඛ්‍යාව 04 ක් අඩුවෙන් පෙන්වා ඇත.

<u>සුළු ශ්‍රේණි කාර්ය මණ්ඩලය</u>

1. කළමනාකරණ මණ්ඩල 555:62 අනුව කටර් (Cutter) තනතුරු 02 ක් යටපත් කර සනීපාරක්ෂක කම්කරු තනතුරු 02 ක් බඳවා ගැනීම සඳහා අනුමැතිය ලබා දී ඇත. ඊට අමතරව, 2019 වර්ෂයේ සනීපාරක්ෂක කම්කරු තනතුරේ සේවයෙන් විශ්‍රාම යෑම 02ක්ද සිදුවීමට නියමිතය.
2. ඉහත කළමනාකරණ මණ්ඩල තීරණය අනුව, කටර් (Cutter) තනතුරු පුරප්පාඩු නොමැති හෙයින් එය පුරප්පාඩු මුළු එකතුවෙන් අඩුකර පෙන්නා ඇත.

(ඇ) කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයට අනුබද්ධික දකුණු ආසියානු වෛද්‍ය හා තාක්ෂණික ආයතනයේ 2018 දෙසැම්බර් 31 දිනට කාර්ය මණ්ඩලය පහත පරිදිය.

කාර්ය මණ්ඩලය	තනතුරු නාම සංඛ්‍යාව	අනුමත කාර්ය මණ්ඩලය	තත්‍ය කාර්ය මණ්ඩලය	පුරප්පාඩු
අධ්‍යයන කාර්ය මණ්ඩලය	12	63	07	56
අධ්‍යයන සහකාර කාර්ය මණ්ඩලය	01	24	00	21
පරිපාලන කාර්ය මණ්ඩලය	02	02	00	02
ලිපිකරු හා සමාන්තර ශ්‍රේණි කාර්ය මණ්ඩලය	02	31	00	31
සුළු සේවක කාර්ය මණ්ඩලය	03	29	00	29
එකතුව		149	07	142

1. 2019.02.24 වන දින පලකරන ලද පුවත්පත් දැන්වීමට අනුව අයදුම්කල සුදුසුකම් සහිත අයවළුන් සම්මුඛ පරීක්ෂණයට කැඳවීමෙන් අනතුරුව ඉන් තෝරා ගත් 16 දෙනෙකු සඳහා 604:10, 605:15 සහ 606:08 යන කළමනාකරණ මණ්ඩල තීරණයන් මඟින් අධ්‍යයන කාර්ය මණ්ඩලය ලෙස බඳවා ගැනීමට අනුමැතිය ලබා දී ඇත.

2. මේ වනවිට ඉහත තේරී පත් වූ අධ්‍යයන කාර්ය මණ්ඩලයෙන් 01 අයෙකුද, අධ්‍යයන සහකාර කාර්ය මණ්ඩලය ලෙස 03 ක්ද දැනට රාජකාරීන් සඳහා වාර්තා කර ඇත. ඊට අමතරව 10 ක ප්‍රමාණයක් කැබිනට් මණ්ඩල අනුමැතිය යටතේද ඉතිරි අයවළුන් සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් මුදා හැරීම යටතේද සේවා කිරීම සඳහා තේරී පත්වී ඇත.
3. පරිපාලන කාර්ය මණ්ඩලය සඳහා බඳවා ගැනීමේ සම්මුඛ පරීක්ෂණ පවත්වන ලද අකර, 606:06 කළමනාකරණ මණ්ඩල තීරණය මඟින් අනුමැතිය ලබා දී ඇත.
4. ලිපිකරු හා සමාන්තර ශ්‍රේණි කාර්ය මණ්ඩලය බඳවා ගැනීමේ සම්මුඛ පරීක්ෂණ කටයුතු මේ වන විට සිදු කෙරෙමින් පවතී.
5. සුළු ශ්‍රේණි කාර්ය මණ්ඩල තනතුරු සඳහාද බඳවා ගැනීමේ සම්මුඛ පරීක්ෂණ කටයුතු මේ වන විට සිදු කෙරෙමින් පවතී.

(ආ) කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයට අනුබද්ධිත මුද්‍රණාලයේ 2018 දෙසැම්බර් 31 දිනට කාර්ය මණ්ඩලය පහත පරිදිය.

කාර්ය මණ්ඩලය	තනතුරු නාම සංඛ්‍යාව	අනුමත කාර්ය මණ්ඩලය	තක්සේරු කාර්ය මණ්ඩලය	පුරප්පාඩු
පරිපාලන කාර්ය මණ්ඩලය	02	02	00	02
ලිපිකරු හා සමාන්තර ශ්‍රේණි කාර්ය මණ්ඩලය	06	11	06	05
සුළු සේවක කාර්ය මණ්ඩලය	08	17	03	14
එකතුව		30	09	21

1. කළමනාකරණ සහකාර තනතුරු 01 ක් යටපත් කර ග්‍රැෆික් නිර්මාණකරු තනතුරක් බඳවා ගෙන ඇත. ඒ අනුව, ලිපිකරු හා සමාන්තර ශ්‍රේණි බඳවා ගත හැකි කාර්ය මණ්ඩල පුරප්පාඩු වලින් 01 ක් අඩුකර ඇත.
2. 572:46 කළමනාකරණ මණ්ඩල තීරණය අනුව යන්ත්‍ර සහයක (Machine Helper) තනතුරු 03 ක් යටපත් කර කම්කරු තනතුරු 03 ක් බඳවා ගෙන ඇත. ඒ අනුව, සුළු ශ්‍රේණි බඳවා ගත හැකි කාර්ය මණ්ඩල පුරප්පාඩු වලින් 03 ක් අඩුකර ඇත.
3. භාෂා පරිවර්තක තනතුර සඳහා බඳවා ගැනීමට කිහිප වරක් පුවත්පත් දැන්වීම් පළ කලද අපෙක්ෂිත සුදුසුකම් සහිත අයදුම්පත් ලැබීමේ නිහතාවයක් පැවතුණි.
4. දැනට විශ්වවිද්‍යාලීය මුද්‍රණාලයේ ස්ථාපිත කොට ඇත්තේ ඩිජිටල් තාක්ෂණයෙන් යුත් මුද්‍රණ යන්ත්‍ර හෙයින්, අනුමත අනෙකුත් සුළු ශ්‍රේණි තනතුරු සඳහා බඳවා ගැනීම් සිදු කිරීම මේ වන තුරුත් අනාවශ්‍ය බව මුද්‍රණාලයේ අංශප්‍රධානී වන අධ්‍යක්ෂක - CITS & DS විසින් තහවුරු කර ඇත.

(ඈ) කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨයට අනුබද්ධිත කාර්මික පුහුණු ඒකකයේ 2018 දෙසැම්බර් 31 දිනට කාර්ය මණ්ඩලය පහත පරිදිය.

කාර්ය මණ්ඩලය	තනතුරු නාම සංඛ්‍යාව	අනුමත කාර්ය මණ්ඩලය	තත්‍ය කාර්ය මණ්ඩලය	පුරප්පාඩු
අධ්‍යයන කාර්ය මණ්ඩලය	02	02	01	01
ලිපිකරු හා සමාන්තර ශ්‍රේණි කාර්ය මණ්ඩලය	01	01	00	01
සුළු සේවක කාර්ය මණ්ඩලය	01	01	00	01
එකතුව		04	01	03

1. පුහුණු ඉංජිනේරු තනතුර සඳහා හමුදාගත නිලධාරියෙකු එම මූලයන්ගෙන් නිදහස් කර එවනු ලබයි.
2. දැනට එහි අනෙකුත් රාජකාරී, අනුමත වූ කාර්ය මණ්ඩලය බඳවා ගැනීමෙන් කොරව ඉංජිනේරු පීඨයේ කාර්ය මණ්ඩලය හරහා සිදු කරගෙන යනු ලබන අතර, එම ඒකකයේ රාජකාරී වඩාත් පුළුල් වන අවස්ථාවේ මෙම අනුමත කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට අපේක්ෂා කරනු ලබයි.

1. විශ්වවිද්‍යාලය

1.1 විශ්වවිද්‍යාලයීය ඉතිහාසය

තරුණ හමුදා නිලධාරීන්ගේ අධ්‍යාපනික ප්‍රමිතීන් ඉහළ නැංවීම පිණිස උසස් අධ්‍යාපන ආයතනයක් ස්ථාපනය කිරීම සඳහා යුධ හමුදා, නාවික හමුදා සහ ගුවන් හමුදා ආඥාපතිවරුන් විසින් 1978 වර්ෂයේදී රජය වෙත නිර්දේශ ඉදිරිපත් කරන ලදී. ඊට ප්‍රතිචාර දක්වමින්, විශේෂඥයින් විසින් අනාවරණය කරගත් කරුණුවල මඟපෙන්වීම අනුව ආරක්ෂක සේවාවන් සඳහා උපාධි ප්‍රදානය කරනු ලබන හමුදා අභ්‍යාස ආයතනයක් පිහිටුවීමට රජය තීරණය කරන ලදී.

යෝජිත ආරක්ෂක අභ්‍යාස ආයතනය සඳහා සුදුසු ස්ථානයක් සම්බන්ධයෙන් අවිනිශ්චිතභාවයක් පැවති තත්ත්වයක් තුළ එවකට සිටි යුධ හමුදා ආඥාපති ලුතිනන් ජෙනරාල් ජේ.ඊ.ඩී.පෙරේරා මහතා විසින් අවශ්‍යතාවය ඒත්තු ගැන්වීමෙන් පසු ශ්‍රී ලංකාවේ තෙවන අග්‍රාමාත්‍යවරයා වූ ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල මැතිතුමා අක්කර 48 කින් සමන්විත කඳවල වත්ත එහි පැවති සියලුම වංචල සහ නිශ්චල දේපළ ඇතුළත්ව හමුදා අභ්‍යාස ආයතනයක් ස්ථාපනය කිරීම සඳහා රජයට පරිත්‍යාග කිරීමට ස්වකීය කැමැත්ත ප්‍රකාශ කරන ලදී. මෙම ප්‍රදානය සතුටින් පිළිගෙන අභ්‍යාස ආයතනය පිහිටුවීම සඳහා මූලික පියවර ගනු ලැබීය. 1980 ඔක්තෝබර් 01 වන දින අතිගරු ජනාධිපති ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා ලුතිනන් ජෙනරාල් ජේඒඩී පෙරේරා මහතා සමඟ ශ්‍රීමත් ජෝන් කොතලාවල මැතිතුමා හමු වී ඔහු වෙත ජෙනරාල් යන ගරු නිලය පිරිනමන ලද අතර පසුකාලීනව රජය සහ ආරක්ෂක සේවාවන් විසින් මෙම අධ්‍යයන ආයතනය ඔහුගේ නමින් නම්කර ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල මැතිතුමාට ගෞරව දක්වන ලදී.

මේ ආකාරයට ශ්‍රී ලංකා යුධ හමුදාව, නාවික හමුදාව සහ ගුවන් හමුදාව සඳහා මනාව සංවර්ධිත බුද්ධිමය හැකියාවෙන් හෙබි නිලධාරීන් බිහි කිරීමේ සුවිශේෂී කාර්යය පෙරදැරිව 1980 වර්ෂයේ දී ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක අභ්‍යාස ආයතනය ආරම්භ කරන ලදී. මෙම ආයතනය 1981 අංක 68 දරන ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක අභ්‍යාස ආයතන පනත යටතේ ස්ථාපනය කරන ලද අතර එම පනතට පසුකාලීනව එක් කරන ලද සංශෝධන කිහිපයක් මඟින් එහි මෙහෙයුම් ක්ෂේත්‍රය වැඩිදියුණු කරන ලදී. 1988 අංක 27 දරන ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක අභ්‍යාස ආයතනය (සංශෝධන) පනත මඟින් අභ්‍යාස ආයතනය විශ්වවිද්‍යාල තත්ත්වයට උසස් කරන ලද අතර 2007 ඔක්තෝබර් මස 11 වන දින එය ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය වශයෙන් නැවත නම් කරන ලදී.

1.2 ආයතනික ව්‍යුහය

